## 2020 පෙබරවාරි මස 11 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රුස්විම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රි ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රි |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රි |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.40 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )**

**01.01** 2020.01.07 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර් තාව සම්මත කිරිම

2020.01.07වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**01.02** 2020.01.14 වන දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම

2020.01.14 වන දින පැවති විශේෂ සභා රැස්වීම් වාර් තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අද දින ප්‍රාදේශිය සභා රැස්වීම පවත්වන නිසා මා ගරු මන්ත්‍රිවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා . මාසික සභා රැස්වීම දහවල් 12.00 වන විට අවසන් කිරිමට සහාය දක්වන ලෙස සියළු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එහෙම කොහොම ද කරන්නේ. මාසයකට පාරයි සභාව තිබෙන්නේ. මාසයකින් තමයි මේ නගරයේ ජනතාවගේ ප්‍රශ්න කතා කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වාඩිවෙන්න.ඔයාට බැරි නම් මා 12.00 වන විට මා පියවර ගන්නම්. මගේ ඉල්ලිමක් තිබෙන්නේ. ඔයා වාඩිවෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා කියන දේ අහන්න. මාගේ ඉල්ලිම මා කළේ. අපිත් සහභාගි වෙන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි සහභාගි වෙන්න. මගේ ඉල්ලිමක් කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

12.00 ට නවත්වන්න අවශ්‍ය නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයාට කියන්න අවශ්‍ය නැහැ. එය මමයි තීන්දු කරන්නේ. මා ඉල්ලීමක් කරනවා ගරු මන්ත්‍රීවරුන්ගෙන් මෙයට සහභාගී වෙන්න අවශ්‍ය නිසා කෙටියෙන් කතා කරන්න කියා. වෙන දෙයක් නෙමේ. ඔයාට වාද කරන්න නෙමේ. මතක තියා ගන්න. ඔයා වාඩිවෙන්න. එක තමයි කිවුවේ.

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 බලපිටිය මූලික රෝහලේ වාහන අංගනය සකස් කිරීම සඳහා බැකෝ යන්ත්‍රය ඉල්ලීම සම්බන්ධව වෛද්‍ය අධිකාරීතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලපිටිය මූලික රෝහලේ වාහන අංගනය දැනට ජලය පිරී තිබීම හේතුවෙන් නිසි ආකාරයෙන් සකස් කළ යුතුව ඇත. ඒ සඳහා ඔබ ආයතනයේ බැකෝ යන්ත්‍රය මෙම මස අවසන් වීමට පෙර (ඉදිරි සතිය ඇතුළත ) ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව ඔබ දෙන්නාවූ සහායෝගය ඉතා අගය කොට සලකන බව ගරු සෞඛ්‍ය වෛද්‍ය අධිකාරීතුමා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. තෙල් රෝහලෙන් ලබා දීමේ පදනම මත මෙම ඉල්ලීම අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි රෝහලට උදවු කළ යුතුයි. නමුත් ඒ අය දැනුවත් කරන්න අපි රෝහලට ගියවිට අපටත් ඒ වගේ සැලකිමක් කරන්න කියා.

**තීරණය-**

බලපිටිය මූලික රෝහලේ වාහන අංගනය සකස් කිරීම සඳහා බැකෝ යන්ත්‍රය තෙල් රෝහලෙන් ලබා දීමේ පදනම මත ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.02 කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රණවිරු උපහාර උළෙලක් සඳහා හට්,පුටු සහ කොඩිකණු ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රෙජිමේන්තු මධ්‍යස්ථානය , කරන්දෙණිය. අවශ්‍යතා ඉල්ලීම් කිරීම. ඉල්ලුම් කර තිබෙනවා. ලීටර් 1000 ජල ටැංකි 05, ප්ලාස්ටික් පුටු 200, කොඩි කණු 50 එය සහා අනුමැතියට යටත්ව ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

කරන්දෙණිය රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රණවිරු උපහාර උළෙල සඳහා ලීටර් 1000 ජල ටැංකි 05, ප්ලාස්ටික් පුටු 200, කොඩි කණු 50 ක් සහා අනුමැතියට යටත්ව නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 03.03 වැසි ජලය අපවහන වැඩි දියුණු කිරීමේ පද්ධතිය (SWDI)ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධයෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වැසි ජලය අපවහන වැඩි දියුණු කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරිමේ පද්ධතිය . ඉහත කාරණය සම්බන්ධයෙන් ඔබ විසින් එවන ලද 2019.12.17 දිනැති ලිපිය හා බැඳේ. මෙම ව්‍යාපාරයේ ඉදිකිරීම් අවධියේ දි ඉදිකිරීම් ප්‍රමාණ සමීක්ෂයෙන් සැලසුම් කිරීම හෝ අධීක්ෂණයෙන් සඳහා අරමුදලේ කිසිදු මැදිහත් වීමක් සිදු නොවුන අතර එම කටයුතු ව්‍යාපෘතියේ නිලධාරින් හා ඔබ සභාවේ නිලධාරින් විසින් සිදු කර ඇත. එබැවින් මෙම ණය මුදල නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඔබ වෙත ලබා දුන් ණය මුදලක් බැවින් එම ණය වාරික හා පොළිය අයකරන මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමේ මැදිහත්කරුවෙකු වශයෙන් දේශිය ණය සහ සංවර්ධන අරමුදල ක්‍රියා කරන අතර , මේ සඳහා ණය අක කිරිමට බලය පවරන ලියවිල්ලක් සහ ණය අය කිරිමේ ලේඛනය මඟින් ඔබගේ ණය මුදල අප වෙත පවරා ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම හේතුව නිසා දේශීය ණය සහ සංවර්ධන අරමුදල නාගරික සංවර්ධන අධිකාරිය පමණ ගණුදෙනු කිරිමෙන් නොමැති බැවින් ණය අය කිරිම සම්බන්ධව අප ආයතනයට නාගරික සංවර්ධන අධිකාරියේ කැඳවීමෙන් කළ නොහැකි බව සඳහන් කර ඇත. එමෙන්ම ඔබ විසින් සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘතිය පිළිබඳව තාක්ෂණික වාර්තාවක් මෙතෙක් අප වෙත ලැබී නොමැති අතරම , ඔබ අප දෙපාර්ශවයම රාජ්‍ය ආයතනයන් බැවින් මෙම මුදල් රජයට ගෙවිය යුතු වැය බරක් බවද මෙමඟින් සඳහන් කර ඇත. එම නිසා ඉදිරි වර්ෂයේ ජනවාරි මාසය තුළ කඩිනමින් අප සමඟ සාකච්ඡා කර ණය මුදල ඔබට හැකි පරිදි ගෙවීම් කටයුතු සිදු කිරිම සඳහා ප්‍රතිව්‍යුහ ගත කිරිමට අවශ්‍ය කටයුතු කර ගන්නා ලෙස වැඩි දුරටත් සඳහන් කරක බවට නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ( මෙහෙයුම්) දේශිය ණය සහ සංවර්ධන අරමුදල

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි අපට එහි ඉතිහාසය දැන ගැනිමට හැකිද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙම ණය මුදල අම්බලන්ගොඩ නගර සභාවට ලබා දි තිබෙනවා. වැසි ජලය අපහරණ පද්ධතිය ඉදිකිරීම සඳහා. ඒ අවස්ථාවේදි එම ණය මුදල එවකට තිබූ සභාව මේ ණය මුදල ගෙවීම සම්බන්ධව සාකච්ඡා කර ඒ සභාවේදි තින්දු කර තිබෙනවා ප්‍රමාණවත් විදියට ප්‍රමාණපත්‍ර මඟින් කරන ලද වියදම් සහ ඒ කරන ලද වැඩ තින්දු කිරීමට. නමුත් අදවනතුරු නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවැනි ප්‍රමාණපත්‍රයකින් අපට භාර දි නැහැ. මේ ලිපියේ කියන්නේ අපේ අධිකෂණය යටතේ මෙය සිදු වුයේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරිය හරහා තමයි මෙය සිදු වුයේ. අපි මෙහි ණය අයකර ගැනිමේ කොටස විතරයි කරනු ලබන්නේ කියා. මෙය අරගෙන තිබෙන්නේ මට මතක හැටියට 2005 විතර. ගිවිසුම අත්සන් කරනු ලැබුවේ මා විසිනි. මෙහි වැඩ කටයුතු කරනු ලැබුවේ ගරු හිටපු සභාපති ජී.එම්. එස්. ද සිල්වා මහතාගේ කාලයේදි. ඒ කාලයේ නිසි භාරදීමක් වෙලා තිබුණේ නැහැ. අපි ඉල්ලන ලද කොන්දේසි අනුව කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙය වැසිජල අපහරණය යටතේ දේශීය ණය හා සංවර්ධන අරමුදල යටතේ ලබා ගෙන ඇති ණය මුදලයි.2005 අනුමත වුවත් 2008 වර්ෂයේ තමයි මෙය සිදු කරනු ලැබුවේ.ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරියට හා අපේ තාක්ෂණ සේවා නිලධාරිගේ අධික්ෂණය යටතේ තමයි ඔය දේවල් සිද්ධ වුණේ. ඒ කාලයේ ගරු මන්ත්‍රිවරු අනුමත කරලා සුමනදාස සර්විස් ආයතනයේ සිට කාණු පද්ධති හා හල්වතුරේ ඇළ දිගේ බැම් බැඳිම හා ඊළඟට මහ පන්සල පාරේ කාණු පද්ධතිය හා මහ පන්සල පිටුපස අපාය පිටුපස කාණු පද්ධතිය . ඇත්තටම අපට අදාළ නැති දෙයක් එතැන සිද්ධ වුණා. හල්වතුරේ ඇළ බැම් බැඳිම. එය වාරිමාර්ගයට අයිති. විශාල වියදමක් දැරුවා. ලක්ෂ 550ක පමණ වියදමින් ලක්ෂ 200 පමණ ගියේ එම බැම් බැඳිමට. ඉතිරි කොටස් අපේ. මෙකයි ගරු සභාපතිතුමනි බේර ගන්න තිබෙන්නේ. එතකොට අපට ඉදිරියට බේර ගන්න පුළුවන් ඉදිරියට. බේර ගන්න තිබෙන්නේ වාරිමාර්ගයට කතා කරලා ඒ අයගේ කොටස ඉල්ලා ගතයුතුයි කතා කර.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉදිරියේදි සාකච්ජා කර තීරණය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කාණු පද්ධතිය බදිද්දි මහ පන්සල පාරේ ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ප්‍රකාශ කරනු ලැබුවා . මහ පන්සල පාරේ කාණු පද්ධතිය ඉදිකරනු ලැබුවේ කාණු පටු කර. එමනිසා තමයි එහි වතුර හිරවෙලා කැඩිලා තිබෙන්නේ.එතැන ඇත්තටම ලොකු පළලට තිබුණ කාණුව තමයි පටු වෙලා තිබෙන්නේ. එම කාණුව කැඩිලා තිබෙන්නේ. ඔබතුමා එම ගොණුව ගෙන බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ . එකතමයි ප්‍රමාණවත් විදියට ප්‍රමාණපත් ලැබි නැහැ.

**තීරණය**

වැසි ජලය අපවහන වැඩි දියුණු කිරීමේ පද්ධතිය (SWDI)ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධයෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල විසින් එවා ඇති ලිපිය ඉදිරියේදී සාකච්ඡා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.04 2020 නිවාසාන්තර ක්‍රීඩා තරඟ පැවැත්වීමට ග්‍රාමණී විද්‍යාලයීය ක්‍රීඩාපිටිය 2020.01.07 දින සිට 2020.01.31 දින දක්වා වෙන්කරගැනීම සඳහා දප/අම්/ග්‍රාමණී මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගාමිණි විද්‍යාලයේ ක්‍රිඩා පිටිය වෙන්කිරිම. එම විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රිඩා තරඟ 2020.01.07 දින 2020.01.31 දින දක්වා පවත්වනු ලබනවා. එයට එම ගාමිණි විද්‍යාලීයිය ක්‍රිඩා පිටිය වෙන්කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. එය සභා අනුමැතියට යටත්ව ලබා දි තිබෙනවා.

**තීරණය-**

2020 නිවාසාන්තර ක්‍රීඩා තරඟ පැවැත්වීමට ග්‍රාමණී විද්‍යාලයීය ක්‍රීඩාපිටිය 2020.01.07 දින සිට 2020.01.31 දින දක්වා වෙන්කර දිම සභා අනුමැතියට යටත්ව ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 ලෝක රූකඩ නාට්‍ය දිනය වෙනුවෙන් පොතක් එළිදැක්වීම සම්බන්ධව වතුගෙදර ශ්‍රී ලංකා ගාමිණී රූකඩ කාට්‍ය හා කැටුම් කලායතනයේ ජී.ප්‍රේමින් මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලෝක රූකඩ නාට්‍ය දිනය වෙනුවෙන් පොතක් එළිදැක්වීම. සෑම වසරකම මාර්තු 21 දින ලෝක රූකඩ නාට්‍ය දිනය ලෙස නම්කර ඇත. එය මා විසින් ශ්‍රි ලංකාවට හඳුන්වා දුන් අතර ප්‍රථම වරට එම ජාත්‍යන්තර දිනය 2005 වසරේ මාර්තු 21 දින මරදාන ටවර් රඟහලේදි දවස පුරාම මහත් උත්සව ශ්‍රියෙන් සැමරුම් කරන ලදි. එය පිළිවෙළින් 2018 වසර දක්වා පැවැත්විණ. එහෙත් වසරකට වරක් පැවැත්වෙන එම දිනය 2019 වසරේ නොපැවැත්විණ. එය 2020 වසරේදි පැවැත්විමට අප බලාපොරොත්තුවෙන් සිටි. රූකඩ කලාව සඳහා වූ පාරම්පරික දැනුම මෙන්ම පරිබාහිරව සොයා ගත් බොහෝ වටිනා කරුණු රැසක් එක් කොට මවිසින් ලියා නිම කර තිබෙන පරපුරෙන් පරපුරට උරුම වු හෙල රූකඩ නාට්‍ය කලාව නමති පොත 2029 වසරේ ලෝක රූකඩ නාට්‍ය දිනට සමගාමිව එළිදැක්වීමට බලාපොරොත්තුවෙන් සිටින අතර ඒ සඳහා වැය වන බරපැන හමුවේ මහත් පසුබෑමකට ලක්වි සිටි. පුරා වසර දෙකකට වැඩි කාලයක් මේ සඳහා මා ගත් උත්සාහය සාර්ථක කර ගනිමින් මෙම පොත මුද්‍රණය කරගැනිම

සඳහා අනුග්‍රහය ලබා දෙන මෙන් ගෞරවණීය ඉල්ලීමක් කරන අතර දේශීය රූකඩ නාට්‍ය කලාවේ විවිධ කඩඉම් පසුකොට විවිධ අංශ මගින් දස්කම් දැක්වූ තෝරා ගත් ශිල්පී ශිල්පිනියන් දස දෙනෙකු පමණ සඳහා අවම වශයෙන් රුපියල් දස දහසක පමණ මුදලක් තිළිණයක් සමඟ සහතික පත්‍රයක් පිරිනැමීමට අදහස් කර සිටින නිසා මෙම කලා කටයුත්ත සාර්ථක කර ගැන්ම සඳහා ගෞරවණීය අනුග්‍රහය ලබාදෙන මෙන් ඉල්ලා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එම ලිපිය ඉදිරිපත් කරන ගම්වාරි ප්‍රේමින් මැතිතුමා නූතන කලා පරපුරේ සිටින සම්පත් පුද්ගලයෙකු හැටියටයි අපි දකින්නේ. එතුමාගේ මේ වැයමට බෞද්ධ කලාපුරවරයේ යම් දායකත්වයක් දිය හැකි නම් මා හිතන්නේ එය වටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , නිත්‍යානුකූලව එය දෙන්න පුළුවන්ද . මෙයට පෞද්ගලිකව ආධාරයක් කරන්න පුළුවන්. මා හිතන්නේ නැහැ නිත්‍යානුකූලව කරන්න පුළුවන් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය නැතිවී යන කළා සම්පාදයක්. මේ ගම්වාරි පරපුර තමයි මේ රූකඩ කළාව සම්පූර්ණ කරන්නේ.අම්බලන්ගොඩ රූකඩ කියා ප්‍රසිද්ධ වුණාට ඒ අය නොසිටින්න රූකඩයක් නැහැ. පොඩි පොඩි අය යම් යම් මට්ටමින් කරගෙන යනවා. නමුත් මේ අය අද වෙනකොට ලෝක සංචාරක ව්‍යාපාරයේ ඒ අයගේ නම තමයි තබාගෙන තිබෙන්නේ. දුම්රියේ යන විට ඒ අය දමනවා. ලෝක සංචාරක වෙළඳ දැන්වීමේ. මේ ගම්වාරි පරපුරේ රූකඩ කලාව. මුළු ලෝකයටම ප්‍රසිද්ධ වෙන්නේ. ඒ අය වෙනුවෙන් ඒ අය කරන කාර්ය පිළිබඳ අපට අභය කිරිමක් කරන්න පුළුවන් නම් ඉතාමත් වැදගත් . මෙය අම්බලන්ගොඩ රූකඩ කියන නමත් සමඟ ලොකු ඉතිහාසයක් තිබෙනවා. එමනිසා ප්‍රසිද්ධියක් තිබෙනවා. ඒ වගේම ඔවුන් කරන කාර්ය සාමාන්‍ය පරිදි වෙළඳාමක් නෙමේ. මෙහි කලාවකුත් තිබෙනවා. වානිජ්‍යමය ඒ අයට ලොකු වාසියක් නැති වුණත් මේ කළාව සම්බන්ධව කරගෙන යාම පිළිබඳව අපට ලොකු වගකීමක් හා යුතුකමක් තිබෙනවා ඔවුන් ආරක්ෂා කිරිම. මොන කණ්ඩායම් වුණත් මොන ප්‍රදේශයක වුණත් මේ අය හැඳින්වෙන්නේ අම්බලන්ගොඩ රූකඩ කියා. එමනිසා පුළුවන් කමක් තිබෙනවා අපට මොකක් හෝ ප්‍රතිපාදනයත් ලබා දෙන්න ඔවුන්ගේ ඉල්ලීම කෙරෙහි සලකා බලන්න කියන ඉල්ලීම මා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා හා ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාත් කරන කතා මා අසා සිටියා. මා හිතන්නේ අප 21 එකතු වුණත්

යම්කිසි මුදලක් දිය හැකියි. යම් ආධාර මුදලක් ගෙවන්න ගිහින් තව ඉදිරියට නගර සභාවට ඔවැනි ඉල්ලීම් එන්න පුළුවනි. එය උදාහරණයකට ගෙන අනිත් කට්ටිය ඉල්ලන්න පුළුවනි. අපට අද ලැබෙන මුදල් වලින් රු21000/= ක් එකතු කර එයට ලබා දෙන ලෙස.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, නිකං අපරාදේ මේ කාලය කන්නේ. මේ අනවශ්‍ය දේවල් මෙතැනට දැම්ම. මේ ලිපි එවන්න ඉස්සෙල්ලා අපට තින්දුවක් දිය හැකියි මෙය මේ ආකරයෙන් කරගන්න කියා. මේ නගර සභා බල ප්‍රදේශයේ තිබෙන එකක් නෙමේ. එහෙත් ප්‍රාදේශිය සභාවක් තිබෙනවා. මෙය කරන්න ඕන එකක්. හොඳයි. නිත්‍යානුකූලව කරන්න පුළුවන් දෙයක් කරන්න. ඒ ගැන බලා මෙය දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔය අදහසින් නෙමේ සභාව සිටියේ. මීට ඉහත අම්බලන්ගොඩ ලෝක රූකඩ කළාව කියා සංදර්ශනයක් පැවැත්වුවා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ. එය අපි සභාව විසින්ම රූකඩ කළාව කියා අම්බලන්ගොඩ කියන නම හා අයිතියත් සමඟ වූ ප්‍රචාරයත් එක්ක බැඳුනු නිසා මේ සභාව ලෝක රූකඩ කළාවට අනුග්‍රහය දැක්වුවා. ඒ අවස්ථාවේ අපි අනුග්‍රහය දැක්වුයේ සභාවෙන් අනුමත කරලා නිසි විදියට මුදල් ලබා ගැනීමෙන් පසු මුදල් වියදම් කළා. ඉතිං එම උළෙල කරනු ලැබුවේ අම්බලන්ගොඩ කියන නාමය මත. ලෝක රූකඩ උළෙල මුල් එක ටවර් රඟහලේ පවත්වනු ලැබුවා. දෙවැනි එක ධර්මාශෝක විද්‍යාලයේ. නගර සභා ආඥා පණතේ 159 I , ආ , ඇ ,ඈ කියන ඡේදය ගතහොත් එම ඡේදයේ මෙන්න මේ විදියට තිබෙනවා. ආගමික චාරිත්‍ර විදි උත්සව සංවිධානය කරන දහම් පාසල් ශාසනාරක්ෂක බල මණ්ඩල පවත්වාගෙන යන සංස්කෘතික මධ්‍යස්ථාන සංස්කෘතික වටිනාකමක් ඇති කළා කරුවන්ට හා ශිල්පින්ට සංවිධානය පිළිබඳ වියදම් හෝ අධාර මුදල් හෝ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරිමේහිලා සම්මත කරන නිත්‍යානුකූලව කරන්න කිසිම ප්‍රශ්නයක් නැහැ. දෙන මුදල පිළිබඳ තින්දුවක් විතරයි ගත යුත්තේ. මෙය පොතක් එළි දැක්විම නිසා කියක්ද තිරණය කරන්නේ. ඔහු ඉල්ලා සිටින්නේ රුපියල් දාහදහයි. එම මුදල ලබා දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

එම පොත් සියළුම පුස්තකාල වලට ලබා ගන්න කියා මා ඉල්ලිමක් කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒක අපි කරන්නම්. මෙය එකමතිකව සම්මතයි නේද? එය ලබා දෙන්න.

**තීරණය -**

ලෝක රූකඩ නාට්‍ය දිනය වෙනුවෙන් පොතක් එළිදැක්වීම සම්බන්ධව වතුගෙදර ශ්‍රී ලංකා ගාමිණී රූකඩ කාට්‍ය හා කැටුම් කලායතනයේ ජී.ප්‍රේමින් මහතා විසින් 2020 වර්ෂයේ පරපුරෙන් පරපුරට උරුම වූ හෙල රූකඩ නාට්‍ය කලාව නමැති පොත එළිදැක්වීම සඳහා රු.10000/= ක මුදලක් ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින්

යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

## 03.06 නගර සභාවේ සේවයේ නියුතු ඩබ්.ඩග්ලස් මයාගේ පියාගේ වාර්ෂික දානමය පිංකම සඳහා පුටු 50 ක් ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පුටු 50ක් ලබා ගැනිම. ඉහත නම සඳහන් අම්බලන්ගොඩ නගර සභාවේ ස්ථිර සේවයේ නියුතු හා ඩබ්.ඩග්ලස් මයාගේ පියාගේ වාර්ෂික දානමය පිංකම සඳහා පුටු 50 ක් ඉල්ලා තිබෙනවා. පුටු 50ක් ලබා දි තිබෙනවා . එය සභා අනුමැතියට යටත්ව ලබා දි තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

නගර සභාවේ සේවයේ නියුතු ඩබ්.ඩග්ලස් මයාගේ පියාගේ වාර්ෂික දානමය පිංකම සඳහා පුටු 50 ක් ඉල්ලා ඇති අතර එම ඉල්ලිම සභා අනුමැතියට යටත්ව ලබාදිම අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.07 නගර සභාව සතු ට්‍රැක්ටර් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය වන අමතර කොටස් ඉල්ලා වැඩ කර්මාන්ත අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඒ.ඩබ්. හිමාල් ගුණවර්ධන , වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් ඉල්ලිමක් කර තිබෙනවා. නගර සභාව සතු ට්‍රැක්ටර් අළුත් වැඩියාව සඳහා නිතර අවශ්‍ය වන අමතර කොටස් සහිත සඳහන් කර ඇත. එස අමතර කොටස් නොමැතිව ට්‍රැක්ටර් නඩත්තු කටයුතු කිරිම නොහැකි බැවින් අළුත් වැඩියාව ප්‍රමාද වේ. එම නිසා මෙම අමතර කොටස් ලබා ගැනීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර සිටිනවා. ට්‍රැක්ටර් ටේලර් හෝස 10, ඔයිල් ෆිල්ටර් , ඩීසල් ෆිලටර් 10, ට්‍රැක්ටර් හෝස් වැල් ( ෆිමේල්) 10, ට්‍රැක්ටර් හෝස් වැල්(මේල් ) 10, 28520 රේසර් 05, 28985 රේසර් 05, 30209 රේසර් 10, 30211 රේසර් 10, බ්‍රේක් ලයිනර් සෙට් 04, ට්‍රැක්ටර් හබ් බෝල්ට් 20, ඉදිරිපස රෝද රේසර් MF 08, පිටුපස රෝද රේසර් MF 08, පිටුපස රෝද අක්සල් සීල් MF 04, ෆෑන් බෙල්ට් DI 575 05, ඩෙල්ටනේටර් බෙල්ට් DI 575, K75 ඩිසල් ෆිල්ටර් 10, ඇක්සල් ඔයිල් සීල් K75 12,බ්‍රේක් ෂු සෙට් 06, හැන්ඩ් බ්රේක් කප් 03, සයිඩ් ක්ලච් කේබල් 08, මේන් ක්ලච් කේබල් 05, ඇක්සලේටර් කේබල් 05, 65016 රින් 04, DI 575 බ්‍රේක් ඩිස්ක් 04. එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තිරණය -**

නගර සභාව සතු ට්‍රැක්ටර් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය වන අමතර කොටස් ඉල්ලා ඒ.ඩබ්. හිමාල් ගුණවර්ධන , වැඩ ක්ෂේත්‍ර පරිපාලක මහතා විසින් ට්‍රැක්ටර් ටේලර් හෝස් 10, ඔයිල්

පිල්ටර් , ඩීසල් පිලටර් 10, ට්‍රැක්ටර් හෝස් වැල් ( පිමේල්) 10, ට්‍රැක්ටර් හෝස් වැල්(මේල් ) 10, 28520 රේසර් 05, 28985 රේසර් 05, 30209 රේසර් 10, 30211 රේසර් 10, බ්‍රේක් ලයිනර් සෙට් 04, ට්‍රැක්ටර් හබ් බෝල්ට් 20, ඉදිරිපස රෝද රේසර් MF 08, පිටුපස රෝද රේසර් MF 08, පිටුපස රෝද අක්සල් සීල් MF 04, ෆෑන් බෙල්ට් DI 575 05, ඩෙල්ටනේටර් බෙල්ට් DI 575, K75 ඩිසල් පිල්ටර් 10, ඇක්සල් ඔයිල් සීල් K75 12,බ්‍රේක් ෂූ සෙට් 06, හැන්ඩ් බ්රේක් කප් 03, සයිඩ් ක්ලච් කේබල් 08, මේන් ක්ලච් කේබල් 05, ඇක්සලේටර් කේබල් 05, 65016 රින් 04, DI 575 බ්‍රේක් ඩිස්ක් 04. යන අමතර කොටස් ඉල්ලා ඇති අතර එය මිළ ගණන් කැඳවා ලබා ගැනිමට අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**03.08 2019 නොවැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 නොවැම්බර් මස වාර්තාව සභාගත කරන ලදි. ආයතනයෙහි සායන තැබූ දින ගණන 21 ½ , ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 426, රෝගින් පැමිණිමේ දෛනික සාමාන්‍ය ගණන දින 20, මාසය සඳහා වැය වු ඖෂධවල මුළු වටිනාකම රු.33044.33 කි. එක් රෝගියෙක් සඳහා වැය වු මුදල රු.77.57 කි. එය සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**තීරණය**

2019 නොවැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.09 නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2019.12.31 දිනට ඖෂධ තොග සම්බන්ධ තොරතුරු සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 දෙසැම්බර් 31 දිනට ඕෂධ තොග සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර තිබෙනවා. 2019.01.01 දිනට ඉතිරි ඖෂධවල ආරම්භක තොගයේ මුළු වටිනාකම රු.154880/= 2019 වර්ෂයට ලැබුණු ඖෂධවල මුළු වටිනාකම රු.235612/=, එමනිසා 2019 වර්ෂය තුළ පැවති මුළු ඖෂධවල වටිනාකම රු.380482/=, 2019 වර්ෂය තුළ වැය වු ඖෂධවල මුළු වටිනාකම රු.31111.20 ඒ අනුව 2019/1231 දිනට ඉතිරි ඖෂධවල මුළු වටිනාකම රු.79380.80කි . මෙය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කර තිබෙනවා.

**තීරණය**

2019 දෙසැම්බර් 31 දිනට මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ තොග සම්බන්ධ මාසික වාර්තාව ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.10 2020 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2020.02.05 දින පැවැත්වෙන බැවින් ග්‍රාමණී විද්‍යාලයීය ක්‍රීඩාපිටිය 2020.02.05 දින දක්වා වෙන්කරදෙන ලෙස ඉල්ලා දප/අම්/ග්‍රාමණී මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2020.02.05 දින පැවැත්වෙන බැවින් ග්‍රාමණී විද්‍යාලයීය ක්‍රීඩාපිටිය 2020.02.05 දින දක්වා ඉල්ලා ඇත. එය සභා අනුමැතියට යටත්ව ලබා දිමට කටයුතු කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

2020 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2020.02.05 දින පැවැත්වෙන බැවින් ග්‍රාමණී විද්‍යාලයීය ක්‍රීඩාපිටිය 2020.02.05 දින දක්වා සභා අනුමැතියට යටත්ව වෙන්කර දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 ඉදිකළ යුතු මගී ආවරණ පිළිබඳ විස්තර ලබාගැනීම යන මැයෙන් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඉදිකළ යුතු මගි ආවරණ පිළිබඳ විස්තර ලබා ගැනිම. මගී ජනතාව ප්‍රවාහන සේවා සලසා ගැනිමේදි පිඩාවට පත්විම වැලැක්වීම සඳහාත් ප්‍රවාහන සේවාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරිම සඳහාත් අත්‍යවශ්‍ය වන භෞතික සම්පත් ගොඩනැගිම අත්‍යවශ්‍යව පවති. මේ යටතේ දකුණු පළාත තුල බස්නැවතුම්පොල ඇතුළු අනෙකුත් භෞතික සම්පත් සාපේක්ෂව ගොඩනැගි ඇති බව තහවුරු වේ. එහෙත මගීන්ගේ පරිහරණය සඳහා අත්‍යවශ්‍ය ස්ථානයන්හි මගී ආවරණ ප්‍රමාණවත්මකව ඉදිවි නොමැති බැවින් ඒ සභා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට අධිකාරිය තීරණය කර ඇති බව දන්වා ඇත. මේ යටතේ 2020 – 2024 ( ඉදිරි වසර තුල ) වර්ෂය තුල ඉදිකල යුතු අත්‍යවශ්‍ය මගී ආවරණ මොනවාද යන්න හඳුනා ගැනිමට මෙම අධිකාරිය කටයුතු කරමින් පවති. එබැවින් මගින්ගේ පරිහරණයට අත්‍යවශ්‍ය වන ඔබ සභා බල ප්‍රදේශය තුල ඉදිකිරිමට යෝජනා කරනු ලබන මගි ආවරණ ප්‍රමුඛතාකරණය කොට මහ සභාවේ යෝජනා

සම්මතයක් මගින් මෙම අධිකාරියට කඩිනමින් යොමු කරන මෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ අධිවේගී මාර්ගයේ ධාවනය වන බස් දෙකම ගසනු ලබන්නේ මගී ජනතාව ඇතුළුවන කොරිඩෝව ඇහිරෙන ලෙසයි. මා ඉල්ලීමක් කරනවා එම බස් දෙකට ආවරණ දෙකක් ලබා දෙන්න කියා. නැතිනම් මගී ජනතාවට සැහෙන අපහසුතාවයක් වෙනවා. එම අධිවේගී මාර්ගයේ ධාවනය වන බස් දෙකම ගසනු ලබන්නේ. ඒ කිසිම කෙනෙකුට ගමන් කළ නොහැකි පරිදියි.මා ඉල්ලීමක් කර සිටිනවා එම දෙය කර දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළවල් හදන්න අම්බලන්ගොඩ නගරයේ කිහිපයක්ම ඇති. කුඩා ප්‍රදේශයක් වන නිසා. මා යෝජනා කරනවා බස්නැවතුම්පොළ ඉදිරි පිට ඇති කාණුවලට ආවරණ යොදන්න කියා. එයට මුදල් ගැනීමට එහෙන් ඉදිරිපත් කරන්න කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇස්තමේන්තු හදලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහි අඩුපාඩු තිබෙනවා නම් එවත් එක්කම යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළ ඔය ස්ථාන නම් කිරීමේදී අපේ කෙරමිණිය ප්‍රදේශයේ තිබෙනවා කොටන් 4ක් උඩ තිබෙන බස්නැවතුමක්. මහන්දසිරි ප්‍රනාන්දු මහතාගේ ඉඩමෙන් ලබා දී තිබෙනවා බස්නැවතුම්පොළක් ඉදිකිරීමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොතනද? තැන හරියට කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

පොකුණ පාරේ ඩිස්නි කර්මාන්තශාලාවට ඇතුළුවන තැන කොනේ නැවතුමක් අපට ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බෞද්ධ මධ්‍යස්ථානය ඉදිරිපිට ඇති බස්නැවතුම්පොළ දිරා පත්වෙලා. එය කඩා වැටිලා. එය ප්‍රසිද්ධ බස්නැවතුම්පොළක්. එය හදන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා, එම බස්නැවතුම්පොළ පොලිසියෙන් ඉල්ලීමක් කළා . එතැනින් අයින් කර ක්‍රීඩාංගණය ඉදිරිපිටට ගෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය පොලිසියේ ඉල්ලීමට කරන්න. කොතන හරි හදන තැන හදන්න. එය වැදගත්. ඊළඟට කුලරත්න පාරේ සක්වා එකට හැරෙන තැන. ජනතාව එතැන දැන් නැවතුම්පොළක් හදා ගෙන තිබෙනවා. බස් නතර කරනවා. විශේෂයෙන් අමතර පංති යන ළමුන් හා මවුරුන් එතැනින් බසයට නගිනවා. දැනට භෞතිකව එතැන අපි බස්නැවතුම්පොළක් නම්කර නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතැන හැබැයි ප්‍රශ්නයක්. බෝක්කුවත් සමඟ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

බෝක්කුව අයිනේ ඉඩ තිබෙනවා. පාර පළලයිනේ. එතැන පළලයි. බස්නැවතුම්පොළක් ලෙස එතැනට එනවා නම් ජනතාව නගිනවා නම්. බස්රථය නතර කරනවා නම් බස්නැවතුම්පොළක්නේ නැත්තේ. බස්නැවතුම්පොළක් නැති වුණත් ජනතාව එතැනින් නගිනවා.එතකොට මගී ආවරණයක්නේ ඕන. එතැන අයිනේ අපට ඉඩ තිබෙනවා. ඒක කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

පොලිසිය ඉදිරිපිට විශාල ජනතාවක් ගැවසෙනවා නිතරම. එතැන මගී ආවරණයක් ඉදිකරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත්  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගාලු පාරේ හිරේවත්ත බුදු පිළිමය ඉදිරිපිට මගි ආවරණයක් ඉදිකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කුලරත්න විද්‍යාලයට යන හැරෙන තැන මගි ආවරණයක් ඉදිකරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඉල්ලීම් කළා . හිරේවත්ත බුදු පිළිමය ඉදිරිපිට සුදු ඉරි අඳින ලෙස. මීට මාස 5කට පමණ ඉහත දි ඔය යෝජනාව දැමුවේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

කොහේද ඔබතුමිය කියන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්__

මමත් ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතාත් යෝජනා කළේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

සරත් මන්ත්‍රීතුමා කියන තැන අපි ඇන්ඳා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්__

මා යෝජනා කළා හිරේවත්ත බුදු පිළිමය ළඟ. එය ඇඳ නැහැ. එතැන විශාල ප්‍රමාණයක අනතුරු වෙනවා. ජනතාව ගමන් කරනවා. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතාත් ප්‍රකාශ කලා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මෙහෙම දෙයක් තිබෙනවා. දැන් අම්බලන්ගොඩ නගරයේ කහ ඉරි තිබෙනවා 10 කට ආසන්න ප්‍රමාණයක්. 8ක් විතර. එහිදි සෑම වාහනයක්ම නතර කරන විට අම්බලන්ගොඩ පසුකිරිමට විනාඩි 30ක් පමණ ගතවෙනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්__

කහ ඉරි නෙමේ . දැන් සුදු ඉරි තිබෙන්නේ.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මේ ටික අපි දන්වා යවන්නම්. මා යෝජනා කරනවා ඒ ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන ලද සියළු යෝජනා. එය කවුරු හරි ස්ථිර කරන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

එම යෝජනා මා ස්ථිර කරනවා.

**තීරණය-**

ඉදිකළ යුතු මගී ආවරණ පිළිබඳ විස්තර ලබාගැනීම යන මැයෙන් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් එවා ඇති ලිපිය අනුව පහත සඳහන් ස්ථාන වල මගී ආවරණ ඉදිකිරිමට , මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත දන්වා යැවිමටත් , ගරු සභාවේ

මන්ත්‍රිවරුන් විසින් කරන ලද යෝජනා ගරු සභාපති අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- කෙරමිණිය මහින්ද ප්‍රනාන්දු මහතාගේ ඉඩමේ ඩිස්නි කර්මාන්තශාලාවට ඇතුළුවන කොනේ
- බෞද්ධ මධ්‍යස්ථානය අසළ තිබෙන මගි ආවරණය මහජන ක්‍රිඩාංගණය ඉදිරිපිටට ගෙන ඉදිකිරිම.
- කුලරත්න පාරේ සක්වා එකට හැරෙන තැන
- පොලිසිය ඉදිරිපිට
- ගාලු පාරේ හිරේවත්ත බුදු පිළිමය ඉදිරිපිට
- කුලරත්න විද්‍යාලයට යන හැරෙන තැන

## 03.12 යෝජිත කසල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යන මැයෙන් බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බළපිටිය ප්‍රාදේශිය සභාව , යෝජිත කසල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම නානතොට , කොස්ගොඩ. උක්ත කරුණ සම්බන්ධව ජාතික සණ අපද්‍රව්‍ය සහය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමාගේ ලිපිය හා බැඳේ. මෙම යෝජිත කසල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන අමාත්‍යාංශය විසින් කවෂිමා නම් ජපන් තාක්ෂණික කොම්පොස්ට් නිෂ්පාදන යන්ත්‍රයක් බලපිටිය ප්‍රාදේශිය සභාවට ලබාදිමට නියමිත අතර මෙය දිනකට කසල ටොන් 50ක් කොම්පොස්ට් බවට පත් කිරිමට හැකිවේ. බලපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ජනනය වන කසල ප්‍රමාණය මේ සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ආසන්න පළාත් පාලන ආයතනවල එක් රැස්වන දිරණ කසල මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලෙස පළාත් පාලන අමාත්‍යාංශය උපදෙස් ලබා දි ඇත. ඒ අනුව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ඔබ ආයතනයේ දිරණ කසළ මෙම ව්‍යාපෘතියට ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. මේ සඳහා සභා අනුමැතිය තබා ගන්න එක හොඳයි. හදිස්සියේ ප්‍රශ්නයක් වුණොත් එම ප්‍රශ්නයේදි අපේ වාහන ටික මේ ස්ථානය දක්වා යවන්න වෙනවා. ඉතිං අපි මොනරියාවත්තට ගත්තා. අද මොන්රියාවත්ත වසා දමා තිබෙන්නේ. නමුත් බළපිටියේ මේ ස්ථානයට යැවිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. යවනවාද නැද්ද කියන එක එදාට තිබෙන ප්‍රශ්න සමඟ තින්දු කරන්න.

**තීරණය-**

යෝජිත කසල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යන මැයෙන් බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් එවා ඇති ලිපිය සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.13 ක්‍රීඩාංගන වෙන්කරවා ගැනීම සම්බන්ධයෙනි යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් තුමිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය , අම්බලන්ගොඩ. ක්‍රිඩාංගන වෙන් කරවා ගැනිම සම්බන්ධවයි. 46 වන ජාතික මහ ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියර තරඟ ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල සඳහා පහත සඳහන් දිනයන්හි දී ක්‍රිඩාංගන නොමිලේ වෙන්කර දීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය හැමදාම ලබා දුන්නානේ. එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත ක්‍රිඩාංගණය 2020 පෙබරවාරි 22,23,24 මාර්තු මස 01,14,15,21 යන දිනවලත් මානාන ක්‍රීඩාංගණය මාර්තු 01

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඉරිදා දින දහම් පාසැල් තිබෙනවා. පෝය දිනය හා එම දිනය හැර ලබා දුන්නාට කමක් නැහැ.

**තීරණය-**

ක්‍රීඩාංගන වෙන්කරවා ගැනීම සම්බන්ධයෙනි යන මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් තුමිය විසින් යොමුකරන ලද ලිපියට අනුව එම ක්‍රිඩාංගණ ඉරිදා හා පෝයදිනවල හැර ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සබා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා කොඩි කණු ලබාගැනීම සඳහා අම්බලන්ගොඩ ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ප්‍රජාපති ගෝතමී බාලිකා මහ විද්‍යාලය. නිවාසාන්තර ක්‍රිඩා උත්සවයට කොඩි කණු ලබා දිම. එය සභා අනුමැතියට යටත්ව ලබා දි ඇත .

**තීරණය-**

අම්බලන්ගොඩ ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා කොඩි කණු 50ක් 2020 01.29 දින සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 එළිමහන් ව්‍යායාම උපකරණ සැපයීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම සම්බන්ධවයි යන මැයෙන් නුගේගොඩ , ඒසර් මාර්කටින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එළිමහන් ව්‍යායාම උපකරණ සැපයීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම සම්බන්ධවයි. ඇණවුම් අංක 2342 දරණ එළිමහන් ව්‍යායාම උපකරණ ඇනවුම ලබා දීම සම්බන්ධව ස්තුතිය පලකර සිටි.2019.10.30 දින අපගේ මිල ගණන් පත්‍රිකා අම්බලන්ගොඩ නගර සභාව වෙත යොමු කරන ලද අතර අදාල ඇනවුම්පත අප වෙත ලැබුනේ 2019.01.10 වන දිනය. මෙම ප්‍රමාදය නිසා භාණ්ඩ නිපැයුම් අවසන් කිරිම සඳහා අපගේ මව් ආයතනයට මාස දෙකක පමණ කාලයක් ගත වන බව දන්වා ඒවා ඇත. එයට හේතුව් ඇත්තේ නිෂ්පාදිත රටේ 2020 පෙබරවාරි මස අවසන් සතියේ සිට මසක් අලුත් අවරුදු නිවාඩු වශයෙන් යෙදී ඇති නිසාය. අප ආයතනය විසින් මෙම ඇනවුම් සඳහා කොටස් දෙකකට භාණ්ඩ ආනයනය කරන අතර මුල්ම ඇනවුම් ගෙන්වීම සඳහා දැනටමත් මුදල් යැවීමට කටයුතු සලසා ඇත. ඉතිරි ඇනවුම් ගෙන්වා ගැනීම සඳහා බිල් වටිනාකමින් සියයට පනහක ( 50%) අත්තිකාරම් වශයෙන් ලබා දිමට කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා ඇත. Eser marketing International ( PVT) LTD සමාගම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම භාණ්ඩ සපයා තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තවම නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

තවම නැතිනම් අපට ගිවිසුම් ගතවෙලා මෙම මුදල ලබා දිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට දෙන්න වෙන්නේ 20% ක මුදලක් පමණයි. ගිවිසුමක් අත්සන් කර ඒ ආකාරයෙන් නිත්‍යානුකුලව එය ලබා දෙන්න.

**තීරණය-**

එළිමහන් ව්‍යායාම උපකරණ සැපයීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම සම්බන්ධවයි යන මැයෙන් නුගේගොඩ , ඒසර් මාර්කටින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම විසින් කරන ලද ඉල්ලිමට අනුව ගිවිසුම්ගත වී 20% ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 අම්බලන්ගොඩ නගර සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍රවල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය මෙලම් ලබාගැනීම සඳහා මෝටර් කාර්මික ප්‍රදීප් ක්‍රිශාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෝටර් කාර්මික ප්‍රදීප් ක්‍රිශාන්ත කුමාර මහතා. අම්බලන්ගොඩ නගර සභාව. නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය මෙවලම් ලබා දිම. අම්බලන්ගොඩ නගර සභාව සතු යන්ත්‍ර සූත්‍ර සඳහා සේවය සපයන යන්ත්‍ර සූත්‍ර පැරණි අතර ඒවා වෙනුවට නව මෙවලම් අවශ්‍යාව ඇත. දැනට පවතින මෙවලම් නුසුදුසු කල් ඉකුත් වි ඇති අතර අළුතින් මෙවලම් ලබා ගැනිමට අවශ්‍යයි කියා ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත. එම ලැයිස්තුව ලබා දිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

යන්ත්‍ර සූත්‍රවල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය මෙලම් ලබාගැනීම සඳහා මෝටර් කාර්මික ප්‍රදීප් ක්‍රිශාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කර ඇති මෙවලම් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.17 නොමිලේ ක්‍රීඩාපිටිය, කැනපි, කොඩි කණු සහ පුටු ලබාගැනීම යන මැයෙන් අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දිස්ත්‍රික් රෝහල අම්බලන්ගොඩ. අම්බලන්ගොඩ දිසා රෝහලේ සුහසාධක සමිතියට ආධාර පිණිස දෙවන වරටත් පවත්වනු ලබන දකුණු පළාත් සෞඛ්‍ය ආයතන පමණක් සහභාගි වන සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 2020.03.07 දින අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේදි පැවැත්වීමට තීරණය කර තිබේ. කැනපි 10, පුටු 50 සහ කොඩි කණු 30ක් නොමිලේ ඉල්ලා ඇත. එය ලබා දෙන්න.

**තීරණය-**

2020.03.07 දින අම්බලන්ගොඩ දිස්ත්‍රික් රෝහලේ සුහ සාධක සමිතියට ආධාර පිණිස දෙවන වරටත් පවත්වනු ලබන සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය සඳහා පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගණය , කැනපි 10, පුටු 50, කොඩි කණු 30ක් නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.18 ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරීම යන මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පහත නම් සඳහන් ප්‍රජා මණ්ඩල පිහිටුවීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටි. ( පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වීම සඳහා මහ සභාවේ අනුමැතිය අවශ්‍ය වේ).මෙම ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරීම සඳහා මා යෝජනා කරනවා. පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය, තල්ගස්ගොඩ ප්‍රජා මණ්ඩලය, කෙරමිණිය ප්‍රජා මණ්ඩලය, මහ අම්බලන්ගොඩ ප්‍රජා මණ්ඩලය. එම යෝජනා ස්ථිර කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ස්ථිර කරනවා එම යෝජනාවන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඔය ප්‍රජා මණ්ඩල යටතේ මා ප්‍රකාශ කර සිටියා අම්බලන්ගොඩ නගර සභා සුබ සාධක සමිතියටත් ප්‍රජා මණ්ඩල යටතේ ලියා පදිංචි වෙන්න කියා. ඒ අය අසා තිබෙනවා ප්‍රාදේශිය ලේකම්ගෙන්. ප්‍රාදේශිය ලේකම්ට බලයක් නැහැ. පලාත් පාලන කොමසාරිස් හරහා නේ මෙය එන්නේ. අපි අනුමැතිය දෙන්නේ නගර සභාවෙන්. ඉතිං නගර සභා ප්‍රජා සංවර්ධන කමිටුවක් පිහිටුවා පටබැඳිමුල්ලට හරි කරිත්ත කන්දට හරි දෙකක් තිබුණා කියා ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. පිහිටුවන්නනේ කියා තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි එහි නිත්‍යානුකුල තත්ත්වය බලා අපි එය පිහිටුවන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

එය සභාවේ සේවකයන්ට කොහොමත් හොඳයිනේ.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පහත සඳහන් ප්‍රජා මණ්ඩල පිහිටුවීම සඳහා මෙම ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරිම සුදුසු බවට ගරු සභාපති එම් ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය..

- පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය,

- තල්ගස්ගොඩ ප්රජා මණ්ඩලය,
- කෙරමිණිය ප්‍රජා මණ්ඩලය,
- මහ අම්බලන්ගොඩ ප්‍රජා මණ්ඩලය.

**03.19 නගර සභාවට අලුතින් ශබ්ද විකාශන යන්ත්‍රයක් හා පීකර් ලබාගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා මාදුවගේ නලින් චන්ද්‍රජිත් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාදුවගේ නලින් චන්ද්‍රජිත් , පිණිවුඩකරු නගර සභාව , අම්බලන්ගොඩ. සභාවේ ඇති ශබ්ද විකාශන යන්ත්‍රය සම්බන්ධව. අප සභාවේ ඇති ශබ්ද විකාශන යන්ත්‍රය හා ලවුඩ්ස්පිකර අබලන් වී ඇති බැවින් අලුතින් මෙම උපකරණ ලබා ගැනීම සඳහා කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**තීරණය -**

මාදුවගේ නලින් චන්ද්‍රජිත් මහතා විසින් ( පණිවුඩකරු) , අම්බලන්ගොඩ. සභාවේ ඇති ශබ්ද විකාශන යන්ත්‍ර හා ලවුඩ්ස්පිකර අබලන් වි ඇති බැවින් අලුතින් මෙම උපකරණ ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.20 ලොතරැයි අලෙවි කුටි බදු මුදල් ඉහල නැංවීම යන මැයෙන් අම්බලන්ගොඩ , මානිමුල්ල පදිංචි කේ.එම්.හේමසිරි මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කේ.එම්. හේමසිරි , මානිමුල්ල , අම්බලන්ගොඩ. ලොතරැයි අලෙවි කුටි බදු මුදල් ඉහල නැංවීම. 2020 ජනවාරි මස සිට ලොතරැයි අලෙවි කුටියක මාසික බදු මුදල රු.10000/= බැගින් ගෙවිම් කරන ලෙස දන්වා ඇත. වසර 20ක් පුරා අලෙවි කුටියක බදු මුදල් රු 300/= , රු.500/=, රු.1200/= පවතින එකවර රු.10000 දක්වා වැඩි කිරිම 80% දක්වා බදු වැඩි කිරිමකි. ලෙස දිග ලිපියක් තිබෙනවා.එය අඩුකරන්න කියා ඉල්ලිමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා දැනුවත් වුණා අලෙවි ප්‍රවර්ධන නිලධාරින්ගේ හා කලාප අලෙවි නිලධාරිනුයි සමඟ ඔබතුමා දැනුවත් වුණා. මා හිතන්නෙත් මෙහි සංශෝධනයක් විය යුතුයි කියා. මොකද මේ බස්නැවතුම්පොළේ තිබෙනවා අලෙවි කුටි 5ක් විතර . ඒ සියළු දෙනාම අම්බලන්ගොඩ නගර සභාවට බදු දෙන අය . මේ වැඩිකිරිම සම්බන්ධව අපි එකපාරට

රු.10000/= ක් පමණ වැඩිකළා. නමුත් එය එකපාරට වැඩිකිරිම නිසා ඒ අය අපහසුතාවයට පත්වුණා. මා හිතන්නේ රු. 1000/= ක් ලබා ගන්නවා අපි කිසිම කෙනෙක් ඇස්දෙකට දැක නැහැ. එය අර හතර දෙනාටම මෙය බලපාන එකත් වැරදියි. එම නිසා මේය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා. සාධාරණ මුදලක්. එමනිසා මෙය සංශෝධනය විය යුතුයි කියා මා ඉල්ලා සිටිනවා. මේ සඳහා ඔබතුමාගේ සහභාගිත්වයෙන් ගරු සියළු මන්ත්‍රිවරුන්ගේ සහභාගිත්වයෙන් ප්‍රවර්ධන නිලධාරින් දැනුවත් කරලා ඔවුන් සමඟ සාකච්ඡාවක් කර ඒ ගැන තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එතුමා මාවත් මුණ ගැසුණා. එතුමා මාගේ සමකාලිනයෙක්. මේ ගැන විස්තරයක් ප්‍රකාශ කළා මා හට. මා එම විස්තරය අසන විට හිතෙනවා මෙය සංශෝධනය විය යුතුයි කියා. ඒ අයගේ දුක් ගැනවිල්ල කිවුවා. මෙයට හේතුව යම් පුද්ගලයෙක් කුඩු වගයක් අලුතින් දැම්මක් කියා කිවුවා. ඒ පුද්ගලයාගේ නමත් කිවුවා. මා එම නම මෙතැනදි සඳහන් කරන්නේ නැහැ. ඊට අමතරව එම පුද්ගලයා අපට ගහන්නත් ආවා මළගෙදරකදි. මේ මන්ත්‍රි මණ්ඩලයට කිවුවා මේ මන්ත්‍රි මණ්ඩලය බලු නඩයක් කිවුවා. එහෙම ප්‍රකාශයක් කළා ප්‍රසිද්ධියේ. ඒ ගැනත් මා මෙහිදි සඳහන් කරනවා. මා ඇත්තටම හිතාගෙන හිටියේ මෙය සාධාරණ වුණත් ආසාධාරණ වුණත් මා විරුද්ධ වෙනවා මෙය අඩු කරනවාට කියා. එම මතයේ තමයි මා සිටියේ එම මළ ගෙදරින් පසු. නමුත් මේ දැන් ඒ අය සාධාරණ ඉල්ලීමක් කරන නිසා මෙයට මට මුකුත් කියන්න බැහැ. මා මේ අවස්ථාවේදි එයටත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. අපේ සභාවෙන් ප්‍රයෝජන ගන්න කට්ටිය අපේ ගරු මන්ත්‍රිවරුන්ට බලු නඩය කියා ප්‍රකාශ කිරිම ගැන. මා හිතන්නේ එයට සාක්ෂි දරන්න තව ගරු මන්ත්‍රිවරු හිටියා. ඔවුනුත් සාක්ෂි දරයි. එකත් සඳහන් කරන්න. මේ ගැන සාධාරණයක් කරන්න. අපේ කට්ටියනේ. අම්ලන්ගොඩ කට්ටියනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ලොතරැයි කුටි සම්බන්ධව මුදල් වැඩිකිරිම සම්බන්ධව සභාවෙන් ගත් තින්දුව පිළිබඳව ගරු හිටපු නාගර සභා මන්ත්‍රි හේමසිරි මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. එදා වැඩිකරන විටත් කිවුවා මෙය සාධාරණ ක්‍රමයකට කරන්න කියා. මෙය සභාවට එන ආදායමක් ගරු මන්ත්‍රිවරු කියන විට අපට තර්ක කරන්න බැහැ. මෙම හේමසිරි මහතාගේ ඉල්ලිම සාධාරණයි. ඔබතුමා ඇතුළු අපි ගරු මන්ත්‍රිවරු පොඩ්ඩක් හිතලා බලන්න. අපි කියන්නේ නගරයේ සිටින ලොතරැයි කුටිවල සිටින අය . නගරයේ සමහර වේලාවට ලොතරැයි කූඩුවක් දමා තිබෙනවා නම් හේමසිරි මහතාට ඉන්නත් බැහැනේ. එය දෙනවා කාටහරි කරගන්න. දිලි ගාණක් ගන්නවා. එක දෙනවා. සාධාරණ වශයෙන් එය එහෙම වුණනම් හොඳයි. මෙම අඩුකිරිම කර එය සාධාරණීකරණය කරන්න. දැන් සමහර අය කියනවා. පියල් මහතා පැවසුවා ගරු උප සභාපතිතුමාගේ ප්‍රදේශයේ තිබෙනවා කුටියක්. නම කියලාම කිව්වේ. හැබැයි ඔබතුමා හිටියා නම් එතැන ලොකු ප්‍රශ්නයක් වෙනවා. නමුත් මෙතුමාට තමයි දෝෂාරෝපණය කළේ. නමුත් හිටපු උප සභාපති ජේ.පි අමරසේන මහතාගේ පුතාටත් මෙතුමා කියා වැරදිලා රාජපක්ෂ මහතා කියා වැරදිලා. හැබැයි ඔය ඔක්කොම පැටලැවිලි ටික දැම්මේ

ඔබතුමා.එකයි වුණේ. මෙතුමා කිවුවා අන්න ගරු මන්ත්‍රිවරු සිටිනවා. බේර ගන්න කියා. එහෙම කිවුවාට පසු තමයි ඔය තත්ත්වය ඇති වුණේ. එක නිසා බලන්න . එතුමාගේත් ඥාතිනේ. හැබැයි සාධාරණයක් කරන්න. කවුරු වුණත් කමක් නැහැ. ප්‍රශ්න ගැටළු වෙනවා. මහජනතාව බනිනවා. අපිට ඔයිට වඩා බනින ඒවා තිබෙනවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කියද කියන්නේ සාධාරණ කරන්න. යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, සමහර දිනවල ඒ අයගේ ලොතරැයි 1700ක් වගේ ගණන් තමයි තිබෙන්නේ. ඒ ඒ අයගේ ආදායම . විකුණන පුද්ගලයාටත් යම්කිසි මුදලක් ගියාම ඒ අයට එම ආදායම නැහැලු. දවසට ආදායමක් එන්න ඒ විකුණන පුද්ගලයාටත් යම්කිසි මුදලක් දුන්නාම ඒ අයට ආදායමක් නැහැලු. විශේෂයෙන්ම නගර සභාවේ අළුත් බස්නැවතුම්පොළ ඉදිකරන විට එය අතනට තල්ලු කරන විට මුල්ලට දැම්මාම ඒ අයට අසාධාරණයක් වෙන බව තමයි ඒ අය කියන්නේ. එමනිසා එය සංශෝධනය විය යුතුයි. සාධාරණව බලා නගර සභාවටත් අහිතක් නොවන විදියට අපිටත් යම්කිසි ආදායමක් තබාගෙන එය සංශෝධනය කරන්න. ඔකතමයි එකඟතාවය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවෙන් සම්මත කළේ රු.10000/= ක් පමණයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.රු.15000/= කළා . ඊටපසු රු.10000/= කළා.අඩු කරන්න කියනවා. අපි ගරු මන්ත්‍රිවරු වශයෙන් මෙතැන ගන්න තීන්දු එක එක්කෙනා මෙතැනට ලිපි එව්වාම එක එක්කෙනාට ඕන විදියට වෙනස් කළාම ගරු සභාව හැල්ලුවට ලක් වෙනවා. 15000/= කළා . ඊටපසු රු.10000/=. එහෙමනම් ක්‍රියාත්මක කරන්න ටෙන්ඩර් කරන්න.ටෙන්ඩර් කර දෙන්න. ලොතරැයි කුඩු ටික ටෙන්ඩර් කරන්න. අපේ පිටින් තියන්න එපා ගන්න ගන්න කියා මේ විදියට. ඔය ලියුම් එවන පුද්ගලයන්ට දිනකට රු.500 ක් ගෙන යන්න පුළුවන් නම් ලොතරැයි කුඩුවෙන්. මෙතැනට තව එනවා දෙන්න බැහැ කියා. එමනිසා මා මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මගේ මතය එහෙම දෙන්න බැරි නම් ටෙන්ඩර් කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් පසුගිය දිනවල ඒ ගැන කතා කරන විට කතිකාවක් ඇති වුණා දිනකට එක කුඩුවකින් රු.500/= ගණනේ අරගෙන යනවා කියා. ඔබතුමා ඒ ලොතරැයි අලෙවි කරන ඒ නියෝජිත මහත්මයන් ගෙන්වා සාකච්ජා කර ඔබතුමාලා දිනකට කියක් දෙනවාද ? දිනකට කිය ගණනේ දෙනවාද කියා සාකච්ඡා කර ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ටෙන්ඩර් කර හරි ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මා මේ ප්‍රශ්නය කතා කරන්න නැගී හිටියේ ඒ මගේ කොට්ඨාශයේ හිටපු ගරු සහෝදර මන්ත්‍රීවරයෙකුගේ ලිපියක් සම්බන්ධව කතා කරන්න යි. ඇත්ත වශයෙන්ම අපි යම්කිසි තීරණයකට ආවා තමයි. නමුත් ඔබතුමා පසුගිය දිනවල ඒ ගනු ලැබූ තීරණ ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසී වෙළඳ සංගමය ගිහින් සාකච්ඡා කර අපි දැම්මට නියම කරනු ලැබූ මුදල වෙනස් කරන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එමනිසා මේ වගේ අපේ අම්බලන්ගොඩ පුරවැසියෙක් හිටපු මහජන නියෝජිතයෙක් කරනු ලැබූ ඉල්ලීම පිළිබඳව සාවධානය යොමු කරලා එම ප්‍රශ්නය ගැන මානුෂිකව අවධානය යොමු නොකළහොත් එය මා හිතනා විදියට ලොකු අඩුවකි. අනිත් එක ටෙන්ඩර් කරන්න කියා ගරු උප සභාපතිතුමා හා අනිත් ගරු මන්ත්‍රීවරුත් කිහිප දෙනෙක් කියනවා. මා හිතන විදියට වැඩි දෙනෙක් එයට විරුද්ධයි. එහෙම ටෙන්ඩර් කළොත් අම්බලන්ගොඩ නගරයේ මහජන නියෝජිතයෝ අපි. අපි ප්‍රධාන තැන දිය යුත්තේ සැම ප්‍රශ්නයකදිම අම්බලන්ගොඩ නගරයට. මේ පිට කෙනෙක් මේ ටෙන්ඩර් ලබා ගතහොත් මේ කුටි සඳහා මේ ලොතරැයි කුටිවල රැකියාව කරන්න නිරත වුවහොත් අපේ අම්බලන්ගොඩ ජනතාවට අපි කරන ලොකු අඩුවක් වෙනවා. එමනිසා ඔබතුමා දැඩි ඒකාධිපති විදියට කටයුතු කරන්නේ නැතිව මොනවාහරි වැරැද්දක් නොවෙන්න පුළුවන් අපි එම කෙනාගේ ඉල්ලීම කෙරෙහි සාවදානම අවධානය යොමු කරන්න . අපි සාකච්ඡා කර ඔබතුමා සමඟ එහෙම නැතිනම් එම ලොතරැයි අලෙවි කරන අය ගෙන්වා තීරණයකට එන්න.

- **පෙරවරු 10.10 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මේ ගැන ගරු උප සභාපතිතුමාගෙනුත් මා ඉල්ලීමක් කරනවා. මේ ප්‍රශ්නය කෙරෙහි අපි පොඩ්ඩක් නම්‍යශීලි වෙලා කටයුතු කරන මෙන් ඉල්ලීම කරනවා. මීට කලිනුත් ඔබතුමා දන්නවා ඒ ලොතරැයි කුටි සම්බන්ධව ගරු සභාව ගත් තීන්දුව පිළිබඳ මාගේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස ඉල්ලීම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් . සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ලොතරැයි සම්බන්ධ ප්‍රශ්නයක් අද ඇවිත් තිබෙන්නේ. සෑහෙන කාලයක් ගත කර තිබෙනවා එයට.ජනතා විමුක්ති පෙරමුණේ එම අදහස මෙකයි. ලොතරැයි කියන්නේ සූදුවක්. අපි එය නිතිග කරලා ලොතරැයි කුඩු හරහා දැන් මේවා අපි ක්‍රියාත්මක කරගෙන යනවා.ජනතාව එවාට පොර කනවා, බදු ගෙවනවා. අපි බදු නියම කරනවා . අපි බදු අඩු කරන්න කියනවා. මෙම ප්‍රශ්නය මා දකින්නේ වෙනස් විදියකට. එකයි මා මේ අදහස ඉදිරිපත්

කරන්නේ. මිනිසුන් මිනිසුන්ට තිබෙන ප්‍රශ්න විසඳා ගන්න ලොතරැයි ගන්නවා.මිනිසුන්ට ප්‍රශ්න නැතිනම් මිනිසුන් ලොතරැයි ගන්නේ නැහැ.මිනිසුන් දහසක් ප්‍රශ්න වලින් පීඩිත වෙලා තමයි අද ඉන්නේ. ඉතිං මේ ජනතාවගේ ප්‍රශ්න ප්‍රයෝජනයට ගෙන විශේෂයෙන්ම ආර්ථික ප්‍රශ්න ප්‍රයෝජනයට ගෙන අපි ලොතරැයි කුඩු අරගෙන මිනිසුන්ට මුදල් හම්බ කරන්න මාර්ගය සකසා දෙනවා. අපි ඉන් බද්දක් අය කරනවා. මෙය ඇත්තටම නගර සභාවක් හැටියට රටක් හැටියට අපි කනගාටු විය යුතු තත්ත්වයකි.අපේ පක්ෂයේ දැක්ම මෙන්න මෙකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සාකච්ඡා කරනු ලැබූ ගරු ලලිත් ධම්මික මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට එම මළ ගෙදර මාත් හිටියා. එවැනි දේ සත්‍යයක්. එවැනි දෙයක් ගරු මන්ත්‍රීවරයෙකුට විය යුතු නැහැ කියන මතයේ මා සිටිනවා. එය සභාවට ඇතිවන ප්‍රශ්නයක්. මෙය පුද්ගලික අරාවුලක් නෙමේ.නගර සභාවේ අදහස් උදහස් ප්‍රකාශ කරනවා. ඒ සම්බන්ධව තමයි මේ තත්ත්වය ඇති වුණේ. ඉදිරියට එවැනි තත්ත්වයන් ඇති වෙන්න හොඳ නැහැ . මොකද වෙන ආයතනයක වුණා නම් ඉතා විශාල ප්‍රශ්න ඇති වෙන්න තිබුණා. එමනිසා මා පුද්ගලිකවත් මාගේ පෞද්ගලික කනගටුව ප්‍රකාශ කරනවා ගරු ධම්මික මන්ත්‍රීතුමාට. එවැනි තත්ත්වයන් මින් ඉදිරියට ඇති නොවන විදියට දැන් මේ කතා කරන කාරණය වුණත් ඉදිරියේදී ගරු සභාපති, ගරු උප සභාපතිතුමාට , ගරු මන්ත්‍රීවරුන්ට වුණත් ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අපි මෙතැන නැගී සිටින්නේ පොදු කටයුතු වෙනුවෙනි. පොදු මහජනතාව වෙනුවෙන් අපි වැඩ කරන්නේ. එතකොට පොදු මහජනතාවගේ අවශ්‍යතා අනුව කටයුතු කිරිමේදී අප හැම දෙනාටම ප්‍රශ්න වලට මුහුණ පාන්න සිද්ධ වෙනවා. එක් පුද්ගලයෙකු ලිපියක් එවූ පමණින් අප මේ සභාව කටයුතු කළ යුතු නැහැ. ලොතරැයි කුඩු 20ක් තිබුණොත් එම ලොතරැයි කුඩු 20න්ම ලිපි ආවොත් එම ලිපි 20ම මේ සභාවේ කතා කළ යුතු වෙනවා. ඉතිං ඒ අදහසක් විතරයි. මේ සභාවයි තීරණය කරන්න ඕනේ කෙලින් මොකක්ද මෙයට ගත යුතු ක්‍රියාමාර්ගය කියා. ඔබතුමාට ලිඛිතව උපදෙස් ලැබී තිබෙනවා ගරු ආණ්ඩුකාරතුමාගෙන් මේ සම්බන්ධව කටයුතු කිරිම සම්බන්ධව. ඒ අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු ආණ්ඩුකාරතුමාගෙන් මේ සම්බන්ධව උපදෙසක් ලැබී නැහැ. එදා ගරු ආණ්ඩුකාරතුමා අපට උපදෙස් දී තිබෙනවා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව කරන ලද තක්සේරු මුදල අත්මුදල ( Key Money ) නොසලකා කටයුතු කර ඇති බවට පිලිගැනිමක් කළා. එමනිසා ජුනි මස වෙනතුරු පරණ ගණනම අයකරන්න. ජුනි මස වෙන විට අත්මුදල ( Key Money ) සලකා මෙය කරනවා කියා දන්වා එවා තිබෙනවා. ලොතරැයි කුඩු සම්බන්ධව තින්දුවක් දී නැහැ. ඕන නම් අපට මෙහෙම කරන්න පුළුවන්. පවතින ගණනටම අයකරලා මෙකත් ඕන නම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට කියා කත්සේරු මුදල ගන්න පුළුවනි. එය නිත්‍යානුකුලයි. මේගොල්ලන් තක්සේරුවක් ගෙවා නැති නිසා මේ අයට ටිකක් වැඩි ගණනක් එනවා. එතෙක් මෙතෙක් අයකරන ලද මුදල්ම අයකරන්න. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මේ අයකළ යුතු මුදල තක්සේරු වාර්තාවක් ලබා ගෙන සභාවට ඉදිරිපත් කර තින්දු කරන්න.

**තීරණය-**

ලොතරැයි අලෙවි කුටි බදු මුදල් ඉහල නැංවීම යන මැයෙන් අම්බලන්ගොඩ , මානිමුල්ල පදිංචි කේ.එම්.හේමසිරි මහතා විසින් එවන ලද ලිපියට අනුව මෙතෙක් අයකරන ලද මුදලම අයකර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේන් මේ අයකළ යුතු මුදල පිළිබඳ තක්සේරු වාර්තාවක් ලබා ගෙන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.21 ගාස්තු රහිතව පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා බලපිටිය, වැල්ලබඩ, ජීවිත ආරක්ෂක පුහුණු පාසලේ අණදෙන නිලධාරී ඒච්.ඩී.එස්.එල්. අබේසේකර මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ජිවිත ආරක්ෂක පුහුණු පාසල , වැල්ලබඩ. බලපිටිය. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන බළපිටිය ජිවිත ආරක්ෂක පුහුණු පාසල මඟින් 2020.02.15 වන දින දෙවන වරට සැතපුම් 2ක මුහුදු පිහිණුම් තරඟයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර ක්‍රිඩක ක්‍රිඩිකාවන් දැනුවත් කිරීම සඳහා අම්බලන්ගොඩ නගර මධ්‍යයේ දැනුවත් කිරීමේ පුවරුවක් ගාස්තු රහිතව ප්‍රදර්ශනය කිරිම සඳහා අවශ්‍ය කටයුතු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. එය ගාස්තු රහිතව දැන්වීම් පුවරුවක් පළකිරිමට ඉල්ලා සිටිනවා. එය සභා අනුමැතියට යටත්ව ලබා දි තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් . ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළ ඉදිරිපිට තිබුනා දැන්වීම් පුවරු එල්ලීම සඳහා බෝඩ් එකක්. දැන් එය කැඩිලා ගිහින්. එය සවිකරන්න. දැන් විදුලි කණුවල තමයි දැන්වීම් පුවරු එල්ලා තිබෙන්නේ. එතැන ලබා දුන්නාම හරි ස්ථිර බෝඩ් එකක් ගසා. එතකොට නගරය අවලස්සන වෙන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අපි හදපුවා නෙමේ. මේ කවුරු හරි හදන ලද ඒවා. අපි සවිකරන්නම් එතැන.

**තීරණය -**

ගාස්තු රහිතව පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා බලපිටිය, වැල්ලබඩ, ජීවිත ආරක්ෂක පුහුණු පාසලේ අණදෙන නිලධාරී ඒච්.ඩී.එස්.එල්. අබේසේකර මහතා විසින් කරන ලද ඉල්ලිමට දැන්වීම් පුවරුවක් සභා අනුමැතියට යටත්ව නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ

අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.22 ගා/පී.ද එස්.කුලරත්න මහා විද්‍යාලයේ පැවැත්වූ ඩෙංගු මර්ධන ශ්‍රමදානය සඳහා සහයෝගය දැක්වීම වෙනුවෙන් ස්තූතිය පළකිරීමේ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගා/පී.ද එස්.කුලරත්න මහා විද්‍යාලයේ පැවැත්වූ ඩෙංගු මර්ධන ශ්‍රමදානය සඳහා සහයෝගය දැක්වීම වෙනුවෙන් ස්තූතිය පුද කර තිබෙනවා. මෙය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කර තිබෙනවා.

**තීරණය**

ගා/පී.ද එස්.කුලරත්න මහා විද්‍යාලයේ පැවැත්වූ ඩෙංගු මර්ධන ශ්‍රමදානය සඳහා සහයෝගය දැක්වීම වෙනුවෙන් ස්තූතිය පුද කිරිම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදි.

**03.23 අ.ම.කරුණාරත්න දෙටු පුරවැසි පියසේ යතුර ලබාගැනීමට අවසර ලබාගැනීම යන මැයෙන් සී/ර විලේගොඩ සණස සමිතිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සී/ර විලේගොඩ සණස සමිතිය. අ.ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසේ යතුර ලබා ගැනීමට අවසර ලබා ගැනීම. ඉහත සඳහන් සණස සමිතියේ මාසික මහා සභා රැස්වීම් සෑම මසකම අවසාන ඉරිදා ප.ව. 3.00 ට පැවැත්වේ. මේ සඳහා ඉඩ ප්‍රස්තාව සලසා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටි. වසර ගණනාවක් තිස්සේ රැස්වීම් කැදවීමට සලසා ඉඩ ප්‍රස්තාව සලසා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටි. වසර ගණනාවක් තිස්සේ රැස්වීම් කැඳවීමට ඉඩ ප්‍රස්තා ලබා දිම වෙනුවෙන් අපගේ ස්තූතිය හා ගෞරවය පුද කරනවා. මොවුන් ඉල්ලා සිටිනවා එම ස්ථානය ලබා දෙන්න කියා. කලිනුත් දිලා තිබෙනවා. එය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**තීරණය-**

සී/ර විලේගොඩ සණස සමිතියට මාසික සභා රැස්වීම් පැවැත්වීමට සෑම මසකම අවසාන ඉරිදා අ.ම.කරුණාරත්න දෙටු පුරවැසි පියසේ යතුර ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

01.ජනවාරි 26 02.පෙබරවාරි 23

03.මාර්තු 29 04.අප්‍රේල් 26

05.මැයි 31 06.ජුනි 28

07.ජූලි 26 08.අගෝස්තු 30

09.සැප්තැම්බර් 27 10.ඔක්තෝබර් 25

11.නොවැම්බර් 28 12.දෙසැම්බර් 27

**03.24 කාන්තා කමිටුව සඳහා සාමාජිකයන් පත්කරගැනීම යන මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

කාන්තා කමිටුව සඳහා සාමාජිකයන් පත්කරගැනීම. අම්බලන්ගොඩ නගර සභා කාන්තා කමිටු පිහිටුවීමට අදාල කමිටුවේ සාමාජිකයන් නම් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. මා අද දිනයේ නම්කරන්න ඉල්ලන්නේ නැහැ. ලබන සභාවේදි නම්කිරිමට ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රිවරු කල්පනා කර බලන්න කවුද කියා පත්කර ගන්නේ.

**තීරණය-**

කාන්තා කමිටුව සඳහා සාමාජිකයන් පත්කරගැනීම සම්බන්ධයෙන් සාමාජිකයන් නම්කිරිම ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.25 නොමිලයේ බැනරයක් ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ, ගොඩහේන පදිංචි ටී.ඩී.මහේෂ් ලසන්ත මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ටි.ඩී. මහේෂ් ලසන්ත, සභාපති බෝධි භාරකාර සමිතිය, ගොඩහේන, අම්බලන්ගොඩ. ඉහත සඳහන් අප සමිතියේ 2020.02.10 දින ගොඩහේන පුරාණ බෝධිය අසළ පවත්වනු ලබන කාව්‍ය බණ දේශනයක් මස්සැන්නේ විජිත ස්වාමින් වහනසේ විසින් පවත්වනු ලැබේ. ඒ සඳහා අඟල් 5*අගල් 4 ප්‍රමාණයේ බැනරයක් මහජනතාවට දැනගැනීමට සඳහා ප්‍රදර්ශනය කිරිමට අයකිරිමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ, ගොඩහේන, සභාපති බෝධි භාරකාර සමිතිය, ටි.ඩී. මහේෂ් ලසන්ත, මහතා විසින් 2020.02.10 දින ගොඩහේන පුරාණ බෝධිය අසළ පවත්වනු ලබන කාව්‍ය බණ දේශනය සම්බන්ධව අඟල් 5*අගල් 4 ප්‍රමාණයේ බැනරයක් නොමිලේ ප්‍රදර්ශනය කිරිම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.26 අම්බලන්ගොඩ සදහම් වෙසක් කලාපය 2020 විදුලි මල් ගස් සඳහා නගර සභාවේ මූල්‍ය අනුග්‍රහය ලබාගැනීම සම්බන්ධව අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. අම්බලන්ගොඩ සදහම් වෙසක් කලාපය 2020 විදුලි මල් ගස් සඳහා නගර සභාවේ මූල්‍ය අනුග්‍රහය ලබා ගැනිම සම්බන්ධව ටිකක් දිග ලියුමක් තිබෙනවා. මෙය හැමදාම කලින් දි තිබෙනවා. හිරේවත්ත බුද පිළිමය අසල සිට පටබැඳිමුල්ල වටරවුම දක්වා විදුලි මල් ගස් 120ක් සිටුවා අලෝකමත් කරන ලද අතර එම විදුලි ගස් 120ට අමතරව රන්දොඹේ සංඝරාජ පිරිවෙණ දක්වා ( පොලිසිය අසල ) නගරය අවසන්වන කිලෝ මිටරයක පමණ කොටස සඳහා විදුලි මල් ගස් අඩි 70ක් වන පරතරය ඇතිව ගස් 12 බැගින් දෙපස ගස් 24 ක් සිටුවිමටත් මුළු ගස් 124ක් අවශ්‍ය වන බවත් , එක් විදුලි මල්ගසක් සඳහා ( වැල් 06 සමඟ) රු.1750/= ක බැගින් ( දින 05 ) ක් සඳහා රු.252,000/= ක් ද විදුලි සමාගමෙන් මිටර් යොදා (සිංගල් ප්‍රේස් ) 06 ක් ලබා ගැනිම සඳහා සිංගල් ප්‍රේස් එකක් සඳහා රු.31,000/= බැගින් සිංගල් ප්‍රේස් 6ක් සඳහා රු.1,86,000/= ක මුදලක් සමගින් සම්පූර්ණ මුදල වන රු 438,000/= ක මුදලක් දළ වශයෙන් වැයවෙනවා කියා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය මෙහෙන් ටෙන්ඩර් කර හරි ලබා දෙන්න. එතකොට ගැටළුවක් නැහැ. නැතිනම් මෙය ගැටළුවක් වෙනවා. මෙහෙන් මිළ ගණන් කැඳවා අඩුම මිළට ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ටෙන්ඩර් කර ගියත් අනිවාර්යෙන්ම මේ මුදලම යනවා. එතකොට විදුලිය ගැනීම ඒ අය කරන්න ඕන. මෙය ටෙන්ඩර් කර ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පසුගිය කාලවල මෙම සැරසිලි සිදු කරනු ලැබුවේ පටබැඳිමුල්ල වටරවුම දක්වා පමණි. ඔබතුමාට මා ඉල්ලිමක් කළා. පොලිසිය ළඟට වනතුරු මෙය සරසන්න කියා. තරුණ බෞද්ධ සංගමයේ ලේකම්තුමාට හා ඔබතුමාට මේ සම්බන්ධව ස්තුතිය පුද කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ සදහම් වෙසක් කලාපය 2020 විදුලි මල් ගස් සඳහා නගර සභාවේ මූල්‍ය අනුග්‍රහය ලබාගැනීම සම්බන්ධව අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් එවා ඇති ලිපියට අනුව එය ටෙන්ඩර් කර ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.27 පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානය සඳහා වානේ අල්මාරියක් ඉල්ලා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී ඩී.එස්.ඊ.ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පවුල් සෞඛ්‍ය නිලධාරි වානේ අල්මාරියක් ඉල්ලා තිබෙනවා. එය ලබා දෙන්න සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී ඩී.එස්.ඊ.ගමගේ මහත්මිය විසින් වානේ අල්මාරියක් ඉල්ලා ඇති ලිපියට අනුව වානේ අල්මාරියක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.28 SP-SL-3731 ට්‍රැක්ටරයට ට්‍රේලරය මිලදී ගැනීමට අදාල වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

SP- SL-3731 සඳහා ට්‍රැක්ටර් ට්‍රෙලර් මිලදි ගැනීමට අදාළව 2019/10/26 දින පැවති ටෙන්ඩර් කමිටු තීරණය පරිදි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු සමඟ දුරකථනයෙන් සාකච්ඡා කර ලබා ගත් උපදෙස් පරිදි පහත තීරණයට එළඹීම සුදුසු වේ කියා දැනුම් දි ඇත. ට්‍රැක්ටර් ට්‍රේලරය මිලදි ගැනීම සම්බන්ධව මේ වන විට දීර්ඝ කාලයක් ගත වී ඇත. මේ වන විට එම අත් ට්‍රැක්ටර් සඳහා ට්‍රේලරය නොමැතිව කසළ ප්‍රවාහනය කිරිම දැඩි අපහසුතාවයකට පත්ව ඇත. එක් වරක ටෙන්ඩර් 03ක් ඉදිරිපත් වූ අතර ඒවා ඉතා මිල අධික වීම නිසා ප්‍රතික්ෂේප විය. මේ අවස්ථාවේ අප විසින් ඉදිරිපත් කළ පිරිවිතර වලට අනුව ලැබී ඇත්තේ එක් මිල ගණනක් පමණි. එම මිල ගණන ඉදිරිපත් කර ඇත්තේ ට්‍රැක්ටර් සඳහා ලංකාවේ පිළිගත් ආයතනයක් පමණි. ඒ අනුව නගර සභාවේ සෞඛ්‍ය අංශයේ කසල ප්‍රශ්නයට ට්‍රැක්ටරය දැඩිව බලපැම් කර ඇත. ඉහත කරුණු වලට අදාලව ඉදිරිපත් වි ඇති එකම මිල ගණන සඳහා ඉතා ඉක්මනින්ම ට්‍රැක්ටර් ට්‍රේලරය මිලදි ගැනිම සුදුසු බව තීරණය කිරිම වැදගත් බව වාර්තා කර ඇත.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කවුද මේ වාර්තාව එවා තිබෙන්නේ. මෙම වාර්තාව අපේ තාක්ෂණසේවා නිලධාරින් ලබා දි තිබෙන්නේ. දැන් වෙලා තිබෙන්නේ කෙරම්ණිය පින්නදූව ට්‍රැක්ටරය මාසයකින් දෙන්නම් කියා තමයි මෙය දැමුවේ

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තව සති දෙකකින් දෙන්නම් කියා තිබෙනවා. මෙය රු.195000/= ක් පමණයි.අපි මෙය පිළිගන්න. අපි මේ ප්‍රශ්නය විසඳන්න ඕන.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් අපි කලිනුත් ඔයවගේ එකක් පිළි ගත්තා. අත්ට්‍රැක්ටර් ට්‍රෙලර් එක. එ අය මාසයකින් ලබා දෙනවා කිවුවා. අදට මාස කියක් වෙනවාද කියන්න. දැන් ට්‍රැක්ටර් ට්‍රෙලරයයි දිලා. අනික මැෂින් එකත් එක්ක ගිහින් දුන්නේ. අත්ට්‍රැක්ටරයේ මැෂින් එකත් එක්ක තමයි ගිහින් දුන්නේ. මොකද මැෂින් එකත් හදන්න ඕන කිවුවා. ඔයවගේ එක ටෙන්ඩරයක් ඇවිත් ගන්න තැනක් නැති නිසා තමයි දුන්නේ. අදට මාස කියක් වෙනවාද දිලා. හැමදාම සතියකින් දෙනවා. මමත් දැන් සතියකින් විතර කතා කළා. හැමදාම කතා කරනවා. දැන් මාසයකින් දෙනවා කිවුවා. දැන් මාසයකුයි සුමාන් දෙකක් වෙනවා. එහෙම දෙනවා නම් අදාළ ආයතනයත් සමඟ ගිවිසුමක් අත්සන් කරන්න

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙම කාරණයට අදාලව නෙමේද කතා කරන්නේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම කාරණාවට අදාළවයි කතා කරන්නේ. මෙයත් අරවගේ වෙන්නේ නැතිව කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ. මේක පිළිගන්න කියා කියන්නේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

පිළිගන්නම්. ටෙන්ඩර් ලබා දෙන විට අදාළ ආයතනයත් සමඟ ගිවිසුම් ගතවෙලා ලබා දෙන්න. හැම ප්‍රමාදවන දිනයකටම දඩ මුදලක් අයකර ගන්නා විදියට. මොකද ඒ විදියට යන්න ඕන. මා ඔය කිසිම දෙයක් අහන්නේ නැහැ. දැන් මාස දෙකකට වැඩියි තවම නැහැ ට්‍රැක්ටරයි ට්‍රේලරයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙය සති දෙකක් ඇතුළත සපයන්න කියන්න. නැතිනම් ට්‍රෙලරය අහෝසි කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එක ටෙන්ඩරයක් පිළි ගන්න කියා කවුද කියා තිබෙන්නේ.

**තීරණය**

SP-SL-3731 ට්‍රැක්ටරයට ට්‍රේලරය මිලදී ගැනීමට අදාල වාර්තාව සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ටෙන්ඩර් ලබා දෙන විට අදාළ ආයතන සමඟ ගිවිසුම් ගතවි, ප්‍රමාදවන දිනයකට දඩ මුදලක් අය කර ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.29 නගර සභාවට ගෙවිය යුතු 1% ක ගාස්තුව නිදහස් කරදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, පොල්වත්ත, පී.එච්.සමන්ත රුවන් මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අදාල වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නගර සභාවට ගෙවිය යුතු 1% ක ගාස්තු නිදහස් කිරිම සම්බන්ධ ලිපිය හා බැඳේ. අම්බලන්ගොඩ, පොල්වත්ත, පී.එච්.සමන්ත රුවන් මහතා විසින් 1% ගාස්තු නිදහස් කිරිමට ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව 1% ගාස්තු මුදල රු.27,960කි. කැබලි සම්බන්ධව අනුබෙදිමකි. එහිදි ආදායම් පරික්ෂක වාර්තාව අනුව මෙය ඥාතින් අතර බෙදිමක් නිසා එම මුදල නිදහස් කිරිමට යෝජනා කර තිබෙනවා. මේ නම්වලට පමණයි. ඒ නම්වලට නොමැතිව පැමිණෙනවා නම් එම මුදල අයකර ගන්න තීරණය කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ, පොල්වත්ත, පී.එච්.සමන්ත රුවන් මහතා විසින් 1% ගාස්තු නිදහස් කර ඇති ඉල්ලිමට අනුව එම 1% ගාස්තු මුදල වන රු.27960/= ක මුදලක් නිදහස් කිරිම සුදුසු බවටත් , එකි නම්වලට නොමැතිව පැමිණෙනවා නම් ( විකිණිමක් සිදුවෙනවානම්) එම ගාස්තු මුදල අයකර ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.30 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය බදු දීම් කාලය මාස 3කින් දිර්ඝ කිරිම සම්බන්ධව ලිපිගොණුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ පොදු වැසිකිළිය බදු දිම මාස 3කින් දිර්ඝ කිරිම සුදුසු බවට කියා තිබෙනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඇයි එහෙම දාන්නේ. මාස 2 කින්ද 3කින් දිර්ඝ කරන්න කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බස්නැවතුම්පොළේ පොදු වැසිකිළිය සඳහා අද ඇස්තමේන්තුවක් තිබෙනවා. එය අද සම්මත වෙන්නේ. ඒ අනුව තමයි අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන්නේ.දැනට තිබෙන

එක්කෙනාටම මාස තුනක් දෙන්න කියා තිබෙනවා. ඊට පසු ටෙන්ඩර් කරන්න. අලුත්වැඩියා කර ටෙන්ඩර් කරන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ පොදු වැසිකළිය බදු දීම මාස 3කින් දීර්ඝ කිරීම සුදුසු බවටත් , මේ සඳහා සකසා ඇති ඇස්තමේන්තු අනුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පසු ටෙන්ඩර්කර ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.31 අම්බලන්ගොඩ,දළුක්කන්ද , 04 වන පටුමග, තැලිගල කන්ද ඉඩමේ පදිංචි කේ.ඩබ්.ජයන්ත මහතා වෙත ඔප්පුව ලබාදීම සම්බන්ධ ලිපිය සහ නගර සභාව සතු ඉඩම් සඳහා ඔප්පු ලබාදීමේ ලිපිගොණුව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ,දළුක්කන්ද , 04 වන පටුමග, තැලිගල කන්ද ඉඩමේ පදිංචි කේ.ඩබ්.ජයන්ත මහතා වෙත ඔප්පු ලබා දීමට තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව සිදු කර ඇත. ඒ අනුව කැබලි අංක 03 තක්සේරු වටිනාකම රු.327,000/= කි. නගර සභාවට ගෙවා තිබෙනවා. හැබැයි මෙහෙ දෙයකුත් තිබෙනවා. එය ලබා දී තිබෙන්නේ 2019.12.31 දිනට පමණයි.තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ගිය වසරේ මේ සඳහා තක්සේරුව ලබා දුන්නේ ගියවසරේ 12.31 දිනට කලින් ගෙවා නිම කළ යුතු බවයි.දැන් අලුතින් තක්සේරුව වෙනස් වෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ආසා මෙය ඉදිරිපත් කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ,දළුක්කන්ද , 04 වන පටුමග, තැලිගල කන්ද ඉඩමේ පදිංචි කේ.ඩබ්.ජයන්ත මහතා වෙත ඔප්පු ලබා දීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහු විසින් රු327,000/= ක මුදලක් ගෙවා ඇති අතර නැවත තක්සේරුවක් (2020) ලබාගෙන එය නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.32 හල්වතුර කසල අංගනයට RYDALL OE නමැති දුර්ගන්ධ නාශක එන්සයිමය ඉසීම සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හල්වතුර කසල අංගනයට RYDALL OE නමැති දුර්ගන්ධ නාශක එන්සයිමය ඉසීම සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීමට . දැනට අපි මෙම දුර්ගන්ධය නැතිවෙන්න එන්සයිමයක් ගහනවා. එම

එන්සයිමය ගැසීමට ලොකු මැෂින් එකක් ඕන. සාමාන්‍යයෙන් එය අඩි සියයක විතට දුරකට විදින්න පුළුවන්. එය ලබා ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මේ සඳහා මිළ ගණන් කැදෙව්වාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. මුලින් ගන්න අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කසළ යවන්න බලාපොරෝත්තු වෙනවා බලපිටියට. එතකොට තව දුරටත් ඔය කසළ දාන්නේ නැහැ. ඔය තියෙන කසළ ටික තමයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. අපි ගරු මන්ත්‍රීතුමා බලපිටියට දැමීම පිළිබඳ තවම තින්දුවක් ඇවිත් නැහැ. අපි සභාවෙන් අනුමැතිය ඉල්ලා ගත්තේ යම් විදයකින් අපේ සභාවේ කසළ අංගණයේ යම්කිසි ගැටළු ඇතිවෙනවා. හිටපු ගමන් අපට ගංවතුරක් එනවා. එතකොට අපට කසළ අදින්න බැරි වෙනවා.එතකොට අපි සභාවේ අනුමත කර තිබෙනවා නම් බලපිටියට දෙන්න කියා අපිට එතැනට ගිහින් තාන්න පුළුවන්. අන්න ඒ අනුමැතිය තමයි ගන්නේ. අපිත් කවදා හරි බලපිටියේ හදලා තිබෙන විදියේ එකක් අපිත් මෙතැන හදන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ අවශ්‍යතාවය මත කරන්න

**තීරණය-**

හල්වතුර කසල අංගනයට RYDALL OE නමැති දුර්ගන්ධ නාශක එන්සයිමය ඉසීම සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

04. යථා පරිදි කල් දී ප්‍රශ්න නැත

05. **යථා පරිදි කල් දී යෝජනා**

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඇතුළත ප්‍රචාරක රථයක් නවතා ප්‍රචාරක කටයුතු සිදු කළ අතර එය නැවැත්වීමට ආරක්ෂක අංශය කටයුතු නොකිරීම හේතුවෙන් රු.5000/- ක දඩ මුදලක් ආරක්ෂක අංශයෙන් අය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙහි සඳහන් 05.01.01 යෝජනාව මා ඉවත් කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඇතුළත ප්‍රචාරක රථයක් නවතා ප්‍රචාරක කටයුතු සිදු කළ අතර එය නැවැත්වීමට ආරක්ෂක අංශය කටයුතු නොකිරීම හේතුවෙන් රු.5000/- ක දඩ මුදලක් ආරක්ෂක අංශයෙන් අය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉවත් කරන ලදී.

**05.01.02 පොල්වත්ත පුස්තකාලයට වොෂ් බේසින් ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත පුස්තකාලයට වොෂ් බේසින් ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

පොල්වත්ත පුස්තකාලයට වොෂ් බේසින් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 රණසූරිය මාවතෙන් අතුරු පාර (නිසංසලා මහත්මියගේ නිවස අසල) රූඳවුම් බැමි ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

රණසූරිය මාවතෙන් අතුරු පාර (නිසංසලා මහත්මියගේ නිවස අසල) රූඳවුම් බැමි ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

රණසූරිය මාවතෙන් අතුරු පාර (නිසංසලා මහත්මියගේ නිවස අසල) රැඳවුම් බැමි ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 05.01.04 ඕකන්ද පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඕකන්ද පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

ඕකන්ද පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 05.01.05 කෙරමිණිය පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කෙරමිණිය පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

කෙරමිණිය පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 05.01.06 හෙප්පුමුල්ල ප්‍රජාශාලා භූමියේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීමට පෙර පස් පිරවීම සුදුසු බවට කරන ලද යෝජනාව

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හෙප්පුමුල්ල ප්‍රජාශාලා භූමියේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීමට පෙර පස් පිරවීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

හෙප්පුමුල්ල ප්‍රජාශාලා භූමියේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීමට පෙර පස් පිරවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.07 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ කාණු පද්ධතිය ආවරණ පුවරු සැකසීම සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ කාණු පද්ධතිය ආවරණ පුවරු සැකසීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ කාණු පද්ධතිය ආවරණ පුවරු සැකසීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.08 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ ඇවිදින මං තීරුව සැකසීම සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ ඇවිදින මං තීරුව සැකසීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ ඇවිදින මං තීරුව සැකසීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.09 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම (අදියර 01) සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම (අදියර 01) සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම (අදියර 01) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.10 හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.11 මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.12 මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ බැම්ම ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ බැම්ම ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ බැම්ම ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02 ගරු නගර සභා මන්ත්රි ඇස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පිහිටි ඉඩමක අනුබෙදුම අනුමත කිරීමට ගාල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදුවී ඇති බවත් එම කාර්යය පෙර සිදුවූ පරිදි නගර සභාවට පවරා ගනීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පිහිටි ඉඩමක අනුබෙදුම අනුමත කිරීමට ගාල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදුවී ඇති බවත් එම කාර්යය පෙර සිදුවූ පරිදි නගර සභාවට පවරා ගනීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ කියන එක දැනටමත් අතිගරු ජනාධිපතිතුමා විසින් නියෝගය ලබා දී චක්‍රලේඛය පමණයි ලබා දීමට තිබෙන්නේ. එතුමා නියෝගය දිලා තිබෙනවා. සම්පූර්ණ පවරාගත් බලය නැවත සභා වලට පවරන්න කියා. දැනට චක්‍ර ලේඛය නිකුත් කිරීමේ කාලය තමයි තිබෙන්නේ. දැන් වැඩේ කෙරිලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දැන ගන්න ලැබීම සතුටුයි. මොකද අපේ අදහසත් ගරු අගමැතිතුමාගේ අදහසත් සමපාත වුණා අවස්ථාවක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ විෂයභාර අගමැතිතුමාට. අගමැතිතුමා තමයි තීන්දු කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අගමැතිතුමා හෝ වේවා කවුරු හෝ වේවා. පවතින රජයෙන් මෙය ක්‍රියාත්මක කරන්න. මට විනාඩියක් දෙන්න. මම අනුබෙදුමක් අනුමත කරගන්න බිල්රහිතව රු.20000/=ක මුදලක් අත්පිට ලබා දී තිබෙනවා.මාගේ ඉඩම අනුමත කර ගන්න. මා කියන්නේ මා ඕනෑම උසාවියකට හෝ රහස් පොලිසියකට හෝ එනන් ලැහැස්තියි. එය ලබා දුන් අයගේ දුරකථන අංක පවා මාගේ ළඟ තිබෙනවා.හරි මා යන්න ලැහැස්තියි. පරීක්ෂණයක් කරන්න. මෙහෙම අසාධාරණ ආයතනයක් තමයි නාගරික සංවර්ධන අධිකාරිය කියන්නේ. හරි සතුටුයි. මේ කාරණය ක්‍රියාත්මක කරන්න. මට මේ ටික කියා ගන්න උවමනා වෙලා තිබුණේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හොඳ යෝජනාවක් මෙය. හැබැයි මේ වන විට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මට මතකයි ගරු සභාපතිතුමාත් මාත් වර්තමාන අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීමකට සහභාගි වු අවස්ථාවේ ඔය සම්බන්ධව ඉදිරිපත් කළා. එතකොට එතුමා අතිගරු ජනාධිපති වෙලා නැහැ. අපි මෙය ඉදිරිපත් කළාම එතුමා හිටපු ලේකම් විදියට අමාත්‍යාංශයේ එතුමාගේ යෝජනාවක් තිබුණා. ගරු සභාපතිතුමාට මතක ඇති . එතුමා කිවුවේ මේ නාගරික සංවර්ධන අධිකාරියේ එන නිලධාරියාත් හරියට නවත්වන්න ඕන කිවුවා. එම නිලධාරියාත් සභාවට අනුයුක්ත කරන්න ඕන කිවුවා. එදා ඒ වගේ ප්‍රකාශයක් කළා. මෙය ඉතාම විශාලම ගැටළු සහගත තත්ත්වයක් කිවුවා. එන නිළදාරියාට ගමන් වියදම් ආදි සියළුම දේවල් දෙන්න ඕන කිවුවා. මෙය එතුමාගේ කලින් සිටම තිබුණා මෙය ගෙන එමට. ඔබතුමා සමඟ මා සියයට

දෙසියක් එකහයි. නාගරික සංවර්ධන අධිකාරිය කියන්නේ ඉතාම දූෂිත ස්ථානයකි. හේතුව තල්ගස්ගෙඩ ප්‍රදේශයේ තිබෙනවා. ගරු සභාපතිතුමා හොඳටම දන්නවා තල්ගස්ගොඩ ඉඩමක් වෙන්දේසි කළා. එතකොට අපි සභාවට බලතල තිබුණේ. එම ඉඩමට පාරවල් හදා තිබුණේ නැහැ. ජලය ලබා දී තිබුණේ නැහැ. ගරු සභාපතිතුමාත් ගියා බලන්න. දළුක්කන්ද පන්සල ඉදිරිපිටින් උඩට යන්න තිබෙන පාර. අදටත් එම පාරේ යන්න බැහැ. පාරේ තිබෙනවා කාණු. මීට කලිනුත් මා මේ සභාවට කිවුවා. මෙය ඒ අහිංසක ජනතාවගෙන් රු.25000/= ක මුදලක් ගෙන අනුමත කළා. අද ඒ ජනතාවට පාරේ යන්නත් බැහැ. පාරේ එතරම් කාණු හැරිලා.ඔබතුමාට කියන්නේ දළුක්කන්දේ පන්සල ළඟ ඡන්ද මධ්‍යාස්ථානය අසළ උඩට යන්න තිබෙන පාර. දැන් මෑතකදි අපේ ගරු සරත් මන්ත්‍රීතුමාගේ මෙහා පැත්තේ ඉඩම අක්කරයක් කැබලි කළා. අඩි අටක පාර තිබෙන්නේ. මෙය දැම්මා සභාවට. දෙපාරක් ප්‍රතික්ෂේප වුණා. මේ සභාවෙන්. නමුත් මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරියෙන් එය අනුමත කරලා. අන්න ඒ වගේ ගැටළු තිබෙන්නේ. මේ වගේ සංවර්ධනය අපි කරන්න ඕන. සභාවෙන්. මා අර කලින් කියපු පාර මේ වනකොට හදන්න බැහැ ලක්ෂ 25ක් වත් නැතිව. එතකොට මෙවගේ ජනතාව පදිංචි වෙනවා. අපි ඕන හදන්න. මා දන්නා තරමට මේ අය මුදල් ගෙන තිබෙනවා. මා එම දිවුරුම් ප්‍රකාශයට අත්සන් කළේ.මා ඒ අයගෙන් ඇහුවා මොකක්ද මේ සිද්ධිය කියා. එ අයට කියා තිබෙනවා . මෙහි කාණුවක් තිබෙනවා කියා මිනින්දොරුවෙකුට කියා අන්දාගෙන එන්න කියා. කාණුවේ පාර හදා තිබෙනවා කියා මිනින්දෝරුවෙකුට කියා අන්දා ගෙන එන්න.එතකොට මේ අයගේ තිබෙනවා නගර නිර්මාණ ශිල්පි කියා තනතුරක්. අන්න ඒ පුද්ගලයා තමයි මේ අත්සන ගහන්න මේ මුදල් ලබා ගන්නේ. නමුත් කිසිම ලදුපතක් දෙන්නේ නැහැ. මා එය ඇසුවාම කිවුවා ඒ අයට අයිතියක් තිබෙනවාලු එය ගන්න. එතකොට ගරු සභාපතිතුමනි , කොච්චර කැතද බලන්න. මේ සභාවට එන මුදල්. සභාවෙන් නගරයේ සිටින ජනතාවට වැඩක් කරන්න තිබෙන මුදල්. නිකං ලාච්චුවට දමා ගන්නවා. මා දන්න තරමට ලාච්චුවට දමන්න කියා තමයි කියන්නේ. මා දන්න තරමට . මා දන්නේ නැහැ අපේ ගරු මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතාට මොනවා වුනාද කියා. එමනිසා මේ කටයුත්ත ගැන අපි අතිගරු ජනාධිපතිතුමාට හා ගරු අගමැතිතුමාට ස්තුතිවන්න වෙනවා.මේ බලතල නැවත වරක් මේ සභාවලට පවරා දීම සම්බන්ධව. ඔබතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත් හොඳ යෝජනවක්. මේ වනවිට එය ඉෂ්ඨ වුණත් ඔබතුමා එය ඉදිරිපත් කිරිම ගැන අපේ ස්තුතිය පුද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙවැනි යෝජනාවක් පිලිබඳ අපි කතා කරන්න ඕන. දැන් මේවගේ ගරු මන්ත්‍රීවරුත් වැරදියි. එතුමා ගෙනැල්ලත් මේ වගේ යම් යම් කාරණා බැලුවාම. මුදල් ගත්තා කියා. නිත්‍යානුකූලව දඩුවම් දෙන්න ඕන. නැතිනම් මේවා හදන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමන් මේ සියල්ල අවබෝධ කරගෙන මේ වැඩකටයුතු කිරිම ගැන අපි එතුමන්ට ස්තුතිය පුද කරනවා මේ සභාවේ. මොකද නගර සභාවේ තිබෙන බලය කාටවත් දිලා . මෙය ගත්තේ මෙගා පොලිස් කියන වැඩ සටහන ඇති කළාට පසු. මා හිතන්නේ මෙය පණතකින් තමා දි තිබෙන්නේ. ඒ තුළ කටයුතු කරන කොට නිත්‍යානුකූල වන විදියට කටයුතු කරයි. මා හිතන්නේ අතිගරු ජනාධිපතිතුමා මෙය කරන්න යන නිසා. බලන්න අම්බලන්ගොඩ නගරයේ ගොඩනැගිලි බැලුවාම. පසුගිය වකවානුවේ හැදුන. අපෙන් ඇසුවාම අපට උත්තර දෙන්න බැහැ. ගරු

මන්ත්‍රිවරු ඉන්නවා . ගරු සභාපතිතුමා අම්බලන්ගොඩ නගරයේ ගොඩනැඟිලි ඉදිවෙන ආකාරය බැලුවාම පුදුමයි. මහල් 4 ,5 යි. වාහන නතර කිරීමේ අංගන නැහැ. පාරේ සිට තිබිය යුතු ප්‍රමාණය නැහැ. කවුරු ඉදිකළත් . එමනිසා අපි කියන්නේ නගර සභාවට තමයි දෝෂාරෝපණය වෙන්නේ.හිතාගෙන ඉන්නේ නගර සභාවෙන් මෙවාට අනුමැතිය දෙන්නේ. යම් යම් ක්‍රමවේද තුල නාගරික සංවර්ධන අධිකාරිය තුළ කටයුතු කරන්න ඇති. අපි දන්නේ නැහැ. අපේ ගරු නගර සභා මන්ත්‍රි සරත් මහතාගෙන් මුදල් ගත්තා නම් ඒ සම්බන්ධව කටයුතු කිරීමට ගරු ආණ්ඩුකාරතුමාට දැනුම් දෙන්න කියා ඉල්ලා සිටිනවා. මොකද එහෙ ගත්තානම්. අපි දන්නේ නැහැ. පරීක්ෂණයක් කරලා ඒවා නිර්දේශ වෙන්න ඕන. කවුරු නිලධාරින් කලත් වරද වරදමයි. අපි දකින්න ඕන ඒ විදියට. නැතිනම් මෙය හදන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය ඒ අනුව වැඩ කිරීම. ඒ සංවර්ධනය කරා යන්න බැහැ. මේ හොරකම වංචාව පිටු දකින්න ඕන නිසා තමයි එතුමා ඒ තීන්දු තීරණ ගන්නේ. ඒ අනුව කටයුතු කිරීම ඔබතුමාගේත් වගකීම. එමනිසා බලන්න. නම් වශයෙන් ඕන නම් එම ගොඩනැඟිලි ඉදිවෙච්චත් දන්නවා. මා කියන්නේ කවුරු කළත් මේ වැඩ කටයුතු හරියට කරන්න. ඒ එතුමා ගත් තීන්දුව . මෙතුමා ඉදිරිපත් කළ යෝජනාවට ස්තුතිය පුද කරනවා. නගර සභාව කියන කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න ඕන. අතිගරු ජනාධිපතිතුමා දෙන සහයෝගය අරගෙන අපි හරියට වැඩ කරන ලෙස ඉල්ලා සිටිමින් මෙතුමාගේ යෝජනාවට අපි ස්තුති වන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා ගෙන ආ යෝජනාව ඉතා හොඳ යෝජනාවකි. මා මේ අවස්ථාවේ ඔබතුමගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. එතුමා පැහැදිලිවම කියනවා එතුමා මුදල් දීලා එතුමාගේ වැඩ කටයුත්ත කර ගත් බව. එතුමාට ඔප්පු කරන්න පුළුවන් කියා කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිවාස සංවර්ධන අධිකාරිය නෙමේ. නාගරික සංවර්ධන අධිකාරිය

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ එතුමාට ඔප්පු කරන්න පුළුවන් කියනවානම් මේ සම්බන්ධව පරීක්ෂණයක් කරනවා නම් මහජනතාවට දැන ගන්නත් එක්ක ලොකු කටයුත්තක් වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.පි ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා ගෙන ආ යෝජනාවට මා ගොඩක් එතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලයේ මේ ප්‍රශ්නය නිසා ගොඩනැඟිලි ඉදිවෙනවා . කොහොම ඉදි වුණාද කියා දන්නේ නැහැ.ජනතාව ඇවිත් අපෙන් විමසුවාම අපට උත්තර දෙන්න බැහැ. මොකද මෙය පසුගිය දිනක අපේ ගරු විපක්ෂ නායක ඩෙනට් මහතා මේ ගැන විමසුවා. මා පෞද්ගලිකව කියන්න යන්නේ නැහැ. මේවා දුරකථනයෙන් තමයි මේ මුදල් දෙනු ලබන්නේ. දැන් ගරු නගර සභා මන්ත්‍රිතුමා රු.20000/= ක් දුන්නාට සමහර අය

මේවා දෙනු ලබන්නේ දුරකථනය මඟිනි. Easy Cash ක්‍රමයට මුදල් දමා මේ කටයුතු කරනවා කියා කියනවා. මට රහස් පොලිසියට එන්න කිවුවොත් මට සාක්ෂි ඕන තරම් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා රු.20000/= වගේ මා මුදල් දුන්නේ නැති වුණත් මට පෙන්වන්න හොඳටම සාක්ෂි තිබෙනවා. ඇත්තෙන්ම අතිගරු ජනාධිපතිතුමාට , අතිගරු අගමැතිතුමාට මා ස්තුතිවන්න වෙනවා නව වැඩපිළිවළක් යටතේ මේ රට ගෙන යාමට ගන්නා වැයම පිළිබඳ. එමනිසා ගරු සභාපතිතුමනි , ඊළඟට බලතල එන්නේ අපට ඔබතුමාට. අපි ඒවගේ කුණු ගා ගන්න අවශ්‍ය නැහැ. අපි නිවැරදිව කළ යුතුයි. අපිට Easy Cash ඕන නැහැ. දැන් එහෙමනේ. මා ගරු උප සභාපතිතුමාට කියන්නම් දුරකථනයෙන් ඇමතුම් දී මුදල් දමා තමයි මේවා අනුමත කරගත්තේ. රන්ජන් වගේ. අපි හරියට වැඩ කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොමත්ම ස්තුතියි ගරු සරත් චන්ද්‍ර මහතාට මේ යෝජනාව ඉදිරිපත් කිරිම සම්බන්ධව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,නාගරික සංවර්ධන අධිකාරියේ අයුතු මුදල් ඉපයිම් ඉතාම කනගාටුදායකයි. ඔවුන් රු.10000/=රු.20000/=,රු.30000/= ලෙස මුදල් ලබා ගන්නවා බොහොම අයුතු විදියට. අපි අහනවා එහෙම ලබා ගැනිමේ අයිතියක් නිලධාරින්ට තිබේද? මේ පිළිබඳව විධිමත්ව සොයා බලා . අපට නගර සභාවට තිබිය යුතු එම බලතල කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්න.මා හිතන්නේ මෙයට අවශ්‍ය පසුබිම සැකසිලා තිබෙන්නේ. මෙම අයුතු වැඩය ඉතා ඉක්මනින් නතර කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ ගරු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා ඉදිරිපත් කළ යෝජනාවට අනුව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් විසින් කරන තාඩන පිඩන මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් උදහස් වලින් ප්‍රකාශ වුණා. අතිගරු ජනාධිපතිතුමාගේ අදහස එක නෙමේ. ජනතාවට පුළුවන් තරම් සරල කරලා අනුමැතිය දෙන එක කියන අදහසයි අදහසේ තමයි එතුමා ඉන්නේ. ඒ අනුව බැලුවත් මේ කාරනා මේ ආකාරයෙන් සිදුවිය යුතු නැහැ. රජයේ ආයතනයක් සම්බන්ධ මාගේ සහෝදරයෙකුගේ දරුවන් තුන්දෙනෙකු මේ කාරණාව ගැන මට කිවුවා. එය සමහර විට එම නිලධාරින්ට අභිමතාර්ථ පරිදි එම මුදල් අයකර ගැනිමට අයිතියක් ඇති. එකටත් සාදාචාරයක් තිබෙනවා . තමන් රාජකාරි කරන ලාච්චුවට මුදල් දමා යන්න කියන තත්ත්වයට රාජ්‍ය නිලධාරින් පත්වෙලා කියන එක අතිගරු ජනාධිපතිතුමාට ලියන්න මාධ්‍යවේදින් කරුණාකරලා. ඉස්සෙල්ලාම එක නවත්වන්න. ඒ අයට මුදල් ලබා ගැනීමට බලයක් තිබුණත් මේ ගන්න ක්‍රමවේදය වැරදියි. එකට මොනවා හරි නිත්‍යානුකුල ක්‍රමයක් තිබිය යුතුයි. දැන් වෙනදා අපට මතකයි අපට මේ බලය තිබෙද්දි වර්ග අඩි 300ට වඩා වැඩි සැලසුම් සඳහා ඉංජිනේරුවරයෙකුගේ අත්සන ලබා ගැනීමේ උවමනාව තිබුණා. අපි ඒ ඉංජිනේරුතුමා පුද්ගලිකව මුණ ගැසි එයාගේ ගාස්තු ගෙවා එය ගෙනවා. අද වෙන්නේ ඊට හාත්පස දෙයකි. මේවා බැලුවාම රාජ්‍ය සේවයේත් ගරුත්වය පිරිහෙනවා. මේ පොදු මහජනතාව මේ පිලිබඳ අවබෝධයක් නැහැ. ඒ අයට කිව්වාට මේ රජයේ නිලධාරින්ගේ ලාච්චුවට මුදල් දැම්මට අයිතියක් නැහැ කියා. ඒ අය පිළිගනිද? එය ජාරා විදියට තමයි ගරු සභාපතිතුමනි හඳුන්වනු ලබන්නේ. මුළු රාජ්‍ය සේවයටම කැළලක් එක. කරුණාකරලා එය නවත්වන්න අපි මේ යෝජනාව තුලින් කරන ලෙස ඉල්ලනවා .මටත් ආරංචිය ආවා ජනවාරි 01 දින සිට මේ තත්ත්වය අතිගරු ජනාධිපතිතුමා නතර කරනවා කියා. ඒ වුණත් වැඩියමක් විදියට මේ සභාවේ යෝජනාවක් විදියට මේ සියළු තත්ත්වයන් එක්ක මේ ප්‍රසිද්ධියේ කරන

මේ වැඩය නතර කළ යුතුයි. මේ නිලධාරීන් මේ නගර සභාවේ සැලසුම් කමිටුව නියෝජනය වෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගෙන් මෙය අහන්නේ. ගරු මන්ත්‍රීවරුන්ට මෙය කියන්නේ. ඒ වගේම මෙහි ප්‍රායෝගිකව විශාල ගැටලුවක් තිබෙනවා. පසුගිය දිනයක මට මතකයි අඩි 3000ට වැඩි මහල් 4කින් යුතු ගොඩනැඟිල්ලක් ඉදි වෙනවා. එය අයිති නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට. එයට අනුමැතියත් දීලා තිබෙනවා. පහළ ගෙදර සිටින මනුස්සයා අයිති නගර සභාවට. ඔහුගේ නිත්‍යානුකූල තත්ත්වය තිබෙන්නේ නගර සභාවත් එක්ක. එතුමා හෝ එතුමිය දුවගෙන එන්නේ නගර සභාවට. ගරු මන්ත්‍රීතුමා ගාවට , ගරු සභාපතිතුමා ළඟට. එතකොට අපි දෙන උත්තරය කුමක්ද? නගර සභාවට අපට ඡන්දය දුන් පුද්ගලයාට කියන්න තිබෙන්නේ එය නාගරික සංවර්ධන අධිකාරියට ගිහින් බේරා ගන්න කියන්න කියා. මේවා පැටලිලි සහගතයි. එමනිසා මේ තත්ත්වය ඉතා ඉක්මනින් නිවැරදි කරලා මෙය නගර සභාවට අයිති ලබා දෙන්න. නගර සභාවලට ඒ බලතල ලබා දෙන යෝජනාව ගරු සභාපතිතුමා අතිගරු අගමැතිතුමාට ඇමතිතුමා විදියට යවන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව දැමීම සම්බන්ධව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ යෝජනාව සම්බන්ධව මාත් වචන කිහිපයක් කියන්න ඕන. මේ යෝජනාව නගර සභාවල තිබුන බලතල නාගරික සංවර්ධන අධිකාරියට බලය පැවරුවේ යහපාලන ආණ්ඩු සමහේ. යහපත් පාලනයක් කරනවා කියා තමයි ඒ අය නගර සභා වල තිබුණ බලය , ප්‍රාදේශීය සභාවල තිබුණ බලය අයිති කර ගත්තේ. නමුත් ඒ පැවරීම තුළ විශාල අගතියක් ජනතාවට සිද්ධ වුණා. ඒ විශාල වශයෙන් මුදල් ගෙන ඒ අනුමත කිරීම් කරන නිසා ජනතාව හුඟක්ම අසරණභාවයට පත්වුනා. මා කිවයුතුයි අපේ ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කළ ඉඩම සම්බන්ධයෙන් අපේ සැලසුම් කමිටුව වසර 3කට දෙපාරක් ප්‍රතික්ෂේප කරන ලද අනුබෙදුමක්. ඉඩම් කට්ටි කර විකිණීමක් කරන විට අපේ නිමයක් තමයි පාරවල් හදලා කාණු දමලා විදුලිය දීලා තමයි හදන්න ඕන. නමුත් මේ අනුබෙදීම දීපු කෙනා ඒ කිසිවක් කරන්නේ නැතිව තමයි සිදු කර තිබෙන්නේ. 1% ගාස්තුවක් නගර සභාවට ගෙවන්න ඕන. ඒ කිසිවක් නොකර විකුණනු ලැබුවා. විකුණුවාට පසු එම ඉඩම් ගත් ජනතාව පැමිණියා නගර සභාවට අනුමත කරන්න. අපි මෙහේ ප්‍රතික්ෂේප කළා. අපි ප්‍රතික්ෂේප කරන ලද දෙය නාගරික සංවර්ධන අධිකාරිය බලය ගත් ගමන් එය අනුමත කර තිබෙනවා. අද එහි තාර දමා නැහැ. කාණු දමා නැහැ. විදුලිය නැහැ. නල ජලය නැහැ. ඒ සියල්ලම නැතිව තමයි. මේ වගේ අක්‍රමිකතා රාශියක් සිද්ධ වෙච්ච එකක් තමයි. අපි නගරයක සිටින විට ජනතාවගේ අවශ්‍යතා මොනවාද ? අල්ලපු ගෙදර අවශ්‍යතා මොනවාද ? අල්ලපු ඉඩමේ තිබෙන අවශ්‍යතා මොනවාද? ජලය බැසිය යුත්තේ කොහොමද ? ඒ සියල්ලම බලා තමයි අපි කටයුතු කරන්නේ. අපි ඉතාමත්ම සාධාරණ අන්දමින් අපි සැලසුම් කමිටුව මෙහෙයවුවා. ඒ කාලය ඇතුළත අපේ සැලැසුමක් දමන ඕනෑම පුද්ගලයෙකුට දින 14ක් ඇතුළත සම්පූර්ණයෙන්ම අනුමත කරන ක්‍රමවේදයක් අපි හැදුවා. නිලධාරියෙකු ළඟ උපරිම ගොනුවක් තබා ගත යුතු කාලසීමාවක් පනවනු ලැබුවා. ඒ අනුව ඉතා හොඳින් අපි සැලසුම් කමිටුව ක්‍රියාත්මක කළා. නාගරික සංවර්ධන අධිකාරියට බලය දුන්නාට පසු මුදල් ලබා දෙන්නේ නැතිනම් මේ ගොනුව අනුමත කරන්නේ නැහැ. අද සමහර වේලාවට අපට පාරවල් වල යනවිට පෙනෙන දෙයක් තමයි ඒ තිබිය යුතු ප්‍රමාණයන් තබන්නේ නැතිව තමයි ගොඩනැඟිලි ඉදිකර තිබෙන්නේ. අනුමත කර තිබෙනවා. මගේ කොට්ඨාශයේම තිබෙනවා. හුඟාක් ඒවා ගැටළු සහගත වෙලා තිබෙනවා.ජනතාව පැමිණ අපට ප්‍රශ්න කිවුවාම එම ප්‍රශ්නයට අපට පිළිතුරු දෙන්න විදියක් නැහැ. අපි ළඟ බලතල නැති නිසා. ඒ අනුව මේ

බලතල අවශ්‍යයි කියා අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යන දෙදෙනාම තේරුම් ගෙන ඒ අවශ්‍ය බලතල පැවරීම ඒ අවශ්‍ය සභාවලට පැවරීම සම්බන්ධව ස්තුතිය පුද කරනවා. මේ අවශ්‍ය බලතල පැවරීම ඉෂ්ඨ වෙලා අවසන්. නමුත් ප්‍රායෝගික තලයේ ඒ අවශය ලේඛණ ටික ලැබිලා නැහැ. තීන්දු අරගෙන අවසන්. ඒ අනුව ඉදිරියේදි ජනතාවට සෙතක් ඇතිවෙයි කියා අපි බලාපොරෝත්තු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මා ඉදිරිපත් කරන ලද යෝජනාවට මුළු සභාවේම පූර්ණ එකඟතාවය හා සහයෝගය දැක්වීම ගැන මා බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මගේ සහෝදර මන්ත්‍රිවරුන්ට. ඒ වගේම මේ සිද්ධිය වෙන කාලය වන විට මා මන්ත්‍රිවරයෙක් නෙමේ. මමත් සාමාන්‍ය පුද්ගලයෙක්. ඉතිං ඒ වේලාවේ මට මේ දැනීම හෝ ශක්තිය තිබුණේ නැහැ. මාත් මගේ ඉඩමේ අනුබෙදීම අනුමත කර ගැනීමේ චේතනාවෙන් තමයි මා ගියේ. ඇත්තටම මගෙන් රු.25000/= ක් ඉල්ලුවා. මා හෙට්වු කරලා තමයි රු.20000/= අඩු කරගත්තේ. නමුත් අද මේ වනවිට මට සහෝදර මන්ත්‍රිවරු එය ඔප්පු කරන්න කියා කිවුවාට මා කොහොමද ඔප්පු කරන්නේ. මාගේ හදවත දන්නවා මා සල්ලි දුන්නා කියා. නමුත් එහෙම ඔප්පු කරන්න මට සාක්ෂියක් හඩ පටියක් මගේ ළඟ නැහැ. කෙසේ හෝ වේවා මට මා ලැබු පාඩුව දරා ගන්නම්. මින්මතුවට මේ නගරයේ ජනතාවට මේ අසාධාරණය සිදු නොවේවා කියා මා ප්‍රර්ථනා කරනවා. ඒ වගේම මා මගේ සහෝදර මන්ත්‍රිවරුන්ට නැවතත් මා ස්තුති වන්ත වෙනවා. ගරු සභාපතිතුමා ඇතුළු මාගේ යෝජනාවට පූර්ණ එකඟතාවය හා අශිර්වාදය ලබා දීම පිළිබඳව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම යෝජනාව සම්මත වෙනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පිහිටි ඉඩමක අනුබෙදුම අනුමත කිරීමට ගාල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදුවී ඇති බවත් එම කාර්යය පෙර සිදුවූ පරිදි නගර සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඇස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.03 ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01 ඉදිරි සියළුම මැතිවරණවලදී උගත්, බුද්ධිමත්,සමාජ හිතකාමී මහත්ම මහත්මීන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කිරීම සඳහා පියවර ගන්නා ලෙස කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

05.03.01යෝජනාව ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ඉදිරි සියළුම මැතිවරණවලදී උගත්, බුද්ධිමත්,සමාජ හිතකාමී මහත්ම මහත්මීන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කිරීම සඳහා පියවර ගන්නා ලෙස මා මේ සභාවේ යෝජනාවක් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා මේ යෝජනාව කරනු ලැබුවේ අප සියළු දෙනාම ඉන්නේ බිම මට්ටමේ අය සමඟ. ඒ හැමගේම ඉල්ලීම තමයි මේක. මා එකක් දන්නවා අද පාර්ලිමේන්තුව ගතහොත් අප කනගාටුවිය යුතුයි. පාර්ලිමේන්තුව ගතහොත් පාර්ලිමේන්තුවෙන් 225න් සියයක් ගතහොත් අට සමත් අය සිටිනවා කියා මුළු ගමම රටම කතා කරනවා. මෙය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. ඉදිරි මහ මැතිවරණයේදී අප පක්ෂ සියල්ලෙම මහ ලේකම්වරුන්ගෙන් ඉල්ලීමක් කරන්න. මා ඉල්ලන්නේ උගත් අය .කණ්ඩායමක් ගිහින් මේ අය හොරකම් කලා.අරගොල්ලන් හොරකම් කලා. කියනවා . මේ හැමදෙනාම කරන්නේ කාලය නිම වෙනකම්ම එම කාර්ය. නමුත් මගේ වයස තෙක්ම මේ රට දියුණු වෙමින් පවතිනවා. කවදාවත් මෙය දියුණු කරන්න බැහැ. මේ නිසා මෙයට උගතුන් යා යුතුමයි. උගතුන් ගියොත් යම්කිසි පාර්ලිමේන්තු අණපණත්, ප්‍රතිපත්ති ඔක්කොම ක්‍රියාත්මක කරන්නේ මේ තුලින්. පාර්ලිමේන්තුවේ උගතුන්ගේ අණපණත් , නිති නුගතුන් ටිකක් සම්පාදනය කළහොත් මේ රට විනාශයි. මා හිතනවා මෙය දියුණු වෙන්න බැරි මේ නිසා කියා. ඒ මාගේ දැනිම . මා එමනිසා ඉල්ලා සිටිනවා අපි ගරු මන්ත්‍රීවරු වශයෙන් පොඩි මන්ත්‍රීවරියන් වශයෙන් මේ රට දියුණු කරන්න තිබෙන ආශාවට තමයි මා මේ යෝජනාව කරන්නේ. එමනිසා කිසිම පක්ෂයකට හොරකම් කරපු, වංචා කරපු , දූෂණය කරපු, මැරකම් කරපු, කාන්තා හිංසන කරපු , කිසිම කෙනෙකුට අපේක්ෂත්වය දෙන්න එපා කියා මා තරයේ ඉල්ලීමක් කරනවා. ඒවා පක්ෂය දිලා ජනතාව බණිනවා. එහෙනම් පක්ෂය පත් කරන්නේ මොකටද කියා. අහිංසක මිනිසුන් අසරණයි. කොහොම කෙනෙක් පත් කළත් මුදල් ටිකක් වියදම් කළාම ජනතාව ඡන්දය දෙනවා. අපේක්ෂත්වය නොදි නතර කරන ලෙස මහ ලේකම්වරුන්ගෙන් ඉල්ලීමක් කරන්න කියා ඉතාමත් ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කරන ලද යෝජනාව මා කොටස් දෙකකට බෙදා පිළිගැනීමට සූදානම්. එක කොටසක් තමයි ස්ත්‍රී දූෂකයන්ට , නොයෙකුත් සාමාජ විරෝධි ව්‍යාපාර කරන අයට මේ අවස්ථාව දෙන්න එපා කියන එක මා පිළිගන්නවා. නමුත් මේ උගත් අයට දෙන්න කිවුවාම එතැන නැවත ප්‍රශ්නයක් එනවා. උගත් හොරු ඉන්නවාද ? හැම උගතෙක්ම අවංක නැහැ. ටයි කෝට් ගහපු හොරු ඉන්නේ. සරම ගහගෙන ගිහින් පොල් කඩන හොරු නෙමේ අද ඉන්නේ. අන්න එමනිසා එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අන්න එක රටේ පාලකයෝ මොන ආකාරයෙන් තේරුම් ගෙන ක්‍රියාත්මක කරාවිද කියා.  මා පොඩි විරුද්ධ වෙනවා නෙමේ. මට පොඩි ගැටළුවක් එනවා. අද ඉන්නේ ටයි කෝට් හොරු. රු.100 ,රු.200 නෙමේ හොරකම් කරන්නේ. මිලියන ගණන් වලින් ගහන්නේ. ට්‍රිලියන ගණන් වලින් ගහන්නේ. එතකොට අන්න ඒ හොරුන්ට අද

දඩුවම් නැහැ. අද ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ එකයි. ඉතිං ඒ යෝජනාව හොඳයි. අන්න අර සංශෝධනයත් එක්ක වෙනවා නම් වඩාත් හොඳයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ සහෝදර මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි. මා අපේ සහෝදර මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතාගේ අදහසත් ගන්නවා. ඒක හොයා ගන්නේ කොහොමද කියන එක තමයි ප්‍රශ්නය. ටයි කෝට් එක ගහගෙන ගිහින් ගියාට පසු හොරෙක් වෙන්න පුළුවන්. සරම ඇඳගෙන ගිහින් ගියාට පසු හොරෙක් වෙන්න පුළුවන්. ඒ වගේ දෙයක් අපේ නායකයාටවත් කාටවත් බැරිවෙයි තීරණය කර ගන්න. හොඳම යෝජනාවක් . හැබැයි වාද විවාදයට මෙතනදි ගත යුතු නැහැ කියන එකයි මා කියන්නේ කාලයත් එක්ක බැලුවාම. මොකද අපට තිබෙන කාලයත් එක්ක බැලුවාම. මේවා තීරණය කරන්නේ එහේ සිටින ලොකු මහත්වරු. ඉතිං අපි නිකං වාද විවාදයට කල් යවන්නේ නැතිව මෙය යෝජනාවක් විදියට යවා ඉදිරියට යනලෙස මා යෝජනා කරනවා. මෙය හොඳ යෝජනාවක්. නැතිනම් මෙයට 21නාම කතා කළහොත් එහෙම තව පැය දෙකක්වත් යයි. බොහොම හොඳ යෝජනාවක්. මට තිබෙන ගැටළුව තමයි උගතා හොරු වෙන්නත් පුළුවන් නැති මිනිහා හොරු වෙන්නත් පුළුවන්. හොරු කියන කට්ටිය අපිට හිතා ගන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් අපේ සහෝදර මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාවට කතා නොකරත් බැහැ. හොඳ යෝජනාවක්. මෙතුමිය එක පැත්තක් පෙන්නුවාම මා තවත් පැත්තක් පෙන්වන්නත් එපැයි. හැමෝම කියනවා පිරිමි ගිහින් කාන්තාවෝ දූෂණය කරනවා කියා. කාන්තාවොත් පිරිමි දූෂණය කරන පැත්තක් තිබෙනවා. අන්න ඒ අයත් දන්න එපා කියා ඕකට සඳහන් කරන්න. වැඩිපුර එහෙම වෙනවානේ. මේ යෝජනාවක්. මා එතුමියට නෙමේ මේ කියන්නේ. ගරු සභාපතිතුමාට ඇහුනාද දන්නේ නැහැ. මෙයට අපි තින්දු තීරණ ගත්තාත් අපි ගන්න තින්දු තීරණ ක්‍රියාත්මක කරන්නේ නැහැනේ නායකයෝ. එමනිසා ඉල්ලීමක් වශයෙන් එය යවන්න කියා ඉල්ලා සිටිමින් යෝජනාවට ස්තූතිය පුද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව කලෝචිත යෝජනාවක්. එතකොට අපි ඒ සම්බන්ධව එතුමියට ස්තූතිවන්ත වෙනවා. අපි මේවා මෙතැන කතා කළාට අපි පොඩි අය. ඉතිං මහ තැන්වල පැරිෂුට් එකෙන් හරි කොහොන් හරි ගෙනත් දැම්මාම අපේ මිනිසුන් හරිම අසරණයි. අපේ ගරු මන්ත්‍රීවරු හරිම අසණයි. අපට විකල්පයක් නැහැ. ඉතිං ඇඳුම් රෙදි කැල්ලක් බෙදුවාම අපේ මිනිසුන් රැවිටිලා යනවා. ඉතිං එවන්නේ පක්ෂයේ මහ ලේකම් වරුන් හා ප්‍රධානීන්.එමනිසා මේවා මාධ්‍ය ලියනවා නම් ලියන්න . පක්ෂ වල ප්‍රධානින්ට අම්බලන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රිවරු විසින් මෙහෙම කතා කළා කියා. උගත් , බුද්ධිමත්, සාමාජ හිතකාමී මහත්ම මහත්මින් ඉදිරි මැතිවරණ වලදි අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කරන්න කියා. මැරකම , හොරකම, වංචාව , දූෂණය හා තමන්ගේ චරිතය දූෂණය කරගත් දූෂකයන් මෙම අපේක්ෂකයන් මෙම අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කරන්න එපා කියා. පැරුෂුට් අය. අපි කියන්නේ කාන්තාවන් හරි දෙපාර්ශවයෙන්ම දාන්න එපා. මොකද මේ පක්ෂ වලට දර දිය ඇඳගෙන සිටින අය ඉන්නව කොට්ඨාශය තුළ . දරදිය ඇඳපු උගත් , බුද්ධිමත් සුදුසු සාමාජ හිතකාමී මහත්ම මහත්මින් මේ ආසනය තුළ ඉන්නවා.මේ හැම

ආසනයකම ඉන්නවා. ඒ අය තෝරා එතැනින් නියෝජිතයෙකු දෙනවා නම් තමයි අපට ඡන්දයකට හොඳ කියා අප ප්‍රකාශ කරනවා. එතැනින් එහාට පිටින් ගෙනවිත් දමා අපේ කොට්ඨාශයේ සිටින මේ දේශපාලනය කරන මහත්ම මහත්මීන්ට අගතියක් කරන්න එපා කියා පක්ෂ වල ඉහළ තලයට අපි කියනවා. මේ සම්බන්ධව නිසි පියවරක් ගනිවි කියා අපි හිතනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ඒ වගේම විපක්ෂ නායකතුමා දැනට සිටින රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඇතුළු සියළු දෙනාගෙන්ම. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් දෙන්නේ නැහැ එහෙම.නොදිවි කියා අප විශ්වාස කරනවා . එමනිසා සුදුසු අයට මේ අපේක්ෂකත්වය ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය ඉදිරිපත් කළ යෝජනාව ඉතා කලෝචිත යෝජනාවකි. අපි සතුටු වෙනවා මේ යෝජනාව දැම්ම සම්බන්ධව. පවතින සියළුම මැතිවරණ වලදි උගතුන්, බුද්ධිමතුන් , වියතුන්, ඒ වගේම විශේෂයෙන්ම දැත් පිරිසිදු පිරිසට සියළු පක්ෂවල නාම යෝජනා දිම වඩාත් කලෝචිතයි. මොකද අද රට මුහුණ දී තිබෙන ප්‍රශ්නත් එක්ක උගතුන් කෝට් ඇඳ ඇවිත් දඩුවම් දුන්නාම උගතුන් හැදෙනවා. දඩුවම් දෙන්නේ නැහැනේ. ඉතිං එතැනට පත්වෙලා තිබෙනවා.මේ කලෝචිත යෝජනාව සම්බන්ධව දිර්ඝ කතා කරන්න යන්නේ නැහැ.මොකද රටට අත්‍යවශ්‍ය කාරණයක් මෙය. සියළු ගරු මන්ත්‍රිවරුන් මේ පිලිබඳ එකඟතාවයට පත්වෙනවා. මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු නගර සභා මන්ත්‍රි අයිරාංගනී මහත්මියට ස්තුතිය පුද කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ ඔබ සියළු දෙනාටම ස්තුතිය පුද කරනවා. ඒ වගේම විශේෂයෙන්ම ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා ඉදිරිපත් කළ අදහසටත් එකඟ වෙනවා. ඔබතුමාගේ සංශෝධනත් මා පිළිගන්නවා. හැබැයි මා එකක් කියනවා . උගතුන් වැරදි වැඩක් කර ඔවුන්ට දඩුවම් කළහොත් අනිත් උගතුන් පාඩම් ඉගෙන ගන්නවා. උගත් අය කිර්තිය බොහොම රකින්න හදන අය. බොරුවට වෙස් මවාගෙන කිර්තිය රකිනවා උගතා. උගතාට නම් කමක් නැහැ බාජාර් එකේ ගිහිල්ලා. උගතාට දඩුවම් කළානම් හොරකම් කළ කෙනාට ඊළඟ උගතා හැදෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

යෝජනාව ඒකමතිකව සම්මතයි.

**තීරණය -**

ඉදිරි සියළුම මැතිවරණවලදී උගත්, බුද්ධිමත්,සමාජ හිතකාමී මහත්ම මහත්මීන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කිරීම සඳහා පියවර ගන්නා ලෙස ගරු නගර සභා මන්ත්‍රිනී

ඊ.ඇම්. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් කරන ලද යෝජනාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කර අතර ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06. කාරක සභා වාර්තා :-**

**06.01 2020.01.21 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.01.21 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.21 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර_මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2020.01.13 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.01.13 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.13 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2020.01.29 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.01.29 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.29 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2020.01.27 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2020.01.27 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා. ගරු සභාපතිතුමනි, මාගේ නම එහි සඳහන් වෙලා නැහැ. මා සෞඛ්‍ය කමිටුවට සහභාගි වුණා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මමත් සහභාගි වුනා. මාගේ නමත් සඳහන් වෙලා නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සෞඛ්‍ය කමිටු වාර්තාවට එම නම ඇතුළත් කරන්න. සෞඛ්‍ය කමිටුවට සහභාගි වු ගරු මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන්න.

**තීරණය:-**

2020.01.27 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් එම කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රී මන්ත්‍රීන්ගේ ඇතුලත් නොවු නම් ඇතුළත් කිරිම සුදුසු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2020.01.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2020.01.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

**2020.01.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.06 2020.01.28 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.12.29 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.28 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.07 2020.01.23 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.01.23 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.28 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.08 2020.01.17 දින පැවති රථවාහන හා ත්‍රීරෝද රථ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.01.17 දින පැවති රථවාහන හා ත්‍රීරෝද රථ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහි පොඩි සංශෝධනයක් කරනවා. මා ඉල්ලීමක් කරනවා. මෙහි අර ත්‍රිවිල් රථ ගාල් වල එකවර නතර කිරීමට පුළුවන් ප්‍රමාණය අනුව 2 යටතේ තිබෙනවා බස්නැවතුම්පොළ ඇතුල්වීමේ භූමියේ තිබෙන පර්යන්ත්‍රය කියා. මා නම් දන්නේ නැහැ

මොකක්ද කියා. මා දන්නේ නැහැ ඒ කොතනද කියන එක 6ක්. ඊළඟට 7 යටතේ තිබෙනවා කුලරත්න හංදියේ ත්‍රිවිල් රථ 8ක්. එතැන මේ රක්ෂණ සංස්ථාව මුහුණත.එම වෙළඳ ව්‍යාපාරය වසා තිබෙන නිසා එච්චර ගැටළුවක් නැහැ. නමුත් එතැන මෙහෙම ත්‍රිවිල් 8ක් ගැසුවොත් වෙළඳ ආයතන වලට මුකුත්ම කරන්න බැහැ. ගැසට් එකේ ඇති සමහර විට. මෙය 5ක් දක්වා එකවර ගාල් කළ හැකි ප්‍රමාණය 5ක් දක්වා අඩු කරන්න කියා ඉල්ලා සිටිනවා. හැම එකෙම තිබෙන්නේ 5ක් 6ක් පමණි. එය 5ක් දක්වා අඩුකරන්න කියන ඉල්ලීම කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙම ඉල්ලීම රථ වාහන හා ත්‍රිවිල් රථ කමිටුවේදී සාකච්ඡා කර බලා නැවත ඉදිරිපත් කරන්න.

**තීරණය:-**

2020.01.17 දින පැවති රථවාහන හා ත්‍රීරෝද රථ කමිටු කමිටු වාර්තාව පිළිගත යුතු බවත් , කුලරත්න හංදියේ ත්‍රි විල් රථ 05 ක් දක්වා එකවර ගාල් කළහැකි රථ ගණන 5ක් දක්වා අඩුකිරීම පිළිබඳ ත්‍රිරෝද රථ කමිටුවේදී සාකච්ජා කර ඉදිරිපත් කිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.09 2020.01.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2020.01.17 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

2020.01.16 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.10 2020.01.31 දින පැවති කාන්තා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2020.01.31 දින පැවති කාන්තා කමිටු වාර්තාව හදලා නැහැ. අපේ එය ඉදිරිපත් කරන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගේ පියා මිය ගිහින් එම නිසා අපි එය ඉදිරිපත් කරන්නේ නැහැ.

**තීරණය:-**

2020.01.31 දින පැවති කාන්තා කමිටු වාර්තාව ඉදිරිපත් කර නොමැත.

## 07. ටෙන්ඩර් හා මිළ ගණන්

07.01 ටෙන්ඩර්

07.02 මිළ ගණන්

07.02.01 අම්බලන්ගොඩ නගර සභා 252-0730 කැබ් රථයට ටයර් මිලදි ගැනිම සඳහා මිළගණන් ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ශ්‍රී ලංකා රජයේ නිතිගත සංස්තාව | **Crown Tyre Colombo** | **Sumith Marketing Ambalangoda** |
|---|---|---|---|---|---|
| **01** | 805*70*15 ටයර් | 04 | York chama Thailand<br>29754/= | Maxxis<br>16037/=<br>GTRodid<br>17344/= | Maxxis<br>16416/= |

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා 252-0730 කැබ් රථයට ටයර් මිලදි ගැනිම සඳහා මිළගණන් ඉදිරිපත් කර ඇති අඩුම මිලක් ඉදිරිපත් කර ඇත්තේ Crown Tyre ආයතනය වුවත් එම ආයතනය පිහිටියේ කොළඹ ප්‍රදේශයේ බැවින් ප්‍රවාහන වියදම් සලකා බලා අම්බලන්ගොඩ නගරයේ පිහිටි **Sumith Marketing Ambalangoda** ආයතනය විසින්ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදි.

07.02.02 **අම්බලන්ගොඩ නගර සභා හල්වතුර කසළ අංගණයට අවශ්‍ය RYDALL OE දුගඳ නාශක දියර ඉසීම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා සම්බන්ධව ඉදිරිපත් කර ඇති මිළගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Meenaban (PVT)** | **United Glass Lanka Pvt** | **Appex Rydal (Pvt ) Ltd** |
|---|---|---|---|---|---|
| **01** | හල්වතුර කසළ අංගනයට RYDALL OE නැමැති දුර්ගන්ධ නාශක දියර ඉසින | 01 | 130,000/= | 102,600/= | 112,500/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යන්ත්‍රය මිලදී ගැනීම සඳහා | | | | |

**තීරණය:-**

අම්බලන්ගොඩ නගර සභා හල්වතුර කසළ අංගණයට අවශ්‍ය RYDALL OE දුගඳ නාශක දියර ඉසීම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ආයතනයන්හි භාණ්ඩ පරීක්ෂා කර බලා මිලදි ගැනීම සුදුසු බවත් එය මහජන සෞඛ්‍ය පරීක්ෂක , තාක්ෂණ නිලධාරි , පරිසර නිලධාරි , ලේකම්තුමිය, ගරු මන්ත්‍රීතුමන්ලා , ගණකාධිකාරි මහත්මිය ඇතුළු සමන්විත ටෙන්ඩර් කමිටුවක් මඟින් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 අම්බලන්ගොඩ නගර පුස්තකාලයේ පැරණි පුවත් මිලදි ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්**

| අංකය | **ද්‍රව්‍යහා උපකරණ විස්තරය** | ප්‍රමාණය | Rනිමල් | K පුෂ්පකුමාර | I.D සමනි කුමාර |
|---|---|---|---|---|---|
| 01 | පැරණි පුවත් පත් මිලදි ගැනීම සඳහා<br>ලොකු පත්තර<br>පොඩි පත්තර | කිලෝ 01 | 7.00<br>5.00 | 5.10<br>3.20 | 19550<br>4.00<br>3.50 |

**තීරණය-**

අම්බලන්ගොඩ නගර පුස්තකාලයේ පැරණි පුවත් මිලදි ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතිරින් වැඩිම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ ආර්. නිමල් මහතා විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදි.

08. **ගෙවීම් :-**

**08:01** **ඇණවුම් අංක 2346 යටතේ ඇණවුම් කරන ලද 2A-5185 බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස හා පිටුපස ටයර් වෙනුවෙන් කොළඹ 14, ක්‍රවුන් ටයර්ස් පුද්ගලික සමාගම වෙත රු.284788/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ගෙවීම් වවුචර් වල දිනය සඳහන් කර නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ අපි දිනය දමන්නේ නැහැ. ඇණවුම් අංකය තමයි දමන්නේ. කවදාවත් දින සටහන් කරන්නේ නැහැ. ඔබතුමා නැති එකක් තමයි යෝජනා කරන්නේ. ඉදිරියට අවශ්‍ය නම් කියන්න.

**08:02** ඇණවුම් අංක **2309** යටතේ මුද්‍රණය කරන ලද ලේඛන වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු.**151000/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:03** ඇණවුම් අංක **2312** යටතේ ඇණවුම් කරන ලද වවුචර් පොත් **50** ක් වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු.**39000/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:04** ඇණවුම් අංක **2314** යටතේ ඇණවුම් කරන ලද ෆොටෝ කොපි ටෝනර් **05** ක් වෙනුවෙන් ගාල්ල **Lanka Technology Appliances (Pvt) Ltd** වෙත රු.**40993.02** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:05** ඇණවුම් අංක **2287** යටතේ අයවැය ලේඛන **25** ක් මුද්‍රණය කර බැඳීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු.**30625/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:06** ඇණවුම් අංක **2356** යටතේ ඇණවුම් කරන ලද ටෝනර් **02** ක් වෙනුවෙන් මාතර **Metropolitan Office (Pvt) Ltd** වෙත රු.**60048/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:07** කා.නි.ප. අංක **0515** යටතේ **LL742** රථයේ ආසන අළුත්වැඩියාව හා කුෂන් කිරීම වෙනුවෙන් බටපොල ටී.එච්.එන්.ලීලාරත්න මහතා වෙත රු.**15000/-**ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:08** ඇණවුම් අංක **2305** යටතේ ගබඩාවට ඇණවුම් කරන ලද එන්ජින් ඔයිල් බැරල් **01** ක් වෙනුවෙන් සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු.**78200/-**

**ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:09 ඇණවුම් අංක 0519 පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනයට පස් කියුබ් 15 ක් දැමීම වෙනුවෙන් පළාත් පාලන ඉංජිනේරු මහතාගෙන් වාර්තාවක් ලබාගෙන ඒ අනුව ඉදිරියේදි නැවත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා එයට විරෝධතාවය ප්‍රකාශ කරනවා. පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණයට පස් කියුබ් 15ක් දැම්ම හේතුවෙන් මුදල් ඉල්ලා දමා තිබෙනවා. මා අහන්න කැමතියි මෙය නිර්දේශ කර තිබෙන්නේ මොන තාක්ෂණසේවා නිලධාරිද කියා. ? පස් ගෙන එන්නේ කොහෝ සිටද? මෙයට පිළිතුරක් අවශ්‍යයි. අපට අනුමත කරන්න බැහැ. මට කියන්න කොහේ සිටද පස් ගෙන එන්නේ. මට මෙයට පිළිතුරු අවශ්‍යයි. නැතිව මෙය අනුමත කරන්න බැහැ.එම නිසා අදාළ නිළධාරියා බලන්න

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පස්වලට ගෙවිම් කරන්න පුළුවන්නේ. ඔගොල්ලන්ගේ අනුමැතිය තිබෙනවානේ. මොකක්ද ගැටළුව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා ,මට ප්‍රශ්න තිබෙනවා . කරුණාකරලා කියන්න පස් ගෙනාවේ කොහේ සිටද ?ඔබතුමා එතකොට නිකං අත්සන් කරනවා ඔහේ ගෙනත් දෙන කොළයක්. නගරයේ ජනතාවගේ මුදල් නේද ? හරිද ඒක. වහාම ක්‍රීඩා භූමි භාරකරු ගෙන්වන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ක්‍රීඩා භූමි උපදේශකට දැනුම් දෙන්න ඉල්ලිමක් කරලා.

**08.10 ඇණවුම් අංක 2348 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් වෙනුවෙන් බෝගහවත්ත, ඇල්පිටිය පාර පදිංචි එස්.එච්.එන්.ඒ. ද සිල්වා මහතාට රු.48280/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:11 ඇණවුම් අංක 2341 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් වෙනුවෙන් බෝගහවත්ත, ඇල්පිටිය පාර පදිංචි එස්.එච්.එන්.ඒ. ද සිල්වා මහතාට රු.48280/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:12 ඇණවුම් අංක 2278 යටතේ රුහුණු සංචාරක කාර්යාංශය අසල පාර පළුදු කිරීම් සකස් කිරීම සඳහා ගල් කුඩු කියුබ් 01 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ. එපිටමුල්ල පදිංචි බෝගහවත්ත, ඇල්පිටිය පාර පදිංචි පී.එච්.සී.සී. ද සිල්වා මහතාට රු.10,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. දැන් පාර සකස් කිරිමට ගඟේ වැලි මුසු කර තිබෙනවා. ඉතිං ගඟේ වැලියි ගල් කුඩුයි කියන්නේ මිල අධිකයි. අපට මුහුදු වැලි පාවිච්චි කරන්න පුළුවන් ඊට වඩා අඩු ගණනකට.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා දැන් මෙහෙම දෙයකුත් තිබෙනවා. අපි කලින් නගර සභාව පාවිච්චි කළේ මුහුදු වැලි තමයි. දැන් මුහුදු වැලි ගැනිම සඳහා ලොකු බාධා රාශියක් තිබෙනවා. එමනිසා මුහුදු වැලි ගැනිම කරන්නේ නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , නැහැ. එය තනිකරම බොරුවක්. වැලි ඕන තරම් ගන්න පුළුවන්. කිසිම බාධාවක් නැහැ. අඩු මුදලට මුහුදු වැලි ගන්න පුළුවන්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අඩු මුදලට. වෙනදා අපි මුහුදු වැලි ගනු ලැබුවේ නිකං. සතයක්වත් ගෙවා නැහැ. දැන් එක ලෝඩ් එකකට රු.50000/= ක් දඩ ගහනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

අපිට ගන්න පුළුවන්. රු.4200/= ක් පමණයි වෙන්නේ. රු.4200/= ට මා කළුතරට ගෙනියනවා. මෙහෙන් රු.4200/= ට ගතහැකි. මා කියන්නේ ගඟේ වැලි වලට රු.12000/= ක්

දෙනවා. කුඩුවලට රු.5500/=, රු.6000/= ක් දෙනවා. අපි මීටපසු තීරණයක් ගන්න. මුහුදු වැලි ගැනීමට.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි. අපරාදයක්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, තාක්ෂණසේවා නිලධාරිතුමනි මොකද කියන්නේ. මුහුදු වැලි පාවිච්චි කරන්න කියනවා චිප් ගල් වෙනුවට.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

නැහැ. ගඟේවැලියි කොරිඩස් වෙනුවට.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ. කොරි ඩස් අපි පාවිච්චි කරන්නේ නැහැ. අපට මෙහෙම දෙයක් තිබෙනවා. ඉංජිනේරු කාර්යාලයෙන් ලබා දෙන උපදෙස් අපට පිළි පදින්න වෙනවා. ගරු මන්ත්‍රීවරු කියන අදහස ක්‍රියා කරන්න උත්සාහ ගන්නම්. නමුත් ඒ අදහසින් එහාට යන්න බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

නැහැ අපි එතැනට ලියන්න. අපිට මෙහෙම කළාම හරි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒ වුණාට අපට හදිසියකට අපට අවශ්‍ය වේලාවට මුහුදු වැලි ගැනිම කරන්න බැහැ. දැන් මෙහෙම දෙයක් තිබෙනවා. මුහුදු වැලි වල වාරාය ඇතුළෙන් ගන්න වැලි පිටි වැලි වගේ. ඊළඟට අපේ හිරේවත්තෙන් ගන්න එක ටිකක් ඝන වැල්ලක් හම්බ වෙන්නේ. ඉතිං අර පිටි වැල්ල මෙයට සුදුසු නැහැ. ඝන වැල්ලෙන් තමයි කරන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

මේ කියන කතාවත් බලන්න. මුදල් ඉතිරි වෙනවා නම් කමක් නැහැ.

**08:13 ඇණවුම් අංක 2337 යටතේ ගබඩාවට ඇණවුම් කරන ලද විදුලි උපකරණ වෙනුවෙන් කොළඹ ඒෂියන් ඉලෙක්ට්‍රිකල් වෙත රු.55050/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:14 ඇණවුම් අංක 2352 යටතේ ඇණවුම් කරන ලද ගර්භණී මව්වරුන් සඳහා භාණ්ඩ ලබාගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, සිහිති සළු ආයතනය වෙත රු.175730/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප්**

මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:15** රණසූරිය පාර බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.94005.45 ක් නිදහස් කිරීම පෝරමඹ, පනියන ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:16** ඇණවුම් අංක 2336 යටතේ ඇණවුම් කරන ලද විදුලි උපකරණ වෙනුවෙන් කොළඹ 11, ඒෂියන් ඉලෙක්ට්‍රිකල් ආයතනය වෙත රු.54000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:17** ඇණවුම් අංක 2349 යටතේ ඇණවුම් කරන ලද RYDALL OE ලීටර් 40 ක් සඳහා නුගේගොඩ ,යුනයිටඩ් ග්ලාස් ලංකා පුද්ගලික සමාගම වෙත රු.100,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:18** ඇණවුම් අංක 2344 යටතේ ඇණවුම් කරන ලද RYDALL OE ලීටර් 12 ක් සඳහා නුගේගොඩ, යුනයිටඩ් ග්ලාස් ලංකා පුද්ගලික සමාගම වෙත රු.30,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:19** අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 ජනවාරි මස ගමන් වියදම් ලෙස රු.87000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:20** අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිටින පාසල් ළමුන් සඳහා 2020 වර්ෂයට අවශ්‍ය වන අභ්‍යාස පොත් නොමිලේ බෙදාදීම සඳහා ලබාගැනීම වෙනුවෙන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට වෙත රු.3364068/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:21** සංඝරාජ හරස් පාර (ධර්මාශෝක ප්‍රාථමික විද්‍යාලයේ පිටුපස ගේට්ටුව අසල) කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.602082.10 ක මුදලක් ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ අනුමැතිය ලැබීමෙන් පසු කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය වෙත

**ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:22** **මහජන ක්‍රීඩාංගනයේ ලිං සඳහා කම්බි දැමීම වෙනුවෙන් රු.122980/- ක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:23** **මහජන ක්‍රීඩාංගනයේ ලිං අන්තර් සම්බන්ධ කිරීම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ කිරීම වෙනුවෙන් රු.140059.32 ක මුදලක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉනෝකා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:24** **අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ජලය රැඳෙන ස්ථානවල මැටි කැණීම් කර ඉවත් කර පස් පිරවීම සම්බනි‘දව පළාත් පාලන ඉංජිනේරු මහතාගේ වාර්තාවක් ලබාගෙන ඒ අනුව ඉදිරියේදි නැවත ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුව මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මෙහිත් ගැටළුවක් තිබෙනවා. මට එයත් අහන්න ඕන. ක්‍රිඩා පිටිය ගැන ගැටළුවක් තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මොකක්ද එක.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

පොල්වත්ත ළමා ක්‍රීඩාංගණයට පස් ගෙන එන්නේ කොහොන්ද? ඔබතුමා මා පස් කන්ද ළඟට එක්ක යන්නම්. මමත් අම්බලන්ගොඩ ඉපදුණේ. කරිච්ච පැගුවා. ධර්මාශෝකයේ ඉගෙන ගත්තේ. කියන්න කනගාටුයි. අපිත් යන්ත්‍ර සුත්‍ර හා වාහන තිබෙන අයිතිකාරයෝ.වැඩ කරන මිනිස්සු.වාහනයකට යන්න පුළුවන් දුර වේගය මේ අම්බලන්ගොඩ තුළ අපි දන්නවා.පස් කන්ද තිබෙන තැනත් දන්නවා. ලොරියට පස් පටවන්න තිබෙන වේලාවත් අපි දන්නවා. මට කරුණාකර මට මේ අහන ඒවාට උත්තර දෙන්න. එතකොට එල්. අයි . 6412 දරණ ලොරිය පැමිණෙනවා දහවල් 10.45 පස් සමඟ . දානවා දහවල් 10.50ට. පුළුවන් විනාඩි 5ට . ගැටළුව ඊළග පස් ලෝඩ් එක එනවා 11.12ට. විනාඩි 22කයි. පොල්වත්තේ සිට පස් කන්ද ළඟට යන්න පස් පටවන්න ප්‍රායෝගිකව ගැටළු තිබෙනවා. වාහනය මා අරගෙන ගිහින් අභියෝග කරනවා. මේ තිබෙන්නේ නියම සටහන්. නැතිනම් නැහැ කියන්න. මේ තිබෙන්නේ නියම සටහන්. අදාළ පොත් පත් වල. මෙයට මා සම්පුර්ණ විරුද්ධයි. මේ මුදල අනුමත කිරිමට මා සහ මාගේ

කණ්ඩායම සම්පූර්න විරුද්ධයි. ගරු සරත් මන්ත්‍රීතුමා ඔබතුමාත් දකින්න ඇති. මේ කිරිමැටි දමා තිබෙනවා. මේවාට මුදල් ගෙවලා. අපේ මේ මහජන මුදල් නාස්ති කරලා. දඩ කන්න අපි කැමති නැහැ. අපි ගරු සභාපතිතුමාට ඕනම දෙයකට උදවු කරනවා. මේ වගේ තුට්ටු දෙකේ වැඩවලට උදවු කරන්න බැහැ. මේ වගේ තුට්ටු දෙකේ වැඩ වලට. එමනිසා මම මාගේ කණ්ඩායම හා කොන්ද කෙලින් තිබෙන ජනතා විමුක්ති පෙරමුණ මෙයට විරුද්ධ වෙයි කියා. මා ඉල්ලා සිටිනවා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාටත් කියනවා මෙයට විරුද්ධ වෙන්න කියා. මේ මහජන මුදල්. කොන්ද කෙලින් තිබෙන අපට මෙයට අනුමැතිය දෙන්න බැහැ.අපි විරුද්ධයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අර කාල පාරාසය ගැන මා ගරු මන්ත්‍රීතුමා සමඟ එකඟ වෙනවා. මොකක් හරි ගැටළුවක් තිබෙනවා.හැබැයි මට තිබෙන ගැටළුව තමයි එතුමා ඉදිරිපත් කරන තර්කය. මේ පස් මොනවාගේ පස් වෙන්න කියලාද තාක්ෂණසේවා නිලධාරින් කියා තිබෙන්නේ. මොන වගේ ප්‍රමිතියක්ද පස්වලට තිබෙන්න ඕන. ප්ලාස්ටික් මෙක කොච්චරද ? ඩෙන්සිටි එක කොච්චරද ? එන්ඩිඩි එක කොච්චරද ? එහෙම ඔබලා කර තිබෙනවාද? ඔබලා පස්වල ස්වභාවය පැහැදිලි කර තිබෙනවාද? පස් වල ගල් තිබෙන්න බැහැ. වැලි මෙච්චර ප්‍රමාණයක් තිබෙනවාද ?

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

අඩුම ගණනේ ඔබතුමා ගිහින් බැලුවාද පස්. මේ පස් සාම්පල් මාර්ග සංවර්ධන අධිකාරියට හෝ රුහුණු විශ්ව විද්‍යාලයයේ ඒ අයට දීලා පරික්ෂා කරන්න කියා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඊට පසුව මුදල් ගෙවන්න අනුමැතිය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

නැහැ. පස් දෙනවිට එහි තිබෙනවා මෙන්න මේවාට අදාළ පස් ගෙන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

මෙන් කන්දේ පස්. මෙන්න කිරිමැටි. අවුරුදු 9 ඉඳලා අපිත් ගඟේ , ගොඩේ ක්‍රීඩා කරපු මිනිසුන්. හෙන ගහන අපරාධ මේ පිට්ටනි වලට කිරිමැටි දමා කරන්නේ. මේවාට අනුමත කරන්න බැහැ.මේවාට කොන්ද කෙලින් තියාගෙන මෙය අනුමත කරන්න බැහැ. ගරු මන්ත්‍රිවරුන්ට මෙය අනුමත කරන්න බැහැ. අපි සුදු ඇඳගෙන එන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා වාඩිවෙන්න. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා කතා කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**

මට තෙරෙනවා මෙතුමා කියන එක. කිරිමැටි දාන්න ඇති. මා නැහැයි කියන්නේ නැහැ. කිරිමැටි හරියන්නේ නැහැ. නමුත් මෙතැන කොන්ත්‍රාත් එකක් දෙනවිට කියන්න ඕන

මොනවාගේ පස්ද ගෙන්නේ කියා. එතකොට එයා මෙය ගෙනවිත් නැතිනම් තමයි අපිට කියන්න පුළුවන් තමුසේ මෙය කර නැහැ . පරික්ෂණයක් කරන්න කියා. දැන් ඔගොල්ලන් කියා තිබෙනවා ද මෙන්න මේ වගේ පස් කියා ගෙන්න ඕන. පොල්වත්තේ කියන්නකෝ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි සියළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අපි පස් සම්බන්ධ කරන්න පරික්ෂණ දෙකක් තිබෙනවා. ඒ පරික්ෂණ දෙක කිරිමෙන් අනතුරුව මේ ගෙවීම කරන්න අනුමැතිය දෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මට කියන්න දෙන්න එකටත්. එකටත් ප්‍රශ්නයක් තිබෙනවා. පරික්ෂණයක් කරන්නේ කොහොමද? මුලින්ම ඒ අයට මෙය කියන්නේ නැතිව. මා මේ කියන්නේ ඒ අය නිවැරදි කරනවා නෙමේ. මෙහි මේ ලියවිල්ලේ වැරැද්දක් තිබෙනවා. එහෙම නම් ඒ අයට කියන්න ඕන මෙන්න මෙවායි ගෙන්න ඕන කියා. ඊට පසු තමයි අපි පරික්ෂණය කළ යුත්තේ මෙකට අනුව තිබෙනවා ද කියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**</u>

එය තාක්ෂණසේවා නිලධාරින්ගේ වගකීම. කිරිමැටි දමන්න එහෙනම් තාක්ෂණසේවා නිලධාරින් අනුමැතිය දෙන්නේ නැහැනේ. එහෙනම් ඔවුන්ගේ ඔලුව වෙන මොකක් හරි ඔලුවක්. එය ඔවුන්ගේ වරදක්. එහෙනම් තාක්ෂණසේවා නිලධාරින් වගකිම ගන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**</u>

මේ ලියකියවිලි වල වැරැද්දක් තිබෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මහජන ක්‍රිඩාංගණයේ එකේ ඔය කියන කාරණය තිබිලා ඉවත් කළා. ඉවත් කර පස් දැමුවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්**</u>

එහෙම ඉවත් කිරිමත් අසාධාරණයි. ඒ ලියවිල්ලේ හැටියට එය අසාධාරණයි. එහෙම කරන්න බැහැ. පොඩ්ඩක් ඉන්න විපක්ෂනායකතුමා. කවුරු හරි එම පුද්ගලයාට කිව යුතුයි මෙන්න මේ පස්වර්ගයයි ගෙන ආ යුත්තේ කියා. ඊට පස්සෙයි අපට පුළුවන් වෙන්න ඕන. කොන්ත්‍රාත් එකක් දෙනවිට ඒ විදියට දෙන්න ඕන. එහෙම නැතිව ඒ මනුස්සයාට නඩු දමන්න පුළුවන් සභාවට විරුද්ධව. මට කියා තිබෙනවා පස් ගෙන්න කියා. මා පස් ගෙනාවා. කෝ ප්‍රමිතියක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්**</u>

මට අවස්ථාවක් දෙන්න. ගරු විපක්ෂනායකතුමා කිවු කතාවේ සත්‍යයකුත් තිබෙනවා. මා ක්‍රීඩා උපදේශකතුමාගේ පැත්තට කතා කරනවා නෙමේ. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාගේ අදහස් වලට මා සතුටු වෙනවා ඒ සම්බන්ධව. ඔය සියළු දේවල් පරික්ෂා කර බලා

තාක්ෂණසේවා නිලධාරිතුමා සම්බන්ධවෙලා ඕන කරන්න. ක්‍රීඩා උපදේශකතුමාට තිබෙන්නේ මේ සම්බන්ධව බලන්න. පරික්ෂා කිරීමක් අවශ්‍යයි. මුලින්ම අවධානය යොමු කරනවා. මේ සියළු දේවල් එදා සිට වෙච්ච ඔය මහජන ක්‍රීඩාංගණයයි ඔය සියළු දේවල් හරියට කෙරුණාද? මේ කාණුවල වතුර බහින්නේ නැහැ. මේ කොඩි කණු ගසා ඇති පැත්තේ කාණුවල වතුර බහින්නේ නැහැ. ක්‍රීඩාගාරය පැත්තේ කාණුවල වතුර බහින්නේ නැහැ. ආරංචියක් තිබෙනවා. හරපු පස්වලින් වැලි වලින් තාප්ප බැඳ තිබෙනවා කියා. අපේ සභාව තිබුණේ නැද්ද කොහෝ. මා ගිහින් තිබෙනවා. ඔය බොරළු දමා තිබුණා. ඔය පස්වලට. ප්‍රමිතිය ගැන කතා කරන්න ගත්තොත් එහෙම ගොඩක් ලොකු දේවල් කතා කරන්න පුළුවනි. මා මාගේ සහෝදරයාගේ පැත්තට කතා කරනවා නෙමේ. ගරු සභාපතිතුමාට සභාවේ වැඩ කරගෙන යන්න අපහසුතාවටය පත් කරන්නත් එපා. මෙතැන තිබෙනවා ප්‍රශ්න ප්‍රායෝගිකව වැඩ කිරීමේදී. තමන්ට දේශපාලන කරන තුරු එම පුද්ගලයා හොඳයි. තමන්ට දේශපාලනය නොකරන විට තමන්ට එම පුද්ගලයා අවශ්‍ය නැහැ. දේශපාලන පක්ෂ පාට හයිය ඒවා වැදගත් නැහැ. මා නම් කාගේවත් පුද්ගලයින් කියන දේවල් අසා වැඩ කරන කෙනෙකු නෙමේ. මා නිලධාරින් ආරක්ෂා කරන්නෙත් නැහැ. සියළු දෙනාම වගකිව යුතුයි අපි ගරු මන්ත්‍රීවරු. හොයන්න. මා අනිවාර්යෙන්ම සභාව දැනුවත් කරනවා. අනිවාර්යෙන්ම මේ සම්බන්ධව කටයුතු කරන්න ඕන. පරික්ෂන අනිවාර්යෙන්ම අවශ්‍යයි. නගර සභා පොත්වල ලියවිලා තිබෙන්න ඕන . පස් ගෙනඑන විට. මේ පරික්ෂා කර බලා ගත යුතුයි. මේ වගේ දේවල් තිබෙනවා මා දන්න තරමින් නගර සභාවේ. දාන වේලාවල් සමහ සඳහන් වෙලා තිබෙනවා. කලින් වැඩ කිරීමේදී ඔය අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. ඕවා කවුද කතා කරන්නේ. ඒවා කවුද කතා කරන්නේ. ක්‍රීඩා උපදේශක මහතා නෙමේ පරික්ෂණ වාර්තාවක් ලබා දිය යුත්තේ ගරු නගර සභා මන්ත්‍රී
ලලිත් ධම්මික මහතා කිවු ආකාරයට. මාගේ සහෝදරයා. මේ ක්‍රීඩා උපදේශකවරයා. මා දන්නා විදියට තේ උගුරක් මෙතුමා බොන්නේ නැහැ. බිලත් නැහැ. ඒක තමයි ඇත්ත කතන්දරය. එතුමා ක්‍රීඩා කළ පුද්ගලයෙකු විදියට ක්‍රීඩාවට ආදරය කරන පුද්ගලයෙකු විදියට අපිත් ක්‍රීඩා කළ පුද්ගලයෝ විදියට අපිත් ආසයි මේ ක්‍රීඩාංගණය හදන්න. ගරු සභාපතිතුමා අපහසුතාවයට පත් කරන්න වත් , කවුරුවත් අපහසුතාවයට පත් කරන්නවත් නෙමේ. ගරු සංවිධායකතුමා කියන කතාවලත් ඇත්තක් තිබෙනවා. අපේ ගරු සහෝදර මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කියන දේවලුත් වල පොඩි ඇත්තක් තිබෙනවා. වරද නම් වරද කොහේ වුණත්. ඒවත් ලියලා හොයන්න එපැයි. එවත් හරියට කෙරිලා නැතිනම් එවත් හරලා ගන්න ඕන. කොන්ත්‍රාත් කතන්දර තිබෙනවා මෙතැන. මා කියන්නේ සියළු ගරු මන්ත්‍රීවරුන් හරි දේ කතා කරලා ගරු සභාපතිතුමාට උදවු කරලා මේ ක්‍රීඩාංගණය බාලගිරි දෝෂය වගේ පහුවෙන්න බැහැ. අපේ තනායමට , ක්‍රීඩාංගණයට වසර 5කි. ධර්මාශෝක විද්‍යාලයේත් දේවානන්ද විද්‍යාලයේත් ක්‍රිකට් තරඟ මෙහේ තිබුණේ නැහැ. එවා මොරටුවේ පැවැත්වුවේ. කිසිම හේතුවක් නිසා මේ ක්‍රීඩාංගණය අපහසුතාවයට ලක් කරන්න එපා. කල් දමන්න අවශ්‍ය නැහැ. පරික්ෂා කර වාර්තාවක් ලබා දුන්නා නම් හරිනේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි එය පරික්ෂණ වාර්තා ලබා ගැනිමට හෙට යවන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මට අදහසක් ඉදිරිපත් කරන් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. මේ ගරු සභාවේ දෙසැම්බර් මාසයේ අනුමත කරනවා . කිරිමැටි ඉවත් කර පස් දැම්මට. එතකොට ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාණෙනි, සමාවෙන්න. ඔබතුමා ඉංජිනේරුවරයෙක්. මාගේ මිත්‍රයා . මා ගරු කරනවා ඔබතුමාට. එතකොට සිංහල භාෂාවෙන් තියෙනවා. කිරිමැටි ඉවත් කර පස් දමන්න. හත්ඉලව්වේ යකෝ මේ කිරිමැටි ඉවත්කර පස් දමනවා නම් මේ හත්ඉලව්වක්ද දමා තිබෙන්නේ. මෙයට ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා, ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතාත් පැමිණියා. මට දුරකථන ඇමතුම් 10ක් විතර පැමිණියා.ක්‍රීඩා කරපු පුද්ගලයන්ගෙන් ආවා. නොකරන පුද්ගලයන්ගෙන් පැමිණියා. මා එවිට ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතාගෙන් කතා කර ඇහුවා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගෙන් කතා කර ඇහුවා. මෙය බලන්න . මෙයට කිරිමැටි දමනවා කියා දුරකථන ඇමතුම් එනවා කියා. මමත් උදේම එනවිට තමයි ඔබතුමාත් මෙතනට පැමිණියේ. එතකොට අපේ ඇස්දෙකට දැක්කා. කිරිමැටි. මෙයට වතුර පිරුනාම වතුර බහින්නේ නැහැ. මොකටද මෙහි අපි මැටි ඉවත් කර පස් දමන්න කිවුවේ. ගෙන ආ තැන දන්නවා. දුර දන්නවා. මට කිසිම දේශපාලන භේදයක්වත් කිසි ප්‍රශ්නයක්වත් ක්‍රීඩා උපදේශක අශෝක මහතා සමඟ ප්‍රශ්නයක් නැහැ. කිසිම දෙයක් නැහැ. එතුමාට සහෝදරයෙකුට වගේ සලකනවා. මා ඇසුවා. මොකද අපිට වැඩිමහල්. අපි කුඩා කාලයේ මේ ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කළා. මා අහුවා අශෝක අයියේ ඔයාට පෙනුනේ නැද්ද මේ කිරිමැටි දමද්දි. මොකද මා එහෙම ඇසුවේ. සහෝදරයෙකුට වගේ සලකනවා. මොන භේදයක්වත් නැහැ අපි අතර. හැබැයි මහජන මුදල් . මෙහෙම දාන්න දෙන්න බැහැ. එමනිසා මා මේ 08.24 ටත් කිසි සේත් මා අනුමත කරන්නේ නැහැ. සම්පූර්ණ ක්‍රීඩාංගණයේ තිබුණේ කිරිමැටි. ඔබතුමා දැක්කා. සම්පූර්ණ කිරිමැටි පුපුරලා තිබෙනවා. අව්වට ඉරි තලා තිබුණා. එතකොට මේ කිරිමැටිවලට වතුර වැටුණාම බහින්නේ නැහැ. මෙය පරීක්ෂා කර බලා වාර්තාව දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. මට කතා කරන්න දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා පරීක්ෂණය පවත්වන්නම්. එය කළාම අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පරීක්ෂණය කරන්න. මත දෙකක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බොරුවට කෑ ගහන්න දෙයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

බොරුවට කෑ ගහන්නේ නැහැ. මෙය නිවැරදි කර ගන්න ඕන. දැන් මෙහෙමයි. මේ ක්‍රීඩාංගණය සැදීමට මෙහෙට ඉදිරිපත් කළාම ක්‍රිකට් බෝඩ් එකෙන් අනුමත කරන්න. අපි

ඇහුවා මෙය අධික්ෂණය කරන්න නගර සභාවට තිබෙන බලය මොකක්ද ? අපිට ලැබෙන බලය. අපි තින්දුවක් ගත්තා තාක්ෂණ නිලධාරිගේ උපදෙස් මත ඒ කටයුතු කරන්න. එතකොට ඔය ප්‍රශ්නය එදා වෙච්ච වෙලාවේත් මා ඇසුවා තාක්ෂණ නිලධාරිගෙන්. ක්‍රිඩා භූමි භාරකරුවත් කොන්ත්‍රාත්කරු වත් එක්ක කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද ඒ අය මේ වැඩය කරන්න ඕන. ඒ අය අධික්ෂණය කිරීමේ බලය සභාවෙන් පැවරුවාට පසුව එය පවරනවා අපේ තාක්ෂණසේවා නිලධාරිට. එතුමා කිවුවේ මට ලිඛිතව මේ බලය පැවරිලා නැහැ කියා. ඔන්න ඔතන තමයි ගැටළුව තිබෙන්නේ. ඉතිං මෙතුමාට කොහොත්ම කතා කරන්න අයිතියකුත් නැහැ. මේ සම්බන්ධව. මා අහන්නේ එකයි. අපේ තාක්ෂණ නිලධාරි . මෙහෙමයි කාට වුණත් කන්න ඕන වුනාම කබරගෝයා තලගෝයා වගේ පෙනෙනවා. එක වෙනම කතාන්දරයක්. මෙතුමා ගෙනා ආ යෝජනාවත් හරි. ඔතන ගන්න තිබුණු තර්කය අතනට. ඔබතුමාට යන්න තිබෙන්නේ එක. වැඩේ වකුරු වුණාට පසු වැඩක් නැහැ. පස් සැපයු කෙනාට වත් කාටවත් දොස් කියන්න බැහැ. අපි දැනගන්න ඕන. අපේ බලය තියාගෙන තාක්ෂණ නිලධාරිතුමාගෙන් වැඩය කරගන්න. මා අසනවා ලේකම්තුමියගෙන් බලය පැවරුවේ නැද්ද? මේ ක්‍රිඩාංගණය සම්බන්ධව. දැන් මෙතැන තිබෙන ගැටළුව පස්ටික දැම්මා කිරිමැටි ඉවත් කරලා. අපිට තිබෙන්නේ එතුමාගේ නිර්දේශය තමයි. කිරිමැටි ඉවත් කලාද නැද්ද කියා. එතුමා දෙන්නේ නැතිනම් අපි මොකක්ද කරන්නේ. ඔකනේ තත්ත්වය තිබෙන්නේ. ප්‍රශ්න ගැටළු වෙලා තිබෙන්නේ එක. අනිත් එක තමයි මේ පස් ඕනෑම ක්‍රිඩාංගණයකට දමන විට පරික්ෂණ වාර්තාවක් ලබා ගත යුතුයි. අපි දන්නේ නැහැ මෙය කිරිමැටිද මොකක්ද කියන එක අපි දන්නේ නැහැ. නමුත් මෙයට පරික්ෂණ වාර්තාවක් ලබා ගත යුතුයි. කියුබ් කරන්න ඕන. හරියට නම්. මේතුළ . නිත්‍යානුකුල විය යුතුයි. අපිට අනුමත කරන එක වෙනම කතන්දරයක්. මේ නිත්‍යානුකුල රාමුව කෙරෙන්න ඕන. එය නොකිරිම අපේ වරදක් වෙනවා අපි අනුමත කළාම. ඕක ඔය එකක්. අනිත් එක තමයි අර කිරිමැටි ඉවත් කරන්න කියන තැන කිරිමැටි ඉවත් කර නැහැ කියන එක තමයි ඇවිත් තිබෙන්නේ. මොකක්ද අර කිරිමැටි ඉවත් කර පස් දමන්න කිව්වානේ. ඒක හොඳයි කියා. එක හොඳයි කියනවා නම් ඒක දමා ප්‍රශ්නයක් ඇතිකරගන්න ඕන නැහැනේ. පරික්ෂණ වාර්තාවක් ලබාගෙන ඔය තත්ත්වයට ගියානම් ඉවරයි. එමනිසා අපි මේ ගෙවීමක් කරන්න මේ නිත්‍යානුකුල පදනම එන්න ඕන. එක මට කියන්න බැහැ. මේක මොකක්ද කින්ද මන්ද කියා. එයට තාක්ෂණ නිලධාරිතුමා හරි ඉංජිනේරුතුමා හරි නිර්දේශ කර එනවා නම් අපිට පිළිගන්න පුළුවන්. නැතිනම් අපිට මෙය අවාට ගියාට කතා කර ප්‍රශ්න විසඳන්න බැහැ. මෙය හදන්න ඕන. හදන්න නියමාකාරයෙන්. මෙය මහජන මුදල්. අතිගරු ජනාධිපතිතුමාත් බලාපොරෝත්තු වෙන්නේ හරියට පිරිසිදුව මේ වැඩය කරන්න. එමනිසා එතුමාගේ සංකල්පය අනුව මේ මහජනතාවට සේවය ලබා දෙන්න හරියට කරන්න ඕන. එමනිසා අපිත් මෙයට සහායෝගය දෙනවා. එදා කිරිමැටි ඉවත් කර පස් දාන්න ඇසුවාම මා ඇහුවා කලින් මෙහි පස් පිරවුවා නේද කියා. ඒ වේලාවේ ගරු උප සභාපතිතුමා දුන්නා පිළිතුර. මොකද මෙය මට්ටම් වුණේ නැහැ. එමනිසා එය අස්කලා කියා. අපි එකට අනුමැතිය ලබා දුන්නා. අපි බලාපොරොත්තු වෙනවා විශ්වාසයෙන්. ගරු සභාපතිතුමාටත් කරන්න දෙයක් නැහැ. ගරු සභාපතිතුමාට අපි අනුමැතිය දෙනවා. දුන්නාම නිලධාරින් දැන දැන ගන්න ඕන. ලේකම්තුමිය සොයා බලන්න ඕන. මෙතුමාට තාක්ෂණසේවා නිලධාරි වශයෙන් ඒ පණතින්ම දි තිබෙනවා. මෙතුමා තින්දුවක් ගත්තාම ඒ තින්දුව ක්‍රියාත්මක කරන්න නිසි ලෙස. ඒ තාක්ෂණික පැත්ත එතුමා කරන්න ඕන.

එතුමාට බලය පවරලා නැහැ කිවුවාම අපිත් අසරණ වෙනවා. එකයි වේලා තිබෙන්නේ . අපි මේවාට බලය පවරනවා වගේම මුදල් ගෙවන කොට ඒ ක්‍රමවේදය අනුගමනය කර තමයි මුදල් ගෙවන්නේ. ප්‍රශ්නයක් ගැටළුවක් වෙන්න නෙමේ. කවුරු හරි කිරිමැටි දැම්මා නම් පරික්ෂණ වාර්තාවෙන් කිරිමැටි නැහැ කිවුවා නම් එය සභාව පිළි ගන්නවා. එම නිසා ඒ අදාළ කටයුතු කරන්න. මෙහෙමයි අපි මේවාට අත එසෙව්වා වගේ නෙමේ මේවා මහජනතාව බලාගෙන ඉන්නවා. ගරු මන්ත්‍රිවරුන්ට දොස් කියනවා. මෙතැන ගෙන එන තර්ක විතර්ක වගේ නෙමේ මහජනතාව මේවා බලාගෙන ඉන්නවා. දැන් දුරකථන ඇමතුම් දී සමහර උදවියට දොස් කියනවා. දොස් කිවුවාම මජහනයා දන්නේ නැහැ. මෙය මෙහෙමයි කියා. මෙය බැලුවාම කිරිමැටි නෙමේ කියා. නමුත් අපිට අර වාර්තාව බැලුවාම කියන්න පුළුවන්නේ කිරිමැටි නෙමේ කියා. මෙහි කිරිමැටි නැහැ. අදාල ඉංජිනේරු මහතා මෙය දීලා තිබෙනවා. එමනිසා ඒ අදාල කටයුතු කරන්න. හදිස්සියි මේ වැඩය. වැඩක් කර බැණුම් අහනවාට වඩා හොඳයි මේ වැඩය නොකර ඉන්න එක. එම නිසා හරියට වැඩය කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව දෙන්න කතා කරන්න. මට මෙතැන චෝදනාවක් පැමිණියා. පලමුව මහජන නියෝජිතයන් වශයෙන් අපි මෙතැනට ඇවිත් වැරදි පෙන්වා දෙන්න ගිහින් දෝෂාරෝපණය ගෙන එන එක අපි දැඩිසේ හෙලා දකිනවා. මම දිගින් දිගටම එය කියන්න යන්නේ නැහැ. මෙතැන අපේ ගරු නගර සභා මන්ත්‍රි අතුල මහතා චෝදනාවක් කළා කාණුවල වතුර බහින්නේ නැහැ කියා. මා වෘත්තියෙන් කොන්ත්‍රාත්කරුවෙක්. රජයේ කොන්ත්‍රාත්කරුවෙක්. මා තමයි ඔය ක්‍රිඩාංගණයේ කොන්ත්‍රාත් එක කරනු ලැබුවේ. එතකොට මේ සභාව නැහැ. මා දිස්ත්‍රික් ලේකම්තුමාගේ තිබුණ ටෙන්ඩර්පත් වල තිබුණ ටෙන්ඩරයක් ගෙන ටෙන්ඩරය දමා අඩුම ලංසු කරුවා වශයෙන් මට භාර දුන්නා. ඒ අනුව මෙය අධික්ෂණය කරනු ලැබුවේ CECB එක. ඒ අනුව ඒ අයගේ උපදෙස් අනුව තමයි වැඩ කරනු ලැබුවේ. මේ තාක්ෂණ සේවා නිලධාරින් දන්නවා ඇති. අපි කාණුවක් කරනවා නම් එය ලේවල් කරලා කළ යුතුයි. මට එ තාක්ෂණිකදැනුම නැති නිසා මා මිනුම්දොරුවෙකු මුදල් ගෙවා ගෙන තමයි කාණුව ලේවල් කරනු ලැබුවේ. එමනිසා කාණුවේ වතුර බහින්නේ නැති එක ගැන මම කතා කරන්න යන්නේ නැහැ. මා මේ සියළු ගරු මන්ත්‍රිවරුන්ට ආරධනා කරනවා මේ සභාව අවසන් වුණාම මා පෙන්වන්නම් එම කාණුවල වතුර බසින්නේ නැති හේතුව මෙතෙක් කල් එම ක්‍රිඩාංගණයේ වතුර බැස්සා මේ කාණුව හැදුවාට පසු. ඊට පසු වතුර බසින්නේ නැති තත්ත්වයක් තිබෙනවා අහල් දෙකක. එම වතුර බසින්නේ නැති හේතුව මා පෙන්වන්නම්. මා මෙතැන ගරු උප සභාපතිවරයෙක්. මට චෝදනාවක් පැමිණි නිසා මා කියන්නේ. එන්න . මා වතුර බසින්නේ නැති හේතුව කියන්නම් මොකක්ද කියා. එක එකක්. අපි තාක්ෂණසේවා නිලධාරි මහතුන් වෙනුවෙනුත් සාධාරණයක් ඉෂ්ඨ කරන්න ඕන. මා ගරු ලේකම්තුමියගෙන් අසනවා ක්‍රිඩා අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධව ඇස්තමේන්තුවක් එවා තිබෙනවා ද? තාක්ෂණසේවා නිලධාරින්ට අධික්ෂණය කරන්න ඇස්තමේන්තුවක් එවා තිබෙනවාද ? දැන් මේ කොන්ත්‍රාත් එක පිරිනමා තිබෙන්නේ ක්‍රිකට් බෝඩ් එකෙන්. එතකොට ක්‍රිකට් බෝඩ් එකත් එක්ක අපි ගිවිසුම් ගතවෙලා තිබෙන්නේ. එතකොට අපි මේ ගෙවීම් කටයුතු කරන්නේ

නගර සභාවේ තාක්ෂණසේවා නිලධාරින්ගේ අනුමැතිය යටතේ කියා. එතකොට ඒ නිලධාරින්ට අනුමත කරන්න අඩුම ගණනේ ඇස්තමේන්තුව වත් තිබෙන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඇස්තමේන්තුව තිබෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා දන්නේ නැහැ තිබෙනවා ද කියා. ඔබතුමාට ඇස්තමේන්තුව හම්බ වුණාද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඇස්තමේන්තුව තිබෙනවා.ඒ දි තිබෙන්නේ ටෙන්ඩර් ලියකියවිලි වලට දිපු මේවා. එවා අනුමාන කර තමයි දමා තිබෙන්නේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා ගත්තා . මා ළඟ තිබෙනවා. මට කතා කරන්න දෙන්න. මට මෙතැන නිලධාරින් ආරක්ෂා කරන්න ඕන නැහැ. යම්කිසි කර්මාන්තයක් කරන්න නිලධාරින් ඉන්නවා නම් නිලධාරින්ට දෙන්න ඕන අධික්ෂණය කරන්න එහි ජායා පිටපතක්. අඩුම ගණනේ. මේ අත්සන් කළ ඇස්තමේන්තුවේ ජායා පිටපතක් දෙන්න ඕන. නැතිනම් ඒ නිලධාරියා දන්නේ නැහැ මේ පස් කොච්චරද වැටෙන්නේ , කොච්චර ප්‍රමාණයක් වැටෙනවාද ? මෙහි මොනවාද ගෙවීම් කරන්නේ . මෙහි ගරු සභාපතිතුමනි, හිස් කොළයක් තිබෙනවා. කරුණු ටික විතරක් තිබෙනවා. මෙහි ප්‍රමාණ නැහැ. මුදලක් නැහැ.මා නම් දැක නැහැ. මා වසර 27ක කාලයක් කොන්ත්‍රාත් කරනවා.1993 වර්ෂයේ රජයේ කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් බැදුනේ.එම නිසා මටත් අත්දැකිමක් තිබෙනවා. මාගේ ජීවිතයට මා දැක නැහැ ඔය වගේ එකක්. එමනිසා මට පැමිණි චෝදනාව ගැන ඔබ සියළු දෙනාම ගිහින් බලන්න. මා දන්නවා මට මෙය එනවා කියා. මා මීට වඩා ප්‍රකාශ කළා මට මේ වගේ ප්‍රකාශයක් එනවා කියා.මා ඒ ගැන කතා කරන්නේ නැහැ. ප්‍රබන්ධ කතාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් කැලැවක සිංහයෙකුයි ඌරෙකුයි සිටින විට මේ සිංහයා හැමදාම ඌරන්ට පාට් දානවා. ඌරා බැලුවා මුට දෙන්න ඕන පාඩමක් කියා. ඌරා කල්පනා කර බලා මුට දෙන්න පුළුවන් හොඳම පාඩම තමයි ඌරා ගිහින් බහිනවා ආසුචි වළක. එම වළට බැහැලා සිංහයාට කියනවා එන්න ඉදිරියට සටන් කරන්න. මේ ඌරා කියන්නේ ආසුචි වළේ බැහැලා ඉදලා. ඉතිං සිංහයා කැලේ සිටින දරුණුම සතානේ. සිංහයා බලනවා මා මේ ආසුචි වළේ සිටින ඌරත් සමඟ රණ්ඩු වෙන්න ඕන නැහැනේ. ඒ වගේ මා ඒ තත්ත්වයට අද වැටෙන්නේ නැහැ. එමනිසා මා ඉල්ලා සිටිනවා සියළු ගරු මන්ත්‍රිවරුන්ගෙන්. ඔය මට කරන ලද චෝදනාව ගැන. මා වෘත්තියෙන් කොන්ත්‍රාත්කරුවෙක්. ගරු සභාපතිතුමා නිතිඥ මහතෙක්. මෙතුමා ව්‍යාපාරිකයෙක්.බොහෝ අය ව්‍යාපාරික කටයුතු කරනවා. එතකොට මට ජීවත් වෙන්න මා කොන්ත්‍රාත් කරනවා. ඒක කාටවත් නතර කරන්න බැහැ. මෙතුමාන්ලා හැම දෙනාම රාක්ෂාවල් කරනවා. රාක්ෂාවක් නැතිව මෙතුමන්ලා කිසිම කෙනෙකුට ජීවත් වෙන්න විදියක් නැහැ. හොරකම් කරන්න බැහැනේ. මා ඒ ප්‍රකාශ කළ ඌරා ට කියන්නේ ආසුචි නාලා ඇවිත් සිංහයොත් එක්ක හැපුණාම ඔහොම දේවල් වෙනවා. එමනිසා මා සියළු

දෙනාටම ආරධානා කරනවා. වතුර බසින්නේ නැති හේතුව බලන්න කියා. මා එවිට පෙන්වන්නම් වතුර බසින්නේ නැති හේතුව. මා ක්‍රිඩාංගණයට පැමිණියේ ගරු සභාපතිතුමා මට කතා කළා. ගරු විපක්ෂනායකතුමා, ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රි සරත් මහතා පැමිණ තිබෙනවා . එම නිසා ක්‍රිඩාංගණයට එන්න කියා. දුරකථන ඇමතුමක් දුන්නා. මා ඒ අනුව තමයි ගියේ. මා ඊට දින දෙක තුනකට උඩදී මා ගරු සභාපතිතුමාට කිවුවා මේ ක්‍රිඩාංගණයට දමන්නේ කිරිමැටි කියා. අපි බප්පු නෙමේ. මා ගරු සභාපතිතුමාට අතට ගෙන පෙන්නුවා. මගෙන් ජනතාව අහනකොට මා කිවුවා කිරිමැටි තමයි දමන්නේ. ඇත්තට කිරිමැටිනේ දමා තිබෙන්නේ.ඔබතුමා පිළිගන්නවාද කිරිමැටි නෙමේ කියා. මා කියන්නේ පරික්ෂණ වාර්තාවක් ගෙන ගෙවන්න. මා කියන්නේ නැහැ. කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන්න එපා කියා. කොන්ත්‍රාත්කරුවන් ඉතා අමාරුවෙන් ජිවත් වෙන්නේ. බැංකු ණය ගෙව ගෙව. ගෙවන්න පරික්ෂණ වාර්තාව ගෙන. මා සියළු දෙනාටම ආරාධානා කරනවා. මට චෝදනා එල්ල වු නිසා වතුර බසින්නේ නැති හේතුව මා පෙන්වා දෙන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>

මට කතා කරන්න අවස්ථාව දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පිළිතුරු දෙන්න අවශ්‍ය නැහැ. ඔබතුමා වැඩක් නැහැ එකට. මා මෙයට උත්තරය දෙන්නම්.සභාව විනාඩි 10 කට කල් තබන ලදී.

- **පෙරවරු 11.30 ට පමණ ගරු සභාව කල් තබන ලදි.**
- **පෙරවරු 11.40ට ගරු සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සභාව ආරම්භ කරනවා. ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවිය කතා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අවේගශිලි වෙන්න එපා. ගරු සභාවේ මන්ත්‍රිවරුන්ගෙන් මේවාගේ ප්‍රශ්නයක් පැමිණියානම් අපි සත්භාවයෙන් මේවා කරනවා නම් විනිවිදභාවයෙන් මේවා කරනවානම් අපි කලබල වෙලා කෝපවෙලා වැඩක් නැහැ. මිට කලිනුත් ඔබතුමා සභාවේ වැඩ කටයුතු කරන විට කොන්ත්‍රාත් එකක් කරන විට අප සමඟ ගිහින් පරික්ෂා කර බලා වාර්තා ලබා ගෙන තිබෙනවා. අපි දන්නවා පස් එහෙම ගෙනාවාම ෆයිල් කරලා ගිහින් අපිත් ඒවාට සම්බන්ධ කරගෙන ලස්සනට මිනුම් කර තමයි කටයුතු කරනු ලැබුවේ. ඇත්තටම මේවා හදිස්සියි කියා එහෙම කරලා . අපිට මේවාට අධිහාර වෙලා සභාවෙන් ගියාට පසු මේවා ගෙවන්න මුදල් නැහැ. අපි මේවාගෙන් හොරකම් කර නැහැ. අපි හොරකම් කරන්නෙත් නැහැ. එම නිසා අපිට ඇත්තටම අධිහාර වෙන්න බැහැ. මේ සභාවෙන් ගියාට පසු. අපි එහෙම මුදල් උපයා නැහැ. එමනිසා අපි එහෙම කර නැහැ. මා අනිත් ගරු මන්ත්‍රිවරු ගැන දන්නේ නැහැ. මා

කියන්නේ මා ගැන. අපි එහෙම කර නැහැ. අපි මේ සභාවෙන් ගිය පසු අපට මුදල් නැහැ එහෙම ගෙවන්න. එම නිසා මා කියන්නේ අපි නිදහස් කොට කරන්න. ප්‍රශ්නයක් ඇති වුණොත් අපට ගෙවීම් කිරීමේ හැකියාව නැහැ.ගරු උප සභාපතිතුමා හා ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා අතර වුණත් ප්‍රශ්න ඇතිවෙන්නේ මේවා නිත්‍යානුකූල අයුරින් සිදු නොකිරීම නිසා . ඔබතුමා කියනවා අපි ක්‍රීඩාංගණය හදනවාට විරුද්ධයිලු. මා හිතන්නේ නැහැ මෙතැන සිටින කිසිම ගරු මන්ත්‍රීවරයෙක් මේ ක්‍රීඩාංගණය හදනවාට විරුද්ධ වන්නේ නැහැ කියා. අපි එය ඉතාමත් අගය කළ යුතු දෙයක්. අපි පසුගිය කාලයේ ලේකම්තුමිය පාලනය කරන කාලයේත් අපි මේ ගැන සොයා බැලුවා. මෙය ඉක්මනින්ම හදා අවසන් කරන්න කිවුවා. මෙය අම්බලන්ගොඩ ක්‍රීඩාංගණය. සියළුම ක්‍රීඩකයෙන් , සියළුම පාසැල් දරුවන් ක්‍රීඩා කරන්නේ මෙතැන. දැන් ඔබතුමා කියනවා අපි ක්‍රීඩාංගණය හදනවාට විරුද්ධයි කියා. ඇත්තෙන්ම එම වචනය ඉල්ලා අස්කරගන්න ඕන. අපි කිසිම දිනක ඒ වගේ චේතනාවකින් ඇවිත් නැහැ. අපට ඕන අපේ සංවර්ධන වැඩ කරනවා නම් අම්බලන්ගොඩ ජනතාවගේ සංවර්ධනය සිදු වෙනවා නම් එම ක්‍රීඩා කෞශල්‍යයන් දියුණු කරන්න ඒ සහයෝගය ලබා දෙනවාට අපි කැමතියි. ප්‍රශ්න ඇති කරගන්න එපා. ප්‍රශ්න ඇතිකරගෙන අපේ මේ සභාවම ප්‍රශ්නයක් කර ගන්න එපා. එමනිසා තාක්ෂණසේවා නිලධාරින්ට උපදෙස් දෙන්න. මොකද අපට තාක්ෂණ දැනුම නැහැනේ. එතුමාලා ඉන්නේ ඒකට තමයි. ඒ අවශ්‍ය කරන පිළිවළට. ගරු ලේකම්තුමියත් ඒ අවශ්‍ය කරන ලිපිලේඛණ වලට අත්සන් කළ යුත්තේ හොඳින් බලා. අපට හැම දෙයකටම අඟිලි ගසන්න බැහැ. අපට ඒ තාක්ෂණ දැනුම නැහැ. නමුත් ගරු නගර සභා මන්ත්‍රී කොඩිකාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතා එක එක අංශ වලට යොදවනවා. අපට ඒ ගැන දැනුමක් තිබෙන කෙනෙක් තමයි ඒ සම්බන්ධව අපි යොදවන්නේ. එමනිසා අපිව නිදහස් කරන්න. අපිට මේ මුදල් නැහැ . මේ සභාවේ සිට ගියාට පසු මේවාට ගෙවන්න. මා ගරු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ කරන වැඩය සාර්ථකව සිදු කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට සහාය දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙතැන කලින් වැලි තිබුණ තැන් කොච්චර හැරුවාද දන්නේ නැහැ. ප්‍රමාණය කොච්චරක්ද දන්නේ නැහැ. අපි දන්නේ නැති නිසා අහන්නේ. තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි කොච්චර හැරුවාද දන්නේ නැහැ. එතැන යට පස් කොච්චර හැරුවාද දන්නේ නැහැ. මේ පස් සාම්පල් එම පරික්ෂණ වලට යවන විට අපි ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එතැනට කැඳවා පස් සාම්පල් හරින්න. පුරවපු ටික. අපි ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් එතැනට කැඳවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මටත් එන්න කිවුවා. අපි දැක්කා එහිදි එක පැත්තක් සුදු පාටයි. ඉන් පැහැදිලිව පෙනෙනවා . පස් වර්ග දෙවර්ගයක් කියා. අපි මේ ගොඩනැඟිලි ආදිය සැදුවාට අපි ඒ සියළු තාක්ෂණය දන්න අය නොවේ. යම් සාමාන්‍යය කෙනෙක් මේ පිළිබඳව දන්නවා වෙන්න පුළුවන්. නමුත් අපි මේ තාක්ෂණසේවා නිලධාරින් යොදවන්නේ එතැනට. ඔවුන්

කෙරෙහි විශ්වාසය තබා. ඒ ඒ නිලධාරීන්ට වැටුප් ගෙවා එතැනට පත් කර තිබෙන්නේ ඔවුන්ට යම්කිසි රාජකාරියක් නිතැතින්ම පැවරෙනවා. මෙහිදි පෙනි යන කරුණක් තමයි එම තාක්ෂණසේවා නිලධාරීන්ගේ කටයුත්ත නිසියාකාරව ඉෂ්ටවෙලා නැහැ කියන එක. ඒ වුණත් මා ක්‍රීඩාංගණ ඉදිකරන කාර්යේ නිරත වෙලා නැති වුණත් මට එතැන ගිහින් ඇතිවුණ සාකච්ඡාවේදි තෙරුණ දෙයක් තමයි ටොන් 1000න් කැපුවාම පසට වතුර උරන්නේ නැහැ කියා. උඩින් ගලාගෙන යාමක් විතරයි සිදු වන්නේ කියා. එතකොට ආපහු කියනවා කිරිමැටි දැම්මාම වතුර උරන්නේ නැහැ කියා. එතකොට මේ කතාවේ පරස් පරයක් තිබෙනවා. මේක තාක්ෂණික ප්‍රශ්නයක්. එමනිසා අපි ගරු මන්ත්‍රීවරු හැටියට මේවා අනුමත කරනවා.අන්තිමට අපිටත් මේවාට වග උත්තර බඳින් සිද්ධ වෙනවා. අපි හිතනවා තාක්ෂණසේවා නිලධාරීන් මෙය හරියට ඉෂ්ඨ කරයි කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඔවුන්ගේ කාර්ය භාර්ය තමයි මේ ඉටු කරමින් සිටින්නේ. ඒ ගැන අපි සංතෝෂ වෙනවා. මේ සභාවේ වැඩ කටයුතු සිදු කරගෙන යාමේදි විශේෂයෙන්ම ක්‍රීඩා කමිටුවේ ඔබතුමාත් වාඩි වෙනවා. ක්‍රීඩා කමිටු සියල්ල නියෝජනය වෙනවා. විශාල ප්‍රශ්න මෙහි තිබෙනවා. ක්‍රිකට් තරඟ වසර 5ක් ගැසුවේ නැහැ කියනවා. මානාන ක්‍රීඩාංගණය පමණයි පොඩි දරුවන්ට ක්‍රිකට් ක්‍රීඩා කරන්න. ඊළඟට කානිවල් එකක් ඉල්ලුවාම එක ආපහු දෙනවා. මේ සියළු දේ මේ සුළු නිලධාරීන් විසින් ආරක්ෂා කළ යුතුව තිබෙනවා. ඉටු කළ යුතුව තිබෙනවා. අපි මොන ආකාරයෙන් කෑ ගැසුවත් මේ හතර පස් දෙනා පමණයි මේ කටයුත්ත කරන්නේ. මේ කියන තත්ත්වය යටතේ අපි මේ කියන කාරණය කරගෙන යන්නේ කොහොමද කියන සාර්ව සාධාරණ ගැටළුව මට තිබෙනවා. මා විරුද්ධ පක්ෂයට විරුද්ධ නැහැ. මා එකඟයි. මා ඒ අය එක්ක ඉන්නේ. හැබැයි ඒ හා සාමනවම මට තිබෙනවා නිලධාරීන්ගේ පැත්තත් හිතන්න මේ අය මේ දේවල් කරන්නේ කොහොමද කියා. එ අය ඉංඝාබංගත්වයට පත් කරන්න බැහැ. විශේෂයෙන්ම පොල්වත්ත ක්‍රීඩාංගණයේ පස් කියුබ් 15 ගැන විශාල ගැටළුවක් නොතිබුණත් අපට ගැටළුවක් තිබෙනවා මහජන ක්‍රීඩාංගණයේ. මහජන ක්‍රීඩාංගණය විශාල මුදලක් යොදවා නගර සභාවෙන් කළා වුණත් ක්‍රිකට් බෝඩ් එකෙන් කළා වුණත් විශාල කාර්ය භාර්යයක්. මෙහිදි මා දකිනවා එය නිවැරදි ආකාරයෙන් තිබිය යුතුයි.අපට ලැබිය යුතුයි. හැබැයි අපි මෙය හදන්න ලංකාවේ සිටින සුදුසුම පුද්ගලයාට තමයි මෙය භාර දී තිබෙන්නේ. එතුමා ඒ සුදුසුම පුද්ගලයෙක්.මේ වනවිට එතුමා ක්‍රීඩාංගණ 15කට වඩා ගොඩනගා තිබෙනවා. එතකොට එතුමාගේ අවසානය දක්වා අපට ඉවසන්න වෙනවා. මාගේ පුද්ගලික මතය. හැබැයි අපේ මේ ගරු මන්ත්‍රීවරු කියන විදියට ඔහුගේ නිර්දේශය මේ මැටි එයට එකඟ වෙන්න පුළුවන්. හැබැයි මට දැනුම නැහැ ඒකට. සමහර විට ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාට ඔහුගේ රාජකාරි දැනුම මත මේ පස් පිළිබඳව ඔහුට දැනුමක් ඇති. මේ පස් වර්ගය මේවා තිබෙන්න ඕන කියන. හැබැයි මේ කොන්ත්‍රාත් එක කරන පුද්ගලයා මේ සම්බන්ධව අත්දැකීම් බහුල පුද්ගලයෙකි. එමනිසා එතුමාගේ රාජකාරිය අවසන් වනතුරු අපි ඉවසන එක තමයි හොඳ මේ රාජකාරිය නිමවනතුරු. අපිට මෙය ඉක්මනින් අවශ්‍ය වන නිසා. නමුත් ඒ හා සාමානව අපේ මේ ගරු විපක්ෂනායකතුමා අපේ මේ ගරු මන්ත්‍රීවරුන් කියන ස්ථාන වලින් පස් සාම්පල් 15ක් හරි යවා

පරික්ෂණ වාර්තාවක් ගන්න තිබෙනවා . එකයි මා හිතන්නේ අපට දැන් ඉතිරිවෙලා තිබෙන්නේ. මෙය ගොඩනැඟිල්ලක් හදනවා වගේ අත්තිවාරමක් හදා කරන කාර්යයක් නෙමේ. මේ ප්‍රශ්න ඇසුවාට මේ අඩි 8ක් කැපුවාද අඩි 10ක් කැපුවාද කියා මේ කාටවත් පිළිතුරු දිය හැකි කියා. ඒ අවස්ථාවට අනුව ඒ ගන්න තීරණය ඒ. මෙය අපි තින්දු කරලා අහවල් ගොඩනැගිල්ල හදනවා වගේ කොන්ත්‍රාත්තුවක් නෙමේ. එමනිසා ප්‍රායෝගික ගැටළු තිබෙනවා. අපි මස් රාත්තලම ඉලුලුවාට හරියන්නේ නැහැ එතනදි. නමුත් විපක්ෂය නගන චෝදනාව විපක්ෂය ඉදිරිපත් කරන දෙය ගැන මා එතනදි එකඟයි. එයට අප විසින් දිය යුතුව තිබෙනවා. ඔවුන් කියන දෙය භාරගෙන අපට තිබෙන නිත්‍යානුකූල දෙය තමයි මේ අය ඒ පස් සාම්පල් ගොඩ නැගුවාම මේ අය කියන පස් සාම්පල් 16ක් හරි ගෙන එහි පරික්ෂණ වාර්තා ගෙන ඒවාගේ ගෙවීම් නතර කිරීම. ගරු සභාපතිතුමනි මාගේ මතය එක. අපි මේ කැකෝ ගැසුවාම මේ සිටින සුළු නිලධාරීන් පිරිස මේ සිටින කම්කරුවන් දමා කරන මේ උත්සාහයක් අපිට මේ කරන ටිකකත් නැති වෙලා යනවා. ඒ අයටත් ඉන්න පුළුවන් මේ පරික්ෂා කර පස් නැහැ විස්තරයක් නැහැ . නිතිය පෙන්වා. කොහොමද ක්‍රිඩාංගණය හදන්නේ. නිලධාරීන්ට ඒ අභිමතාර්ථ බලය තිබෙනවා. මා ඒ අයට සුදු හුණු ගාන්නේ නැහැ. නමුත් මේ රාජකාරි කිරීමේදි ප්‍රායෝගික ගැටළු තිබෙනවා. අපි එවාටත් අහුම්කන් දෙන්න ඕන. අහුම්කන් නොදි කතා කළහොත් අපට මෙය පවත්වාගෙන යන්න බැරි වෙනවා. අවසානයේදි මා දකිනවා මහජන ක්‍රිඩාංගණය කියන්නේ විශාල ව්‍යාපෘතියක්. එය කොයි ආකාරයෙන් එයට ප්‍රතිලාභ ආවත් එහි ක්‍රිඩා කරන දරුවන්ට එහි ප්‍රතිලාභය ලැබිය යුතුයි. අපි මේ වසර ගණනක් විඳවලා ඔවුන්ට මේ ලබා දෙන දේ අඩුවක් තිබෙනවා නම් අපට සහගනවා. එමනිසා ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රිවරු පෙන්වා දුන් පරිදි ඒ අදාල ස්ථාන වල පස් සාම්පල් ගෙන පරික්ෂණයට යවා එම පරික්ෂණ වාර්තාව ගෙන ඒ අදාල කටයුත්ත කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා හිතනවා මේ සඳහා ගත කළ කාලය වැඩියි කියා. ඉතාමත් අපරාදේ කියා මා දකින්නේ. මේ සම්බන්ධයෙන් අපි තින්දුවක් දැන් අරගෙන ඉවරයි. එම තින්දුව ප්‍රකාශයට පත් කරන්න නොදි ඔබලා විසින් මෙය විවේචනයට යාම එහෙම නැතිනම් මෙය හෙට පුවත්පත් වලට යන අදහසින් කරන කතාවක් කියා. මේ පස් සම්බන්ධව අපට යම් ප්‍රශ්නයක් ඇති වෙච්ච නිසා අපි ඒ වේලාවේ උපදෙස් දුන්නා මේ පස්ටික අයින් කරන්න කියා. ඒ තැනැත්තා විසින් එම පස් අයින් කර අලුත් පස් යොදා තිබෙනවා දැන්. මා මේ පස් සැපයු තැනැත්තාගෙන් මා ඇසුවා මේ පස් කොහොන්ද ගෙනාවේ කියා. ඔහු කිව්වා ඒ ගැවල් පිට් එක එයා ගිහින් බලා සුදුසුයි කියා තමයි එතැනින් පස් ගත්තේ කියා. නැතිනම් වෙන තැනකින් ගන්නේ නැහැ කිව්වා. ඉඩම් තුන හතරක් බලා මේක හොඳ නැහැ මේක හොඳ නැහැ කියා අන්තිමට තෝර ගත්ත එකෙන් තමයි කිව්වා ගත්තේ. නමුත් ඒ පස්ටික අයින් කර තිබෙනවා. මෙය ආපු නිසා මා අපේ කාර්මික නිලධාරීන්ටත් කියා මට වාර්තාවක් පැමිණ තිබෙනවා. එම වාර්තාවේ තිබෙනවා පස් පිළිබඳ සම්පිණ්ඩණය පිළිබඳ පරික්ෂණයක් කරන්න කියා. තත්ත්වය පිළිබද වාර්තාවක් ගන්න කියන එකත් තිබෙනවා. එමනිසා මේ පිළිබඳ මටත් ගැටව සහගත වු නිසා පස් තලන ගනු ලැබු වාර්තාවෙන් පස් වල තත්ත්වය පිළිබඳ ගනු ලබන වාර්තාව පිළිබඳ පරික්ෂණයක් කරන්න ඕන නිසා මා මෙහි ගසා තිබෙනවා මෙහි 1,2 පරික්ෂණ පිළිබඳ පළාත් පාලන ඉංජිනේරු

මහතාගෙන් වාර්තාවක් ගන්න කියා. දැනටම අපි එය කර තිබෙනවා. ඉදිරියේදි මෙම ගෙවීම් කිරීමේදි එම වාර්තාවට අනුව නැවත සභාවට ඉදිරිපත් කරන්න. එම වාර්තාව ගන්නවා. මොකද අයින් කරන්න කියපුවාත් සමහර වේලාවට අයින් කරන්න ඕන වෙන්නේ නැහැ. එම ක්‍රිඩාංගණය ඉදිකරනු ලබන තැනැත්තා කියා සිටියේ අඩි 300කට අඩියක් ෂොප් කරලා තමයි ක්‍රිඩාංගණය සාදා තිබෙන්නේ කියා. ක්‍රිඩාංගණයේ වැටෙන ජල බින්දුව කාණුවට එනවා මිස එයට කිදා බසින් විදියට නෙමේ කිවුවා මේ ක්‍රිඩාංගණය ඉදිකර තිබෙන්නේ. අපි මෙම ගෙවීම කරන්නේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඔබතුමා ඔහොම ප්‍රකාශ කරන කොට අපිටත් දැනීමක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට දැනිමක් නැති නිසා තමයි මා ඉංජිනේරු මහතාගෙන් ඇසුවේ.

**<u>ගරු සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය මාර්ග සංවර්ධන අධිකාරියට පරික්ෂණ වාර්තා සඳහා යවන්න. ඊළඟට රුහුණු විශ්ව විද්‍යාලය තිබෙනවා. එයට.

**<u>ගරු සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධන අධිකාරියට හෝ විශ්ව විද්‍යාලයට යවන්න. පිළිගත් ආයතන දෙකක්. ඒ දෙකට දමන්න. ඒ දෙකෙන් තොරව මෙයට වාර්තා දමන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි අපිට දමන්න තිබෙන පරික්ෂණාගාර තිබෙනවා. පුද්ගලික අංශයේ කවුරුවත් නැහැ. ඒ සියළුම රජයේ එවාට යවනවා.

**<u>ගරු සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,  මට විනාඩි 2ක් දෙන්න. දැන් පරික්ෂා කරන්න කියනවා. දැන් පස් ජාති තිබෙනවා 10ක් 12ක්. එතකොට අපි පරික්ෂා කරන්නේ මොන පස් ජාතියටද? එය කොහේවත් සඳහන් වෙලා නැහැ. එකයි මා ඉස්සෙල්ලාත් කිවුවේ. මෙහි කොහේවත් සඳහන් වෙලා නැහැ. මා අහන්නේ මේ පරික්ෂණය කරන්නේ කොහොමද කියන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙයට වෙනම උපදේශයක් දෙන්න. මා පළාත් පාලන ඉංජිනේරු මහතාගෙන් උපදෙසක් ගන්න කියා තිබෙන්නේ. මෙහිදි අපට ගන්න පුළුවන් වෙන්නේ පළාත් පාලන විශේෂඥ දැනුම

තිබෙන්නේ පළාත් පාලන ඉංජිනේරු මහතාගෙන්. එතුමාගෙන් අහන්න මෙන්න මේවා ඉෂ්ඨ වෙනවාද කියා ආසා පරික්ෂණ වාර්තාව ගන්න. අරගෙන ඉදිරිපත් කරන්න.

**08:25 උපමාන පාදක අරමුදල් යටතේ සිදුකරන ලද මානිමුල්ල නගර සහා නිවාස පාර කාණු පද්ධතිය සැකසීම වෙනුවෙන් රු.524453.34 ක මුදලක් පනියන්දූව ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:26 අම්බලන්ගොඩ, විලේගොඩ , හීන් ඇල පාර හරහා ඇති බෝක්කුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.36014.33 ක මුදලක් ඕකන්ද ජ්‍යොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:27 එස්.ජී.ඒ.ද සිල්වා මාවතේ ලුම්බිණි ස්ටූඩියෝ අසල කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.9090.89 ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:28 අම්බලන්ගොඩ, විලේගොඩ එස්.ජී.ඒ.ද සිල්වා හරස් පාර (ඩෙන්සිල් මහතාගේ නිවස අසල) කර්මාන්තයේ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.15713.25 ක මුදලක් ඕකන්ද ජ්‍යොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:29 මහ අම්බලන්ගොඩ LECO ගොඩනැගිල්ල ඉදිකිරීම කාණුව යකඩ දැල් ඇතිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.32676/- ක මුදලක් ඕකන්ද ජ්‍යොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:30 ඇණවුම් අංක 2376 යටතේ ඇණවුම් කරන ලද HY PLAY 90020 කම්බි ටයර් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් සුමිත් මාර්කටින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු.95644/- ක මුදලක් ගෙවීම ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:31** කා.නි.ප. අංක **0485** යටතේ පොල්වත්ත මහජන පුස්තකාලයේ පොත් **325** ක් බැඳීම වෙනුවෙන් එස්.ඩබ්.හරිස්චන්ද්‍ර මහතා වෙත රු.**71275/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:32** ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො.**01**) ඉදිකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.**20005.29** ක මුදලක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:33** ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො.**02**) ඉදිකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.**26695.14** ක මුදලක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.34** ඕකන්ද අත්කම් නිවසා පාර පැති බැම්ම (නො.**03**) ඉදිකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.**23597.35** ක මුදලක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.35** ඕකන්ද අත්කම් නිවසා පාර පැති බැම්ම (නො.**04**) ඉදිකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.**33094.39** ක මුදලක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:36** පොල්වත්ත බතලවත්තොට ඉඩමේ ඉතිරි කොටස කාණුව ඉදිකිරීම කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල නිදහස් කිරීම ලෙස රු.**33550/-** ක මුදලක් පොල්වත්ත ප්‍රජා සංවර්ධන මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.37** රුහුණු සංචාරක කාර්යාංශය අසල පාර පළුදු කිරීම් සකස් කිරීම සඳහා ගංගා වැලි කියුබ් **01** ක් ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ **,** එපිටමුල්ල පාර පදිංචි පී.එච්.සී.සී. ද සිල්වා මහතාට රු.**12500/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු

**සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.38 2019.0319 සිට 2020 පෙබරවාරි මාසය දක්වා වැඩ බැලිමේ රාජකාරි ඉටුකිරිම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි භිඟ දිමනා ලෙස රු.82873.03 ක මුදලක් ආර්.යු.ඩබ්.ගුණවර්ධන මහත්මිය වෙත ගෙවිමට හා 2020 මාර්තු සිට ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12.3 අනුව කටයුතු කිරිම ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.39 අම්බලන්ගොඩ එල්.සී.ද සිල්වා මාවතේ කාණුව සකස් කිරීම 01 අදියර(සේනක මහතාගේ නිවසේ සිට උමායා හෝටලය ගේට්ටුව දක්වා) වෙනුවෙන් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට රු.340185.72 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:40 මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතියට රු.423902.94 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරි මහතා මෙයට මට පිළිතුරක් දෙන්න. දැන් ඔබතුමා කියා තිබෙනවා වතුර වලට කැඩී තිබෙනවා කියා. වතුර වලට කැඩුණු නිසා තමයි හදන්න කිවුවේ. ඔබතුමා මේ නගර සභාවේ නැති කාලයේ අපි මෙය කඩපු නිසා තමයි හදන්න කිවුවේ. එහි වතුර බහිනවා කියා බොරු කතා කියන්න එපා. එහි වතුර තිබෙනවා කියා බොරු කතා කියන්න එපා. ඔයිට වඩා වෙළවල් වලත් පාරවල් තිබෙනවා. වතුර රැදෙන්නෙ නැහැ. මා අර කොන්ත්‍රාත්කරුට වන අගතිය නිසා මුදල් ගෙවන්න ඉඩ දෙනවා. නැතිනම් මෙයට සත පහක්වත් ගෙවන්න වටින්නේ නැහැ. කරපු කැත විදියට. සඳුන් මහතා කළේ නැහැ. එක වෙනම එකක්. මා දන්නවා ඕක කළේ කවුද කියා. අදාළ නැති වැඩ කරන්න ගිගිහන් කරපු කට්ටියත් දන්නවා. අපි මේ සභාවට පැමිණියේ රෙද්දක් ඇඳගෙන ගමේ ජනතාවට මුහුණ දෙන්න. රෙදි ගලවලා යන්න බැහැ අපිට ගම්වල. ජනතාව පැමින නිවසට බනිනවා. අර චන්ද්‍රානි මහත්මියගේ නිවස ඉදිරිපිට වතුර . අර දිනේද්‍රා මහත්මියගේ නිවස ළඟ. ඒ අය පැමිණ මට බනිනවා. අපි ගම්වල ඉන්න ඕන. මේ වගේ බොරු වාර්තා ගහන්න එපා. මේවා මහ අසාත්‍ය වාර්තා. එන්න යන්න මාත් එක්ක බලන්න. ගරු ලේකම්තුමිය පැමිණ බැලුවා. මා දුරකථනයෙන් කතා කළ කිවුවාම. ඔබතුමියත් දැක්කා එහි සත්‍යතාවය. ජලය මිනිසුන්ගේ නිවෙස් වල තිබුණේ. මේ වගේ ජාරා වැඩ කරන්න එපා. මේ වගේ ජාරා වැඩ කරන්න එපා. මා ගරු ලේකම්තුමියට කියලා කියලා එතුමිය වැදගත් විදියට ගිහින් බලන විට මිනිසුන්ගේ නිවෙස් වල හා මිදුල් වල ජලය. දැන් ගහනවා සතුටුදායකයි කියා. කිසිම සතුටුදායක කමක්

නැහැ මටනම්. අසතුටුදායකයි. මා මේය කරන ලද මනුස්සයාට මේ මුදල් ගෙවීම සම්බන්ධව විරුද්ධ වෙන්නේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ මනුස්සයාට දෙන ලද ප්‍රමාණපත් වලට එතුමා වැඩ කර තිබෙනවා. ඒ මනුස්සයාට අපි ගිය සභාවේත් ආසාධාරණයක් කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එක හරි ඒ මනුස්සයාට කරන්න දෙයක් නැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

කාගේද වරද කියන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

උපදෙස් දෙන අයගේ තමයි වරද . මෙතැන අපි වැඩක් කිවුවාම කරන්න බැරි තාක්ෂණ නිලධාරින් සිටින්නේ. ගියමාසයේ අපි දුන්නා මානිම්මුල්ල වටරවුම් පාර. ඔබතුමා ඉන්න කාලේ තමයි එහි වටරවුම හැදුවේ. එහි වටරවුම වසා තාප්ප බැඳලා. දැන් මාසයක් වෙනවා . අදවෙනකොට ගත්ත ක්‍රියාමාර්ගය කියන්න . මේහෙම තාක්ෂණසේවා නිලධාරින් වැඩක් නැහැ.මොකක්ද මේ. කොට්ඨාශ අංක 05 ගරු ජන්දෙන් තෙරි පත්වු මන්ත්‍රිවරිය වශයෙන් , මෙතුමියත් සිටිනවා. එතකොට මෙතුමියයි මා සිටින දෙදෙනෙකු සිටින අපිට අපි කියන වැඩක් කරගන්න බැරි නම් මොකක්ද මේ වැඩය. ජනාතාව ළඟට ලබන පාර රෙදි ඇඳගෙන නෙමේ යන්න පුළුවන් වෙන්නේ. අපි රක්ෂාවකට පැමිණියා නෙමේනේ මෙතැනට. අපි රක්ෂාවක් කරනවා. අපි ඇවිත් තිබෙන්නේ මහජන සේවයට. එම වටරවුම ඔබතුමා ගරු සභාපතිතුමනි ඔබතුමා හැදුවේ මානිම්මුල්ලේ. දැන් මෙහි වාර්තාවක් ඉල්ලා මාසයක් වෙනවා. එදාම ගරු සභාපතිතුමනි, ඔබතුමා කිවුවා වටරවුම වසා තිබෙනවා නම් වහාම කඩා ඉවත් කරන්න කියා. මොකක්ද මේ වැඩය. එක්කෝ පාරක් හැදුවොත් වළවල්. මිනිසුන් පැමිණ බනින්නේ මට. වටරවුම වහලා කියා ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියටත් මටත් ජනතාව බනිනවා.ඔන්න උඹලාගේ වැඩ. උඹලාගේ මිනිසුන් මෙය වහනවා කියා. එය ඇවිත් අපි කියන්න ඕන තාක්ෂණසේවා නිලධාරින්ට. නගර සභාවට. එකෙන් කිසිම ප්‍රතිකර්මයක් නැහැ. අන්තිමට මේක කළාම හිතාවි තාක්ෂණසේවා නිලධාරින්ට අපි බනිනවා කියා. අපේ පෞද්ගලික දේවල් නෙමේ මේවා. ගම්වල කෙරෙන්න ඕන දේවල්. එමනිසා මේ වගේ බොරු අසත්‍ය වාර්තාවල් ඉදිරිපත් කරන්න එපා. මා මේ මුදල් එම කොන්ත්‍රාත් එක කරන්න ඕන නිසා මා මෙය ගෙවන්න ඉඩ දෙනවා. ඔබතුමා එන්න මාත් එක්ක මෙය බලන්න. මා එනවා. ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය එනවා. මොකක්ද මේ කුඹුරක් ද් ජලය රැඳෙන ස්ථානයක් කියා. ජලය රැඳෙන ස්ථානවල ඔයිට වඩා ලොකු පාරවල් දමා තිබෙනවා. තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි , මාත් මේ ගොනෙක් නෙමේ. මාගේ තාත්තාත් සුද්දො ඉන්න කාලේ නිසා කොමර්ෂල් ලිසිං සමාගමේ කොන්ත්‍රාත් කරපු කෙනෙක්. මටත් පොඩි හරි දැනුමක්

තිබෙනවා ඔය ටෙන්ඩර් ගැන. ඔය ප්‍රමාණපත්‍ර ගැන. ඕවා මමත් කියන්නම්. මා ඕවා කර තිබෙනවා සහෝදරයන් එක්ක එකතු වෙලා. මට බැරි කමකුත් නැහැ. එමනිසා ඔයවගේ අසාත්‍ය දේවල් දමන්න එපා. ඔබතුමා එන්න ඕන මාත් එක්ක සභාව අවසන් වුණාම. මා දන්නවා ඔබතුමා ආවා. මා කියන දෙය අහගන්න. ඔබතුමා නෙමේ ඔය දෙය කළේ. එමනිසා ඔබතුමා ඔය තොප්පිය දමා ගන්න එපා. අනිත් කෙනාටත් කිසිම අයිතියක් නැහැ. පාඨලි මහත්මියට අයිති කොට්ඨාශය. ඔබතුමා පැනලා දීලා දඟලන්න එපා. සඳුන් මහතාණෙනි වාඩිවෙන්න. මා දන්නවා ඔකේ මොකක්ද වුණේ කියා. ඔබතුමා සද්ද නැතිව ඉන්න. එම ගෙවිම සම්බන්ධව විරෝධතාවයක් කිවුවේ. සිදුවූ අක්‍රමිකතාවයක් මා කිවුවේ. මා කවුරුවත් විවේචනය කලා නෙමේ. වෙච්ච අකරතැබ්බිය මා ප්‍රකාශ කළේ. ගරු නිලානි මන්ත්‍රීතුමිය ඉතිරි ටික කියාවි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගෙවීමට විරෝධතාවයක් නැහැනේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , ගෙවිමට විරෝධතාවයක් නැහැ. මාගේ සහෝදර මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ ආකාරයට මෙතැන තාක්ෂණ සේවා නිලධාරිතුමා එම පාර පිළිබඳව අධික්ෂණය කරලා එව පාරේ ඇස්තමේන්තු සකසන විට තමයි වැරුද්ද සිද්ධ වෙලා තිබෙන්නේ. මේ වතුර වලට කඩන්න ගිය නිසා තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ. එම පාර දැන් සම්පූර්ණම කැඩුණු පාරක් වෙලා තිබෙනවා. මා තාක්ෂණසේවා නිලධාරිතුමාගේ මා දකින්නේ එතුමා මේ වතුර රැදෙන ස්ථානය විතරයි ඇස්තමේන්තු කර තිබෙන්නේ. පාර පටන් ගන්න තැන සිට කළානම් ගරු මන්ත්‍රීතුමිය අද මේ වගේ චෝදනාවක් කරන්නේ නැහැ. මා කිහිප අවස්ථාවක ගියා. වතුර රැදෙනවා කියන්නේ වෙල ගාව නිසා තමයි. ඇත්තෙන්ම එය ABC දමා ඉස්සුවා. දැන් ඒ ටික හොඳට තිබෙනවා. නමුත් ඒ පාරේ සම්පූර්ණ ඇස්තමේන්තුවක් ගෙන පාර හදන්න ගියානම් මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. එහිදි මොනම හෝ අඩුපාඩුවක් තාක්ෂණසේවා නිලධාරිතුමාගෙන් සිද්ධ වෙලා තිබෙනවා. ඇත්තෙන්ම හොඳ දෙයක් කර තිබෙන්නේ. නියමිත අයුරින් කර තිබෙනවා නම් මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. අර මානිමුල්ල නිවාස යෝජනා ක්‍රමයේ තත්ත්වයත් ඔබතුමා අපි ඉදිරිපිට කිවුවේ. තාක්ෂණසේවා නිලධාරි සඳුන් මහතාට. එ ගැන තීරණයක් දෙන්න කියා. ඇත්ත වශයෙන්ම මා මේ යෝජනා දමන්නේ නැත්තේ එකයි. එම දමන ලද ඒවාගේ කොච්චර ප්‍රගතියක් තිබෙනවා ද කියා අධික්ෂණයක් තිබෙන්න ඕන. අන්න එකයි මේ ගැන ඔබතුමා විශේෂයෙන් අවධානය යොමු කර මේ සභාව ඉදිරියට කර ගෙන යන ලෙස ඉල්ලා සිටිනවා. ගරු ලේකම්තුමියටත් කියන්නේ කලින් සිටි ලේකම්වරු ප්‍රශ්නයක් ඇති වුණාම එම ස්ථාන වලට යනවා. දැන් අපේ ගරු මන්ත්‍රීතුමිය කිවුවා ඔබතුමියත් ගියා කියා. එමනිසා ඔබතුමිය ගියාම දකින්නත් ඇතිනේ. පාර පටන් ගන්න මුල පාර කොයි වගේද කියන එක. පාරේ වළක්. එතැනත් වතුර පිරෙනවා. මා ගරු සභාපතිතුමාටත් කතා කළා. යන් ගිහින් බලන්න කියා. ඔන්න ඔය වගේ ප්‍රශ්න තිබෙනවා. ප්‍රශ්න නිරාකරණය කර ගන්න. අපේ නිලධාරි අය සමඟත් අපිට ප්‍රශ්න ඇතිවෙන්නේ මේවා හරියට නොකරුණාම. ඒ සඳහා අවධානය යොමු කරන්න කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගෙවීම පිළිබඳ විරෝධතාවයක් නැති නිසා එය අනුමත කරනවා. මෙම මාර්ගය පළුදු කර තිබුණේ බැකෝ එකකින්ද නැතිනම් නිකං එකකින්ද ? අන්න එක තමයි. අපි අය කරන්නේ බටය දැම්මට අඟල් දෙකක් පමණයි. බැකෝ එකක් දමා කඩන විට මේ වගේ හානි වෙනවා. හානි සිදුවෙන නිසා මා හිතන්නේ සභාව විසින් තැන්පතුවක් තබා ගන්නා එක හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේ සඳහා රුපියල් පනස් දහස් ගණනක් හරි හැට දහස් ගණනක් හරි ගෙවුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම මුදල ගෙවනු ලැබුවේ අඟල් 2ක් පමණයි. අඟල් දෙකට අඟල් 10 ක් විතර කැඩුවාම මේ වගේ තත්ත්වයක් ඇති වෙනවා. අපි අය කර තිබෙන්නේ රු.50000/= නම් රු.80000/= ක් විතර වැයවුණා මෙය හදන්න. අන්න එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , කොන්ක්‍රිට් එකක් එහෙම කඩන්න බැහැ. එහෙම බැකෝ වලින් වත් . ඒ අය ඇස්කොට් කටර් එක දමා කැපිය යුතුයි. අනිවාර්යෙන්ම එහෙම කරන්න ඕන. එහෙම නැතිව කඩන්න බැහැ. එය දමා කැඩුවා නම් මුකුත් වෙන්නේ නැහැ. එම හානි වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි, මීට පසු අපේ සභාවට දෙන්න පාර කඩන විට ඇස්කොට් කටර් එක සඳහා යන වියදමත් එක්ක. ඔබලාත් ඇත්තටම අපහසුතාවයට පත්වෙනවා. අපි ගන්නවාට වැඩියේ මුදලක් වැය වෙනවා මෙය කරන විට. එම ඇස්තමේන්තුවේ දමා සභාවේ සම්මත කරගෙන ඒ විදියට අය කර ගන්න. අපේ වැඩ පරිපාලක ජානක මහතා සිටිනවාද? අර ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මෙනවිය කියපු පාරට ෆිමික්ස් කර කිරිම පිළිබඳ ජානක මහතා දන්නවා. එතුමාට කියා ඒ විදියට කර ගන්න. ඔය කියන එක කර අවසන් කර ගන්න පුළුවන්.

**08:41 අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලයීය ක්‍රිකට් පදනම සංවිධානය කළ සංගීත ප්‍රසංගයේ විනෝද බදු තැන්පත් මුදල් වශයෙන් තබාගෙන ඇති රු.112500/- ක මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ගා ශ්‍රී දේවානන්ද විද්‍යාලයීට ක්‍රිකට් පදනම සංවිධානය කළ සංගීත ප්‍රසංගය සම්බන්ධයෙන් විනෝද බදු නිදහස් කිරීම සම්බන්ධව 2019.12.18 දින පැවති විශේෂ සභා රැස්වීමේ සභා තීරණ අංක 03.01 යටතේ විනෝද බදු නිදහස් කිරීමක් සිදු කර තිබෙනවා. එහි අයවැය වාර්තාව එවා තිබෙනවා. විනෝද බදු ආඥා පණත අනුව ප්‍රසංගයක් විනෝද බද්දෙන් නිදහස් කරන්න . ප්‍රසංගය පවත්වා මසක් ඇතුළත ආදායම් වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කර ඉන් ශුද්ධ ලාභය හෝ මුළු ආදායමෙන් 40% ක් හෝ දෙකෙන් එකක අඩු මුදල අදාල කටයුත්ත වෙනුවෙන් සැපයිය යුතුය. ඒ අනුව මේ ප්‍රසංගය පැවැත්වීම පිළිබඳ වැය වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව රු.153,800/= ක මුදලක ලාභයක් එම ප්‍රසංගයෙන් ලැබී ඇත. මෙම මුදල ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රිකට් පදනමේ ආධාර වලට ලබා දී ඇති බවට තහවුරු කරමින් මහජන බැංකුවේ රිසිට්පත හා ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් දෙන ලද ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව නිත්‍යානුකූලව කටයුතු සිදු වී ඇති බැවින් ඒ අනුව තැන්පත් කර ගෙන ඇති රු.152000/= ක මුදල නිදහස් කිරීමට සුදුසු කියා ඉල්ලා සිටිනවා. ඇත්තටම මා ගරු මන්ත්‍රීවරුන් මේ පිළිබඳව සලකා බලන්න කියා ඉල්ලා සිටිනවා. මේ වගේ ප්‍රසංගයක් කරලා රු.153200/= ක මුදලකි. එතකොට අපි මේ විනෝද බදු නිදහස් කරනු ලබන්නේ කරනු ලැබූ ආයතනයට. පාසැලට නෙමේ. එම ක්‍රිකට් පදනමට. එය රු.112,000/= කි. දේවානන්ද විද්‍යාලයෙන් තමයි එය එවා තිබෙන්නේ මෙය කරනවා කියා. නමුත් අපේ විනෝද බදු වගේ බොහොම පොඩි මුදලක් තමයි පාසැලට ලැබී තිබෙන්නේ. අපි මෙම මුදල මේ පුද්ගලයාට නිදහස් කරනවාට වැඩියේ හොඳයි පාසැලට නිදහස් කරනවා නම්. මා දන්නේ නැහැ පණත අනුව මෙය නිදහස් කරන්න තිබෙනනේ මෙය බැඳපු එක්කෙනාට. ඒ ගැන මොකද කියන්නේ. පාසැලේ ක්‍රිකට් පදනමෙන් බැඳලා තිබෙන්නේ. මේ වගේ පදනම් වලින් දමා ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා මේ වගේ ලක්ෂයක් දමා ලක්ෂ 3ක් ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා නිදහස් කර ගත්තා. ඒකත් කියන්න එපැයි. ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ආදි ශිෂ්‍ය සංගමයෙන් අනුමැතිය ලබා ගන්නේ නැතිව මෙය වියදම් කරන්න බැහැ. ආදි ශිෂ්‍ය සංගමයට අනුබද්ධ ආයතනයක් නම් ක්‍රිකට් පදනම අපේ ආදි ශිෂ්‍ය සංගමයේ අනුමැතිය ගන්න ඕන ක්‍රිකට් පදනම. හැම සතයකටම ආදි ශිෂ්‍ය සංගමයේ අනුමැතිය ගන්න ඕන. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හරි ගැටළුවක් මේවා. මා නම් කියන්නේ ධර්මාශෝක විදුහල හරි දේවානන්ද විදුහල හරි මෙය සලකා අපි දෙනවා නම් අපි එය දිය යුත්තේ පාසැලට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා මෙය අනුමත කරන්න . විදුහල්පතිතුමාගෙන් ව්‍යාපෘතියක් ඉල්ලන්න අපේ සභාවෙන්.එතකොට ඒ පදනමෙන් ව්‍යාපෘතියක් දිය යුතුයි පාසැලට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ. මෙය අපි පණත අනුව 40% ලබා දුන්නාම අපි එය නිදහස් කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නැහැ. නිදහස් කරන එකට විදුහල්පතිතුමාට කියන්න ඒ පදනමෙන් ඒ කටයුත්ත සඳහා ලිඛිතව විදුහල්පතිතුමාගෙන් එකත් එවන්න කියා. එතකොට ඉවරයිනේ

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් කවුද ඔය මුදල් ගෙවන්නේ . එතකොට ලිපිය දෙන්නේත් නැහැ අනවශ්‍ය විදියට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙහි ලිපිය දෙන්නේ ලසන්ත කරුණාරත්න , ශ්‍රී දේවානන්ද විද්‍යාලය, ක්‍රිකට් පදනම. ලේකම් ඉන්නේ ජගත් ප්‍රේමචන්ද්‍ර මහතා.

**08.42 ධම්මකුසල මාවතේ කාණුව කොන්ක්‍රීට් කිරීම (ඒ.ජී.අයි.) වෙනුවෙන් පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුව වෙත රු384,621.93 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:43 මහජන ක්‍රීඩාංගනය අසල බෝධි ප්‍රාකාරය ඉදිකිරීම (අදියර 01) වෙනුවෙන් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත රු.203,054.36 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.44 මහජන ක්‍රීඩාංගනයේ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය පැත්තේ පැතිබැම්ම හා සපත්තු කාණුව ඉදිකිරීම වෙනුවෙන් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත රු.279,769.50 ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.45 පරිගණක මෘදුකාංගය භාවිතයෙන් 2020 වර්ෂයට තක්සේරු දැන්වීම් මුද්‍රණය කිරීම වෙනුවෙන් නගර සභාවේ සේවයේ නියුතු පවන් මහ ආරච්චි මහත්මියට රු.10645/- ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.46 2020 වර්ෂයේ තක්සේරු දැන්වීම් (10645 ක්) බෙදාහැරිම වෙනුවෙන් නගර සභාවේ සේවයේ නියුතු එම්.නලින් චන්ද්‍රජිත් මහතාට රු.42580/- ක් ගෙවීම සුදුසු බවට ගරු**

**සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08.47 වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ මූල්‍ය දායකත්වය යටතේ අම්බලන්ගොඩ නගර සභා නිලධාරින් සඳහා කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන 2020.02.16 වන දින පැවැත්වීම වෙනුවෙන් රු.13000/= ක වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේන් ප්‍රතිපූර්ණය කරන බවත් එම මුදල ප්‍රතිපූර්ණය කරන තුරු එම මුදල සභාවෙන් ලබා දීමට සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී**

**09.** ගිණුම් :-

**09.01 2019 දෙසැම්බර් මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.**

**තීරණය:-**

2019 දෙසැම්බර් මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2019 දෙසැම්බර් මස ලැබිම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**10.** ඇස්තමේන්තු :-

**10.01 පොල්වත්ත පුස්තකාලයට වොෂ් බේසින් සැපයීම සඳහා රු.29000/- ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ වෝෂ් බේසම කොයි වර්ගයේ එකක්ද දන්නේ නැහැ. අර හදා තිබෙන වැසිකිළිය වගේ එකක් ද දන්නේ නැහැ.

<u>**ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

රු.29000/= ක එකක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

රු.25000/= වෙන්නේ මොන වගේ එකක් ද? මේ රු.3000/= ගණනටත් තිබෙනවා. මොකද මෙතුමායි , තාක්ෂණසේවා නිලධාරි මහතා සිටින කාලයේ තමයි ඔය රු400,000 /= ක මුදලක වැසිකිළියක් හදනු ලැබුවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

දකුණු පලාත් මිල කමිටුවේ තීරණය කරනු ලැබූ ගණන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

මොකක් ද වර්ගය කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

දකුණු පලාත් සභා මිල ගණන් කමිටුවෙන් මේ අයට එවනවා මිළ ගණන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

දකුණු පලාත් සභාවෙන් තමයි රුපියල් හාර ලක්ෂ ගණනක මුදලක් එවා තිබුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි රත්තරං වලින් එය හදා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්</u>**

ෂෝක් එකට හදා තිබුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

වර්ගයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය බට වලට හා ඒ අනෙකුත් වියදම් වලට තමයි අනුමත කර තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරුන්ට මෙහි පිටපත් ලබා දෙන්න. මෙන්න මේක දෙන්න ගරු මන්ත්‍රීවරුන්ට බලන්න.

**තීරණය-**

පොල්වත්ත පුස්තකාලයට වොෂ් බේසින් සැපයීම සඳහා රු.29000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්,ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 රණසූරිය මාවතෙන් අතුරු පාර (නිසංසලා මහත්මියගේ නිවස අසල) රූඳවුම් බැම් ඉදිකිරීම සඳහා රු.830,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී මඟගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ කොතනද දන්නේ නැහැ. නිසංසලා මහත්මියගේ කියා දමා තිබෙන්නේ. කොතනද දන්නේ නැහැ.

**තීරණය-**

රණසූරිය මාවතෙන් අතුරු පාර (නිසංසලා මහත්මියගේ නිවස අසල) රූඳවුම් බැම් ඉදිකිරීම සඳහා රු.830,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 ඕකන්ද පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සඳහා රු.10,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

ඕකන්ද පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සඳහා රු.10,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 කෙරමිණිය පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සඳහා රු.10,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, රු.4000/= ටත් තිබෙනවා සිවිලින් පංකාවන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

වර්ගය කුමක්ද?

<u>**ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

වර්ගය දමන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතැන ගැටළුවක් තිබෙනවා. ඔහොම දැම්මාම ගැටළුවක් තිබෙනවා. මොනවා දානවා ද කියා අපි දන්නේ නැහැ. රු.10000/= ක මුදලකට.

**<u>ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

අනේ අය වගේ නෙමේ. ඔබතුමා ඉංජිනේරුවරයෙක් නිසා මේ ගැන අහපු එක ගැන මා කනගාටු වෙනවා. මේ තාක්ෂණසේවා නිලධාරි මහතුන්ට මිළ ගණන් ලකුණු කර මිළ ගණන් එවනවා වර්ෂය මුල. ඒ විදියට තමයි මේ අය දමන්නේ. එහෙම නැතිව මේ අයට ඕන ගණන් දමන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,එක එච්චත් අපි අන්ධයෝ වගේ වැඩ කරන්න ඕනද සත්‍ය පෙනි පෙනි.

**<u>ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

වර්ගය තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

එහෙම නම් ඇයි ඉදිරිපත් කරන්නේ නැත්තේ.

**<u>ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

ඌෂා නවලෝක කම්පැක්ට්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

දැන් ඔබතුමා කිවුවා වර්ගය නැහැ කියා.

**<u>ගර සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප්   මහතා කතා කරමින්</u>**

නැහැ. මෙහි ඇතුළේ තිබෙනවා. මා ඇතුළ බැලුවේ නැහැ. ඇස්තමේන්තුවේ උඩ විතරයි බැලුවේ.

**තීරණය-**

කෙරමිණිය පුස්තකාලයට සිවිලින් පංකාවක් සවිකිරීම සඳහා  රු.10,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා  මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරීම සඳහා රු.1,700,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පොල්වත්තපුර රුදවුම් බැම්ම ඉදිකිරීම සඳහා රු.1,700,000/- ක ඇස්තමේන්තුව මීට පෙර සභාවකදී අනුමත කර ඇති බැවින් එය ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**10.06 හෙප්පුමුල්ල ප්‍රජාශාලා භූමියේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීමට පෙර පස් පිරවීම සඳහා රු.300,000/- සභා ගත කරන ලදී.**

**තීරණය-**

හෙප්පුමුල්ල ප්‍රජාශාලා භූමියේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීමට පෙර පස් පිරවීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ කාණු පද්ධතිය ආවරණ පුවරු සැකසීම සඳහා රු.950,000/- ක ක ඇස්තමේන්තුව සභාග කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ කාණු පද්ධතිය ආවරණ පුවරු සැකසීම සඳහා රු.950,000/- ක ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.08 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ ඇවිදින මං තීරුව සැකසීම සඳහා රු.1,300,000/-ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනයේ ඇවිදින මං තීරුව සැකසීම සඳහා රු.1,300,000/- ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.09 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය අලුත්වැඩියාව (අදියර 01) රු.930,000/-ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය අලුත්වැඩියාව (අදියර 01) රු.930,000/-ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.10 හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.325,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

හිරිකැටියවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.325,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.11 මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.295,000/- ක ඇස්තමේන්තුව**

**තීරණය-**

මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.295,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.12 මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.285,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.285,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.



වෙනත් කරුණු :-

**11.**

**12** **න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :-**

**12.01 විදුහල් මාවත , අම්බලන්ගොඩ . ධර්මාශෝක ශ්‍රවනාගාරය ඉදිරිපිට උත්සව අවස්ථාවලදි විදුහල් මාවතේ යතුරු පැදි නතර කර තැබීම සම්බන්ධව ඇතිවන අපහසුතාවය පිළිබඳ ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධවයි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.**</u>

අම්බලන්ගොඩ විද්‍යාල මාවතේ විශාල පිරිසක් පදිංචිව සිටින අතර නගර සභාවේ කොට්ඨාශ අංක 03 අයත් ප්‍රදේශයකි. එය නගර සභාවට අයත් පාරක් වන අතර පටු පාරකි. ධර්මාශෝක විද්‍යාලයේ නාට්‍ය හා රංගන පෙන්වීම හා පාසැල් ළමුන්ගේ විවිධ ප්‍රසංග වලදි විදුහලේ දෙපැත්තේ වාහන නතර කර තැබීම නිසා පදිංචි නිවැසියන්ගේ වාහනයක් හෝ නිවැසියන් අසනීප වූ අවස්ථාවල වාහනයක් යැමට හෝ වාහනයක් ගෙන යාමට අපහසුතාවයට පත් වී ඇත.එම ලිපිය ඉතා දිගයි. මා එම ලිපියේ යට කැල්ල කියන්නම්. අප නිවැසියන් කිහිප දෙනෙකු ගරු විදුහල්පතිතුමා මුණ ගැසි මේ පිළිබඳව එතුමා දැනුවත් කර මේ පිළිබඳ සහනයක් සලසා දෙන ලසෙ ඉල්ලා සිටින ලදී. එතුමා පවසා ඇත්තේ මා දෙන්නේ ශ්‍රවනාගාරය පමණයි. පාරේ ප්‍රශ්න ඔය අය විසඳා ගන්නා ලෙස දන්වා තිබෙනවා. ඒ අනුව නගර සභාවට අයත් පාරක් බැවින් එය විසඳා දෙන්න කියා එම ගම්වැසියන් විසින් අත්සන් කර ලිපියක් එවා තිබෙනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ ලිපිය නම් මට ඇවිත් නැහැ. මා මේ පිළිබඳ දන්න සත්‍ය සිද්ධියක් නිසා මා මේ ගැන කතා කළ යුතුයි. යම්කිසි ප්‍රකාශයක් කලා නම් මෙය නගර සභාව හරහා විසඳාගන්න කියා මා යෝජනා කරනවා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ධර්මාශෝක විද්‍යාලයේ මා මුලින්ම යෝජනා කරනවා. මේ සම්බන්ධව එම ප්‍රදේශයේ ජනතාවත් , විදුහල්පතිතුමාත් නගර සභාවට කැඳවා මෙය මුලින්ම විසඳා ගන්න කියා. විශේෂයෙන් මා මන්ත්‍රිවරයෙක් වශයෙන් මා මෙය ප්‍රකාශ කළ යුතුයි. මෙතැන ගරු මන්ත්‍රිවරු 21ක් සිටිනවා. එමනිසා මෙය නොකියා බැරි කාරණයක්. මාගේ දරුවා පාසැලට ඇතුළත් කර ගැනිම සඳහා මා දේශපාලනඥයකු වුවත් මාගේ වගකීමක් වෙනවා විදුහල්පතිතුමා මුණ ගැසි එතුමා සමඟ සාකච්ඡා කරන්න. මා පසුගිය සතියේ දිනයක විද්‍යාලයට ගියා විදුහල්පතිතුමා මුණ ගැසෙන්න. ගිහිල්ලා පැය භාගයක් විතර ඉදලා එතුමා මුණ ගැසුණා. මා ප්‍රකාශ කර සිටියා මාගේ දරුවා 7 ශ්‍රේණියට ඇතුළත් කර ගන්න ඕන. මෙහි පුරප්පාඩු තිබෙනවා නම් මට ලිපියක් දෙන්න කියා. එවිට එතුමා ප්‍රකාශ කළා ලිපියක් දෙන්න විදියක් නැහැ. පුරප්පාඩු නැහැ කියා. මා කිවුවා කමක් නැහැ කියා. ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මේ ඡන්දයෙන් පසු දිර්ඝ වශයෙන් ධර්මාශෝක විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ගත්තා. හැබැයි අපේ වගකිමක් , යුතුකමක් වෙනවා. මේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම පැමිණ තිබෙන්නේ නගරයේ ජනතාව වෙනුවෙන්

ඒ ජනතාවට වෙන අසාධාරණය ගැන කතා කරන්න. එම සිද්ධිය වෙලා ගරු විදුහල්පතිතුමා නිකම්ම ඇඳලා ගත්තා ඔබතුමලා අපේ ධර්මාශෝක විද්‍යාලය ගැන වැරදි විදියට සභාවේ කතා කර තිබෙනවා කියා. මා එතුමාට කිවුවා මේ නගරයේ ජනතාව වෙනුවෙන් කතා කරන්න ඔබතුමාගෙන් අවසරයක් ගන්න අවශ්‍ය නැහැ කියා. එමනිසා අපි වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒ ගැන කතා කරනවා. අපිට ධර්මාශෝකයේ විදුහල්පතිතුමා වුණාට කමක් නැහැ කියා. හැබැයි එතුමා කිවුවා මා වැරුද්දක් කර  නැහැ. මා වැරුද්දක් නොකර නිසා තමයි මේ ගැන කතා කරන්නේ කියා. මා කිවුවා මා මෙතැනට පැමිණියේ නම් මාගේ දරුවා ගැන පාසැලට ඇතුළත් කිරිම ගැන කතා කරන්න. නමුත් ඔබතුමා මේ සභාව ගැන කතා කරන නිසා මා කතා කරන්නම් කියා. හැබැයි ඔබතුමා මෙතෙක් කල් ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රථමික අංශය ලොකු  පැත්තට ගෙන ගිහින් ඇයි මේ ළමුන්ට අසාධාරණයක් නොමේද කළේ කියා. නැහැ එය මා කළේ මාගේ පන්ති එකක් හෝ දෙකක් කිවුවා පාසැලේ ලොකු පැත්තේ තිබෙන්නේ.අනිත් එවා තිබෙන්නේ ප්‍රාථමික පැත්තේ. මා කිවුවා එය ඔබතුමාගේ පරිපාලනමය කාර්යයක්නේ කියා. අපට එය අදාල තාවයක් නැහැනේ. මා කියන්න ඕන ටික කතා  කර කිවුවා.අම්බලන්ගොඩ නගර සභාවේ ඉන්නේ විද්‍යාලය පිලිබඳ දැනුවත් කම තිබෙන එක මන්ත්‍රිවරයෙකු පමණයි කිවුවා.මාගේ සහෝදර මන්ත්‍රිවරුන්ට මා මේ ගැන කිවුවා. මොකද එතුමා දැනුවත් කරන්න ඕන නිසා මා එතුමා දැනුවත් කළා මුලින්ම. සරත් ශ්‍රී ලාල් මන්ත්‍රිතුමා පමණයි කිවුවා මේ පිළිබඳ දැනුවත් කමක් තිබෙන ගරු මන්ත්‍රිවරයෙකුට සභාවේ සිටින. මාගේ කනගාටුව . මේ අම්බලන්ගොඩ ප්‍රධාන පාසැලක මේ කොහේවත් සිටින විදුහල්පතිවරයෙකු පැමිණ අම්බලන්ගොඩ ජනතාව ඡන්දය දී එවන මන්ත්‍රිවරු ගැන තිබෙන අගෞරවය. මා කතා කරන්නේ මාගේ සහෝදර මන්ත්‍රිවරයා ගැන නෙමේ. මා කතා කරන්නේ. මා දන්නේ නැහැ මොකක්ද කියා. එතුමා පාසැල නිසා කියනවා ඇති. හැබැයි මෙතැන සිටින අනිත් ගරු මන්ත්‍රිවරු 20ම . ගරු සභාපතිතුමා ඇතුළු අනිත් ගරු මන්ත්‍රිවරු පිළිබඳව කරන මොහු කොතරම්  පහත් පුද්ගලයෙකි. මාත් කියනවා. දැන් ධම්මකුසල විද්‍යාලය නැහැනේ . පෙර පාසැලකට ඕන මෙම විදුහල්පතිතුමා අරින්න. මේ වගේ ප්‍රකාශ කරන. මුළු ලෝකයම පිළිගත් විද්‍යාලයක් ධර්මාශෝක විද්‍යාලය කියන්නේ. මේ වගේ ජාත්‍යාන්තරය පිලිගත් විද්‍යාලයක්. ලංකාවේ වැඩිම ප්‍රමාණයක් හමුදාපතිවරුන් ,එතකොට වර්තමාන මැතිවරණ කොමසාරිස්තුමා, ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමා,ගුවන් හමුදාපති, පොලිස්පතිවරු. පොලිස්පතිවරු දෙදෙනෙකු බිහි කළා.වර්තමාන නාවික හමුදාපති, ඒ වගේම දේශීය ආදායම් බදු කොමසාරිස් කාර්යාලයේ ආදායම් බදු කොමසාරිස් ආදි මේ සියළු දෙනා නියෝජනය කළ විද්‍යාලයේ විදුහල්පතිවරයා මේ වගේ 2.50 වචන ප්‍රකාශ කරන විට කොච්චර කැතද ?එමනිසා මේ විදුහල්පතිතුමා අම්බලන්ගොඩ නගරයට ගැලපෙන්නේ නැහැ.මෙතුමාගේ මේ තරහා තිබෙන්නේ අපි මේ ළමුන් වෙනුවෙන් අමාත්‍යාංශයට ගිය එක ගැන. එතුමා මට කියනවා අමාත්‍යාංශයට ගිහිල්ලාලු ඔගොල්ලන්. මා කිවුවා අපි අමාතශායංශයට ගියා. අපේ ළමුන් වෙනුවෙන්. ඉතිං අපේ ළමුන් වෙනුවෙන් අමාත්‍යාංශයට ගියා. එය නගරයේ ළමුන් වෙනුවෙන්. එය පක්ෂයක් භේදයක් නැහැ. අපි සියළු දෙනාම ගියා.ගියාම එකටත් කැඩෙනවා නම් මෙයාට මෙයා වැරදි වැඩක් කරලා. මොකද අමාත්‍යාංශයේ ජාතික පාසැල් අධ්‍යක්ෂකතුමා පිළිගත්තා ගරු  සෝභිත මන්ත්‍රිතුමා පාරකින් මෙහා පැත්තේ තිබෙන විද්‍යාලයක් අනිත් පැත්තට ගන්න බැහැ කියා. එතුමා පිළිගත්තා මෙහෙම පාරෙන් මෙවේලා තිබෙනවා නම් මෙය එකම පාසැලක් නෙමේ

කියා. එහෙම ගන්න බැහැ කියා. එහෙම ජාතික පාසැල් අධ්‍යක්ෂකතුමා පිළිගන්නවා නම් විදුහල්පතිතුමාට පිළි ගන්න බැහැ. අපි කරපු කතාව වැරුද්දක්ද ? එමනිසා මේ වගේ 2.50 තුප්පැහි විදුහල්පතිවරු අම්බලන්ගොඩ විද්‍යාලවල තියන්න අවශ්‍ය නැහැ ගරු සභාපතිතුමනි. ඔහු අරින්න ඕන.මගේ ළමයි දෙන්නා හින්දා ඔබතුමා ඔය විදියට කතා කරන එක වැරදියිලු.ඔබතුමාට ළමයි දෙදෙනෙක් ඉන්නවාලු. මා විදුහල්පතිතුමාට කියලා ආවේ එවේලාවේ. මාගේ ළමයි දෙදෙනා මේ පාසැලේ සිටියා කියා මට මේ පාසැල ගැන කතා නොකර ඉන්න බැහැ කියා. මා ඒ වේලාවේ කියලා ආවේ. වරදක් කරනවා නම් අපි කතා නොකර ඉන්නවා නම් ඒ පාසැල ගැන අපි කතා නොකර ඉන්න ඕන. මාගේ ගරු මන්ත්‍රීවරු 20ට. ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා නැතිව එතුමා විතරයි කිව්වා මේ පිළිබඳව කතා කරන්න පුළුවන් වෙන්නේ. සභාවේ දැනුවත් මන්ත්‍රීවරයෙක් ඉන්නේ. ගරු සභාපතිවරයා ඇතුළු සියළු ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාට කරන ලද මේ අපහාසය දැඩි පිළිකුලෙන් අපි හෙලා දකිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා පිළිබඳව අතිශයින් මා කනගාටු වෙනවා. ධර්මාශෝක විදුහලේ විදුහල්පතිවරයා පැය 24න් ගෙනඑනු ලැබුවේ මම. ඒ පුද්ගලයා ගෙන එම පිළිබඳව අම්ලන්ගොඩ ජනතාවගෙන් දහස් වාරයක් සමාව ඉල්ලා සිටිනවා. මොකද මා ධර්මාශෝකේ ඉගෙන ගත් පුද්ගලයෙක් විදියට ධර්මාශෝකයට ආදරය කරන පුද්ගලයෙක් විදියට ධර්මාශෝකයට පිටස්තර පුද්ගලයෙක් හොයා ඉන්න කොට මගෙත් එක්ක යුධ හමුදාවේ එකට සේවය කරන ලද කෙනෙකුගේ කන්තලේ අධ්‍යාපන අධ්‍යක්ෂවෙලා හිටිය මොහු එවකට අපේ උතුරු නැගෙනහිර ගරු ආණ්ඩුකාර වෙලා හිටිය ඔස්ටින් ප්‍රනාන්දු මහතා මා දුරකථනයෙන් කතා කර කිව්වාම පැය දෙකෙන් මොහු එම සේවයෙන් නිදහස් කර දුන්නා. ගරු හිටපු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාත් කිව්වා විතරයි මා නිදහස් කර දුන්නා. පැය 24න් ගෙනාවේ. මා අතිශයෙන් කනගාටු වෙනවා ඒ ගැන. අම්බලන්ගොඩ නගරයේ ඔබතුමා ඇතුළු අපි සියළු දෙනා මෙතැනට ගෙන එනු ලැබුවේ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ගුරුවරු. අනෙකුත් මෙතුමා කිව්වු ඔය සියළු දෙනා ඔය පුටු වල වැජඹෙන්නේ අම්බලන්ගොඩ ධර්මාශෝක මතාවට පිං සිද්ධ වෙන්න. ඒ අපේ ගුරුවරුන්ට පිං සිද්ධ වෙන්න. අපට අද මෙහෙම කතා කරන්න හයියක් දුන්නේ අපේ ගුරුවරු. එමනිසා අපි සියළු දෙනාම පාසැලට ණයයි. හැබැයි මේ වගේ තුට්ටු දෙකේ විදුහල්පතිවරයෙක් ගැන මාගේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා. ඔහුට කිසිම අයිතියක් නැහැ. අම්බලන්ගොඩ නගරය , ගම නියෝජනය කරන මේ ගරු මන්ත්‍රීවරු හෙලා දකින්න. පක්ෂ භේදයක් නැහැ. අපි ඔබතුමාට හැම දෙයකටම සහායෝගය දෙනවා. අපි ඕනම පාසැලකින් ඉදිරිපත් කරන ඕනෑම දෙයකට සහායෝගය දෙනවා. ඒ විතරක් නෙමේ අපි වතුගෙදර පාසැලකින් ඉල්ලීමක් කළහොත් අපි ඒකටත් සහායෝගය ලබා දෙනවා. අපි අධ්‍යාපනය ලබන කුඩා දරුවන් කාටත් ආදරේයි. අපි හැමදෙයටම දෙනවා. හැබැයි අපේ නගරයේ දෙවැනි පුරවැසියා වන්නේ මෙතුමා. ඔබතුමා පලවෙනි පුරවැසියා. එහෙමනම් මේ අම්බලන්ගොඩ නගරයට ගෙන්වා ගත් මේ පච්කාර විදුහල්පතිවරයා පිළිබඳ මාගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. මා පුවත්පත් වලට කියනවා මාගේ වචනයෙන්ම ප්‍රකාශ කරන්න. කිසි දෙයකට භය නැහැ. එමනිසා මෙයට මෙහෙම වෙන්න දෙන්න බැහැ. මා ගෙන ආ නිසා තමයි මා සමාව ඉල්ලුවේ. යවනවා ඇත්තටම . මේක

නොවුණානම්. මෙලහකටත් යවලා. යවන්නේ මේ ළඟ අහළ පහළකට නෙමේ. යවන්න ඕන තැනට යවන්නේ. එහෙම සැලසුමක් යවන්න හදලා තිබ්බේ. නඩුවක් දැම්මේ නැතිනම් එහේ තමයි එයා ඉන්නේ. එහෙමනම් යවනවා. මා එයාට කිවුවා යවනවා කිවුවා. එමනිසා ධර්මාශෝකයේ ආදි සිසුවන් විදියට මින් ඉදිරියට අත්සනින් ධර්මාශෝක විද්‍යාලයේ ඉල්ලිම් වලට දහ වතාවක් සලකා බලා තමයි අනුමැතිය ලබා දිය යුත්තේ. ඔය විදියට නම් මේ සභාවේ ඔබතුමා ඇතුළු අනෙකුත් ගරු මන්ත්‍රිවරුන්ට වචන පිට කරන්නේ. එයාගේ විදුහල්පතිකම එයා තියා ගත්තාවේ. මේක අම්බලන්ගොඩ අපේ නිජබිම. මෙකට ඇවිත් එයාට වැජඹෙන්න දෙන්න බැහැ. එයාට නිතිවිරෝධි වැඩ කරන්න දෙන්නත් බැහැ. මා හැබැයි දෙමාපියන්ට කිවුවා . දේශපාලන භේදයක් නැහැ. ඕනවේලාවක බහිමු පාරට. මෙයා එලවනකම් අපි බහිනවා පාරට. මොනම දේශපාලනයක් වුණත් . අපි එතැන ඉන්නවා. මොකද අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්. එමනිසා ඕනෑම වේලාවක බහිනවා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්. මෙයා කරන මේ බලු වැඩ . අපි ළඟ තිබෙනවා ඕන තරම් සාක්ෂි. මෙයා කර බලු වැඩ. එමනිසා අපි ඕනෑ වේලාවක ඒවා ඉදිරිපත් කරන්න සූදානම්. කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු උප සභාපතිතුමා ඇතුළු ඒ අප හැම දෙනාටම කළ දේ ගැන බලවත් කනගාටුව හා අප්‍රසාදය ප්‍රකාශ කරමින් ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර හා ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රි ලාල් මහතාත් නිතර ගැටෙන අය . අපිත් මේ ආදි ශිෂ්‍ය සංගමය වසර ගණනක් කොළඹ සිට පැමිණ නියෝජනය කළා. අපිත් කොළඹ සිට පැමිණ. අනිත් එක එයාට කෙළෙහි ගුණ මතක නැහැ. කෙළෙහි ගුණ පුරුදු කරන්න වෙනවා. ආදි ශිෂ්‍යයන්ට සලකන විදිය කියා දෙන්න වෙනවා. නගරයේ ප්‍රධාන පුරවැසියාට සලකන හැටි කියා දෙන්න වෙනවා. නගරයේ නියෝජනය වන ගරු මන්ත්‍රිවරුන්ට සලකන හැටි කියා දෙන්න වෙනවා. ඒවා ඉගෙන ගෙන නැහැ. ඒ පිළිබඳවත් බලවත් කනගාටුව හා අප්‍රසාදය ප්‍රකාශ කරමින් . ඔබතුමා අරුණ ප්‍රදිප් නෙමේ. ඔබතුමා මේ නගරයේ ප්‍රධාන පුරවැසියා. එමනිසා එම ගරුත්වය අපි ආරක්ෂා කළ යුතුයි. පක්ෂ භේදයක් නැහැ අපිට. එමනිසා මේ විදුහල්පතිවරයො ධර්මාශෝක විද්‍යාලයේ ඉන්න තාක් කල් මේ විදියට අපටත් වෙනවා ඒවාට ප්‍රති උත්තර සපයන්න මේ සභාවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා හා ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් මහතා කරුණු දැක්වුවා. මිට පසු මොනවා හරි කරනවා නම් සිය දහස් වතාවක් කරලා තමයි කරන්න වෙන්නේ.එහෙම කරන්න සිදු වීම ගැනත් මා ගොඩක් කනගාටු වෙනවා. මොකද දැන් සිටින විදුහල්පතිතුමා ධර්මාශෝකය දැකලවත් නැතිව ඇති අපි ධර්මාශෝකයට යන විට. මා 1984 වසරේ ක්‍රිඩා නායකවරිය. ඒ වගේම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකාවක් ලෙස වැඩ කටයුතු කළා. එමනිසා අපට අපේ පාසැල ගැන ගොඩක් කැක්කුමක් තිබෙනවා. මොකද අද අපට මේ වෘත්තියට එන්න ශක්තිය ධෛර්ය දුන්නේ මේ පාසැල් මාතාව. අපි අදටත් ධර්මාශෝකය කිවුවාම ගොඩක් සලකන තැනක්. ඔබතුමා අද නිතිඥ මහතෙකු ලෙසත් අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් සිටිමේ ගෞරවය ඔබතුමාගේ දෙමාපියන්ගේන් පසු හිමිවිය යුත්තේ ධර්මාශෝක විද්‍යාල මාතාවට. මුලික අධ්‍යාපනය ලැබුවේ ධර්මාශෝක විද්‍යාලයේ. මෙතැන සිටින සියළු දෙනාම ධර්මාශෝක විද්‍යාලයට ආදරේයි. මෙහි සිටින්නේ අම්බලන්ගොඩ නගරය නියෝජනය කරන ගරු මන්ත්‍රිවරු 21නා. මේ 21 ම ධර්මාශෝක

විද්‍යාලයට ආදරේයි. මේ පාර ළමයින් ගැනීම සම්බන්ධව මටත් පැමිණ කිවුවා. ධර්මාශෝක විද්‍යාලයට මොකක් හරි දෙයක් කරන්න ඕන කිවුවා. ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමිකය තිබිය යුත්තේ එය තිබිය යුතු තැන. එම ප්‍රාථමිකය තියෙන කොට අපි පාසැල් යන විට හිටියේ අ.ම. කරුණාරත්න මැතිතුමා. අරයගේ ළමයාද මෙයාගේ ළමයාද නම්වලින් කියා තමයි පාසැලට ගත්තේ. ඉතිං දැන් ප්‍රාථමික විද්‍යාලය තිබිය යුතු තැනයි තිබිය යුත්තේ. අපි උද්ඝෝෂණයක් කළා. එය කරන විට මා ගියා. ගරු සභාපතිතුමාත් මට එච්චර හොඳ ප්‍රතිචාරයක් එතැන තිබ්බේ නැහැ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ලෙස එයට සහභාගි වීම ගැන. අපි ගිහින් දැඩි විරෝධය පළ කරන කොට මටත් ගරු නිලානි මන්ත්‍රීතුමියටත් කියා තිබුණා ඔය පාසැලේ විදුහල්පතිතුමා කියා තිබුණා. ළමයින් නැති අයත් මෙයට සහභාගි වුනා කියා. මට ඔය තත්ත්වය එක රැස්වීමට එතුමා කියා මට අපේ නීතිඥ සංගමේ මහත්මීන් දෙදෙනෙකු මට ඇසෙන්න කියනවා. හැබැයි ඒ නීතිඥ මහත්වරු දෙදෙනා මේ අම්බලන්ගොඩ නෙමේ. අම්බලන්ගොඩ ආසනයේ වත් නෙමේ. බලපිටිය බෙන්තර නීතිඥ මහත්වරු දෙදෙනෙක් මට ඇහෙන්න කියනවා හරි කැතයිනේ විදුහල්පතිතුමාට විරුද්ධව බෝඩ් උස්සාගෙන ඉන්නවා නේ මේ ළමයින් නැති කට්ටිය කියා. මා ඒ වේලාවේ කට තද කරගෙන හිටියා. මොකද මා සහෝදර නීතිඥ මහත්වරු සමඟ ගැටෙන්න යන්නේ නැහැ. ළමයින් නැතිව හරි අපට කිරි එරුණා. එමනිසා ගිහින් අපි ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ගිහින් කෑ ගැහුවා. අපි ඔබතුමාට කියලා කෑගහලා අපි ගියා ගරු අධායපන අමාත්‍ය ඩලස් ඇමතිතුමාට . අපි ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතාත් ගියා. ඒ වේලාවේත් මා එන්න ඇරලාත් කිවුවේ ඇමතිතුමා පොඩ්ඩක් දෙන්න මට විනාඩි 5ක් ඔබතුමා හිතන්න ඔබතුමා ඉන්නේ ඔතන ගරු සභාපතිතුමා ඉන්නේ මෙතැන මා ඉන්නේ මෙතැන. ඔබතුමා ඉන්න තැන සිට ඇල්ලුවොතින් සර්කල් එක ඔබතුමාත් අහුවෙනවා . ගරු සභාපතිතුමා ඉන්නතැන සිට අවොතින් 5ක් අඩු වෙනවා කියා. ඒ පාර තමයි තේරුම් ගත්තේ මට දැනුයි තෙරුණේ කියා. එතකොට එය පිළිගත්තා. එතකොට ප්‍රථමික විදුහලේ සිට හැමදාම ගනු ලැබූ සම්ප්‍රදාය වෙනස් කරමින් මේ විදුහල්පතිතුමා අත්නෝමතිකව ක්‍රියා කරන්නේ එතුමාගේ බූදලයක් ද මේක. එතකොට අම්බලන්ගොඩ නගර සභාව නියෝජනය කරන පුද්ගලයෙකු විදියට අම්බලන්ගොඩ ඉපදුන අය විදියට අපි මෙයට නැගී සිටින්නේ නැතිනම් අපි මොක්කුද මෙහි. එතුමා මේ හෙට අනිද්දා යාවි එතුමාගේ ගම් රට බලා. අපි මේ ගමේ ඉන්න ඕන. අපේ ගමේ පාසැලට යන්නේ. අපේ අම්බලන්ගොඩ ඉපදුන ළමයින්ට පාසැලක් නැතිනම් කන්දේ ගොඩටද යන්න කියන්නේ. ඒකට අපි ඉඩ තියන්නේ නැහැ. අපි මේ සටනේ ඉන්නවා. අපිට මේ විදියට සලකන කුඩාම්මාගේ සැලකිලි සලකන විදුහල්පතිවරයෙක් ඉන්න තාක් කල් අපේත් පාසැල තමයි එම පාසැලට උදවු කරන විට සිය දහස් වාරයක් හිතන්න ඕන. එදා නාවික හමුදාපතිතුමා පාසැලට පැමිණි අවස්ථාවේ මා කිවුවා අපේ ගරු සභාපතිතුමාටවත් ඇයි ආරධනයක් නොකලේ කියා. අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා එක මෙහෙමයි මෙහෙමයි කියා කතන්දරයක් කිවුවා. මා එමනිසා සද්ධනැතිව හිටියා. නමුත් එදත් කළේත් වැරැද්ද. එදත් අම්බලන්ගොඩ නගර සභාවට ඔය විදුහල්පතිවරයා දුන්නේ කුඩම්මාගේ සැලකිල්ල.තුට්ටු දෙකේ විදියට වැඩකරන විදුහල්පතිවරයෙක්.තමන්ගේ අම්බලන්ගොඩ ප්‍රධාන පාසැලේ ඉගෙනගත් අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන පුරවැසියාට හා එයාව එතැනට ගෙන ආ අපේ ගරු මන්ත්‍රීතුමාටවත් ආරධනයක්

- **පස්වරු 12.35ට ගරු සභාපතිතුමා ගරු සභාවෙන් නික්ම ගියහ.**
- **පස්වරු 12.35 ට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ගරු සභාවේ මූලාසනයට පැමිණීම.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

නැහැ. ආදි ශිෂ්‍යයෙක්. එතකොට මෙතුමා සංවිධායකතුමා. අපේ පාලනයක් තිබ්බේ නැහැ. කුහක විදුහල්පතිවරයෙක්.තමන් ගැන තමන් දන්නේ නැති විදුහල්පතිවරයෙක් ගැන මාගේ අප්‍රසාදය පළ කරනවා. ගරු සභාපතිතුමා දැනටත් කියන්නේ ධර්මාශෝක විද්‍යාලයට මොනවා හරි දෙයක් කරනවා නම් අනිත් අයට තිබෙන කැක්කුම අපිටත් තිබෙනවා. දෙනවා විද්‍යාලයට කරන්න. එයාට ඕන මොනවා හරි තිබෙනවා නම් මෙහේට ඇවිත් ඉල්ලන්න කියන්න. අපි එහේ සාකච්ඡාවලට යන්න ලැහැස්ති නැහැ. එයාට ඕන නම් එයාට එන්න කියන්න මෙහාට. අපි හරි කැමතියි උදවු කරන්න. අපේ පාසැලට. ඒ කරන ක්‍රමයට ඕන අපි කරන්න. අපිට උදවුවක් කරනවා නම් අපි ප්‍රතිඋපකාරයක් උපකාරයට කරනවා. අපිට කරනවා නම් පෙරලා ඒ දේ කරන්න ඕන. එමනිසා දැඩි සේ ක්‍රියා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා. මට ඉස්සෙල්ලා කියන්න අමතක වුණා. මේ ගම් වාසීන් ඉල්ලා සිටින්නේ. මේ ඔක්කොම අත්සන් කර තිබෙනවා. මෙම ශ්‍රවනාගාරය තිබෙන්නේ ඇතුලේ. එහි තිබෙනවා වාහන නතර කිරමිට. ආරක්ෂක අංශයක් ඉන්නවා.මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා . ගම් වාසින් ඉල්ලා සිටින නිසා නගර සභාවෙන් ගම්වාසින්ට අවහිර නොවන පරිදි බෝඩ් එකක් ගසන්න ගම්වාසින්ට අවහිර නොවන පරිදි වාහන නතර කරන්න කියා.එතකොට පාසැල දැන ගන්න ඕන ශාලාව දෙනවා නම් අර වාහන ප්‍රශ්නය විසඳා ගන්න. ගමේ ජනතාවට කරදරයක් නොවන විදියට ශාලාව ලබා දෙන්න කියා අපි මෙහෙන් ලිපියක් යවන්න ධර්මාශෝක විද්‍යාලයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා කතා කරමින්</u>**

දැන් ඔය ගම්වාසීන් කියපු විස්තරේ සම්පූර්ණ සාධාරණයි. ඒ මිනිස්සු ඉස්කෝලෙ පොඩි කාලෙ ඉඳලම හිටපු මිනිස්සු ඔතන. ඒ මිනිස්සුන්ට අවහිරයක් වෙන්න දෙන්න බෑ. ඒක හරි. නමුත් දැන් මෙතන මත දෙකක් තියෙනවා. ගම්වාසීන් එකක් කියල එවල තියෙනවා. විදුහල්පතිතුමා එකක් කියල අවල තියෙනවා. මම යෝජනා කරනවා. විදුහල්පතිතුමාවත් කැඳවන්න මේ නගර සභාවට. ගම්වාසීනුත් ඔක්කොම කැඳවන්න මේ නගර සභාවට. අපිවත් කැඳවන්න. මන්ත්‍රී මණ්ඩලයත් කැඳවන්න. ඔක්කොම මේක තීරණයක් හැටියට අරගෙන හැමෝම මං හිතන්නෙ අපේ ඔක්කොම මන්ත්‍රීවරු කැමති වෙයි. ඒක යෝජනාවක් හැටියට අරන් වහාම දිනයක් දාල කැඳවන්න විදුහල්පතිතුමා,ගම්වාසීන් සහ අපි. කැඳවල අපි තීරණයක් ගන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ගම්වාසීන්ට අදාල මන්ත්‍රීවරයා මම.කරිත්තකන්ද කොට්ඨාසෙ. පාසලත් අදාල මට. මේක මහ බරපතල කාරණාවක් නෙමේ.ඉතාම සරලව විසඳගන්න පුවන්

ක්‍රමවේදයක් තියෙනවා. මෙතන තියෙන ප්‍රශ්නේ මේ රඟහල නොදී ඉදීම පැය 24 න් කරන්න පුළුවන්. පාසලත් රජයෙ ආයතනයක්. හෙට ඉඳල මේක පොදු මහජනයාට නොදෙන්න තීරණය කරොත් ඒ තීන්දුව එහෙමයි. එතකොට නෑ ඒක තමයි. අපහසුතා මං මේ පෙන්නල දෙන්නෙ. අම්බලන්ගොඩ නගර සභාව විදියට අපට හෝල් එකක් තිබුණා.ඒක අද නැහැ. මොකද ජනතාව සියලු දෙනාටම පොදු කටයුතු සඳහා පොදු උත්සවයක් පවත්වා ගන්න තිබුණු එකම රඟහල මේක. අපි ගහගෙන විසඳගන්න පුළුවන් ප්‍රශ්නයක් නෙමේ. ඒ වගේම පොදු මහජනතාවට ෂෝ එකක් පෙන්නන කොට එන වාහන හසුරුවන්න කිසිම පුද්ගලයෙකුට පුළුවන්කමක් නැහැ පොලිසිය හැර. ඔය කියන විදියට ගේට්ටු දෙක ඇරියත් පොඩිවුන් සෙල්ලම් කරන වොලිබෝල් කෝට් එකයි පිටින් තියෙන ක්‍රීඩාගාර දෙකයි තමයි විනාශ කරල යන්නෙ. ඒ නිසා ගේට්ටුව ඇරියොත් වාහන 10 ක් විතර ගහගන්න පුළුවන්. හැබැයි ඒ උත්සවේට පිටින් එන අමුත්තන් සඳහා සංගීත කණ්ඩායමක් නම් ඒ ගොල්ලන්ගෙ බස් වාහන සඳහා තමයි ඒ පහසුකම එතන තියල තිබුණේ. ඉතින් මේ කාරණාව මම දකින විදියට ගමේ මන්ත්‍රීවරයා විදියට මේක අපට තිබෙන්නේ පොදු මහජනතාවට ඔත්තේ ඉරට්ටේ බෝඩ් එක ගහල පාර්ක් කරන්න දීම විතරයි. මොකද ජනතාව එක්ක මං කතා කරා. ඒ අය ඒකට කැමතියි. ඒ අය කියන්නෙ මේ පාර දෙපැත්තෙම ගැහීම තුළ තමයි ඒගොල්ල අපහසුතාවයට පත්වන්නෙ. එක පැත්තක ගහනවනම් මේ ප්‍රශ්නෙ නැහැ කියලා. ඉතින් ඒක තමයි ඒ අයගෙ ඉල්ලීම. අපට තිබෙන්නෙ ඔත්තෙ ඉරට්ටේ බෝඩ් ටික ගැහීමත් අවසාන කොනේ නෝ පාර්කින් බෝඩ් එක ගැසීමත් විතරයි ගරු සභාපතිතුමනි. ඉතින් ඒක නිසා බොහොම සරල කාරණාවක්. වාද විවාද අරන් හදන්න දෙයක් නැහැ මේකෙ. මේක කරාම ඒ අයට බලය එනවා පොලිසියට 119 එකට ගහලා එහෙම නැත්නම් ඒ අදාල රාජකාරි ඕනම උත්සවයකට පොලිසියෙන් ගෙන්නනවා. ඒ අය දැනුවත් කරන්න මෙතන නීති විරෝධී පාර්කින් කරල තියෙනව කියල. නම්බර් එකත් එක්ක.මොකද සාමාන්‍යයෙන් අපි වුණත් ඔත්තෙ ඉරට්ටෙ ගහපු තැනක වාහනයක් පාර්ක් කරල යන්නෙ නැහැ නිති විරෝධීව. ඒ නිසා එක සැරයක් දෙපාරක් ඕක කරනකොට නිකන්ම නීතියට අනුගත වෙයි මං හිතන්නෙ. බොහොම සරලයි. මෙවැනි කාරණාවකදී අපි හැම පැත්තක්ම බැලිය යුතුව තිබෙනවා. ඒ නිසා ඒ කාරණාවට අනුගත වෙන්න. කියන ඉල්ලීම මම මේ ගරු සභාවෙන් ඉල්ලනවා. බොහොම ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතතිතුමනි, දැන් මෙතන ඉදිරිපත් වුණා මේ අම්බලන්ගොඩ ධර්මාශෝකෙ ශාලාව නිසා ජනතාවට ඇතිවෙලා තියෙන ප්‍රශ්නය පිළිබඳව. අපේ ගරු සරත් මන්ත්‍රීතුමා කරපු විසඳුම තරමක් සාධාරණයි. ඒක එහෙම වෙනකොට එතකොට ස්වීම්ෆුල් එක පැත්තෙ ඒ ගොල්ලොන්ගෙ තරඟ පවත්වන කොටත් මේ ප්‍රශ්නයම ඇති වෙනවා. එතකොට වාහන කොළඹින් එනවා. කෙරුම්කාරයොන්ගෙ වාහන ගොඩක් එනවා.එතකොට ඒකෙනුත් අපහසුතාවයට පත්වන්නේ ප්‍රදේශයේ ජනතාව. එතකොට අපට මෝටර් සයිකලේකින්වත් යන්න බැරි තත්ත්වයක් තමයි ඒ පාරෙ තියෙන්නෙ. ඊට අමතරව මං මේ ඉතාම කෙටියෙන් කියන්නෙ විනාඩි දෙක තුනකින්. පොල්වත්ත ක්‍රීඩාංගනය මේ වෙන කොට ප්‍රසිද්ධ ක්‍රීඩාංගනයක් බවට පත්වෙලා අවසානයි. විද්‍යාලවල මලල ක්‍රීඩා තරඟ , ක්‍රිකට් ක්‍රීඩා තරඟ ඒ ආකාරයෙන් පැවැත්වෙනවා. මේ සියලු තරඟ නිසා ඒ ඒ ප්‍රදේශවල ජනතාව ගමනාගමන අපහසුතාවයට පත්වෙනවා. ඒ නිසා මේ සියලුම කාරණා නිසා ජනතාවට මේ සිදුවන අපහසුතාවයන් කුමන හෝ ආකාරයකින් විසඳීම නගර සභාව සතු වගකීමක්. ඒ නිසා අන්න ඒ වගකීම නිසියාකාරව ඉටුකරල මේ ප්‍රශ්නෙ විසඳයි කියල මං බලාපොරොත්තු වෙනවා.

ධර්මාශෝකෙ ගැන කියනවනම් ධර්මාශෝකෙ විදුහල්පතිතුමා සම්බන්ධව සහ මැනේජ්මන්ට් එක සම්බන්ධව මුලින්ම විරෝධතාවය ප්‍රකාශ කරේ මම. ඔබතුමාලට මතක ඇති. මොකක්ද මේ බදු මුදලකින් නිදහස් කරන්න කියන එකට මම එදා ඉදිරිපත් වුණාම මම එදා කුහකයෙක් වුණා.මම මගේ ශක්තියෙන් ඉදිරිපත් වුණේ අම්බලන්ගොඩ ජනතාවට සහන සැලසිය යුතු බදු මුදල් කපා හරිනවා. අම්බලන්ගොඩ ජනතාවගෙ ළමයින්ට ධර්මාශෝකෙට යන්න බැහැ. එතන පරස්පරයි. එහෙම වෙන්න බැහැ. ඒක තමයි මං හිතන්නෙ මතුකරේ. නැතුව මමත් ගිය ඉස්කෝලෙ තමයි ධර්මාශෝකෙ. මම ඉගෙන ගත්තු පාසලට කුහක වෙන්නෙ නැහැ. නමුත් ඒ ආකාරකමට මම විරුද්ධයි. ඒ නිසා මං විරුද්ධ වෙන්න පටන් ගත්තා. ඊට අමතරව ගරු ඩෙනට් මන්ත්‍රීතුමා විදුහල්පතිතුමා ගෙනාපු මුල් දවසෙ රැස්වීමට මමත් සහභාගී වුණා. ඔබතුමාට සමහරවිට මතක නැතිව ඇති. මමත් සහභාගී වුණා.එදා එයා පාපොච්චාරණයක් කරා. මෙහෙමයි මම මෙහෙමයි කියල ලොකු දේශනයක් කරා. බොහොම ප්‍රගතිශීලී දේශනයක්. නමුත් අද වෙනකොට ඒ ප්‍රගතිශීලී දේශනයේ ප්‍රායෝගිකත්වයකින් තොර බවක් තමයි අද අපට පෙනී යන්නෙ. ඒ නිසා ඔහුගේ ක්‍රියාකලාපය තවත් පුද්ගලික සිදුවීම් ගණනාවක් සිදුවෙනවා මා ඔහුත් සමග.ඒව වැඩක් නැහැ. නමුත් මේ විදුහල්පතිතුමාගේ මේ ක්‍රියාකලාපය අපේ ගරු මන්ත්‍රී මණ්ඩලය සම්බන්ධයෙන් වගර සභාව සම්බන්ධයෙන් දක්වපු එයාගෙ හැසිරීම අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. හෙලා දකිනවා. ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ ධර්මාශෝක විද්‍යාලයෙ විදුහල්පතිතුමා ගැන නොයෙකුත් දේවල් කතා කරා. ඇත්තටම අපි බොහොම කණගාටු වෙනවා. පහුගිය යහපාලන කාලෙ ඉඳන් බලපිටිය ප්‍රාදේශීය සභාවෙ සමහර මන්ත්‍රීවරුත් ළමයි දාන්න ගත්තා මේ ධර්මාශෝකෙට. ගරු සභාපතිතුමනි ඇත්තටම මේ මාර්ගය සම්බන්ධව කතා කරනවනම් අපි බලන්න ඕන ආපේ නගරෙ පුරවැසියන් ගැන. මොකද සංගීත,ටෙලිනාට්‍ය, වේදිකා නාට්‍ය කරල එම අය මුදල් අරගෙන යනවා.නමුත් අපේ නගරයේ අපට බදු මුදල් දෙන ජනතාව ගැන අපි වැඩියෙන් හිතන්න ඕන. මොකද සමහර පාරවල් වන්වේ කරල තියෙනවා ඉස්කෝලෙ යන එන වෙලාවල්වලට. එම මාවතේ ඉන්න ජනයාට යන්න එන්න බැරි තත්ත්වෙකුත් උදාවෙලා තියෙනවා. ඒවා අපි පැනෙව්වේ පහුගිය වකවානුවේ කලබල තියෙන කාලෙ. දැන් නම් මං හිතන්නෙ නැහැ ඒව අවශ්‍ය වෙනව කියල. අපි ඒ ගැනත් පොඩ්ඩක් සිතා බලන්න ඕන. මොකද දැනටත් කුලරත්න පාර සහ ධර්මාශෝක මැද පාරත් ඉස්කෝල වෙලාවට වසා තිබෙනවා. පුළුවන්නම් එම පාරවලුත් එම වෙලාවට විවෘත කරල දෙන්න කියල මම ඉල්ලීමක් කරනවා. මොකද ධර්මාශෝකෙ ඉස්කෝලෙ මැදින් ඒ පාර වසා තිබෙනවා. ඒ දෙපැත්තත් ඔය සමගම පොඩ්ඩක් ගෙන්නල ඒකටත් පුළුවන්නම් විසඳුමක් ලබාදෙන්න කියල මං ඉල්ලීමක් කරන ගමන්ම මේ විදුහල්පතිතුමාගේ ක්‍රියාකලාපය පිළිබඳව ඇත්තටම කණගාටු වෙනවා. මොකද ඇල්පිටිය නගරයේ සහ කොහොම වුණත් ඉතින් උප සභාපතිතුමාගෙ වයසෙ එක ලකුණු අරන් එතුමා ළමයා දාල තියෙනවා ධර්මාශෝකෙට. අම්බලන්ගොඩ දෙවැනි පුරවැසියගෙ ළමයා එන්නෑ මේ ඉස්කෝලෙට. ඇත්තටම කියන්න කණගාටුයි. උප සභාපතිවරයෙක්ට ළමයෙක් දාගන්න බැරිනම් ඇත්තටම අපි ලැජ්ජ වෙන්න ඕන. උප සභාපතිවරයාට ළමයා දාගන්න බැරිනම් අනේ මගේ ළමයා කොහොම දාගන්නද? කී පාරක් හිතන්න වෙනවද බලන්නකො. ඇත්තටම මේ විදුහල්පතිතුමා කරන ක්‍රියාකලාපය පහුගිය වකවානුවෙ අවුරුදු ගානක් සීමාව මැන්නෙ ප්‍රාථමිකය තියෙන තැන ඉඳල. මෙම විදුහල්පතිතුමා තමයි මේක අවුරුදු හැත්තෑ ගානක් පමණ වෙනව මං හිතන්නෙ

ඉස්කෝලෙට.එදා ඉඳල ආපු නීතිය මෙතුමා විසින් වෙනස් කරල තියෙනවා. එම නිසා අපේ ගමේ දැනටත් ළමයි දෙන්නෙක් නැත්නම් තුන්දෙනෙක්ට අදටත් ඉස්කෝල නැහැ ගරු සභාපතිතුමනි. මං දන්නෙ නැහැ මොනව කරන්නද කියල. බුද්ධදත්ත විද්‍යාලයට තමයි එක ළමයෙක් දැම්මෙ. අනෙක් ළමයි දෙන්නටවත් තවම යන්න අවස්ථාවක් ලැබිල නැහැ. අපි අධ්‍යාපන ඇමතිතුමත් හම්බවුණා ගිහිල්ල ඔය සම්බන්ධව අපි මන්ත්‍රීවරු සියලු දෙනාම ගිහිල්ල. නමුත් අද වෙනතුරු කිසිම පිළියමක් ලැබිල නැහැ. ඒකෙ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමත් දැනුවත් කරා එදා අපි ගිහිල්ල. එනවනම් ගරු සභාපතිතුමාට දැනුම්දීල එන්න කියල. එතුමත් දැනුම් නොදී සද්දනැතිව ඇවිල්ල වැඩේ කරල ගියා. මොකද එතුමත් මේ ආණ්ඩුවේ ලේකම්වරයෙක් නෙමේ. කලින් ආණ්ඩුවෙ හිටපු ලේකම්වරයෙක්. එතුමා කරන්නෙත් මේ විදුහල්පතිතුමාට අවශ්‍ය දේ තමයි. කොහොමත් ඇත්තටම අපි කණගාටු වෙනවා. අම්බලන්ගොඩ නගරයේ මන්ත්‍රීවරයෙක් පුරවැසියෙක් විදියට අම්බලන්ගොඩ නගරෙ ළමයි මෙම විද්‍යාල ගණනාවක් තියෙනවා. එකම විද්‍යාලෙකටවත් දැගැනීමට බැරි තත්ත්වයක් උදාවෙලා තියෙන්නවා.අඩුම ගානෙ මන්ත්‍රීවරයෙක්ගෙ ළමයෙක්වත් මෙම ප්‍රධාන පෙළේ ඉස්කෝලෙකට දාගන්න බැරිනම් ඇත්තටම වැඩක් නැහැ. අපේ ජයක් තියෙන්නෙ.අපේ ගරු ජනාධිපතිතුමෙක් ඉන්නෙ. ගරු අගමැතිතුමත් අපේ. අධ්‍යාපන ඇමතිතුමා අපේ. අපි ඉල්ලීමක් කරමු ගරු සභාපතිතුමා ඇත්තටම මේ මන්ත්‍රීවරයෙක්ගෙ ළමයෙක්වත් මෙම ඉස්කෝලෙට ඇතුළත් කර ගැනීමේ වරප්‍රසාදය ලබාදෙන්න කියල. නැත්නම් මේක අපට හරි ගැටලුවක් වෙනවා. අපටම ලැජ්ජයි කියන්න අපේ ළමයෙක් ඉස්කෝලෙට දාගන්න බැහැයි කිව්වම. බලපිටියෙ ළමයි මේකට එනවා. ඒ කියන්නෙ අතරමැදින්. පටන් ගැනීමේ ඉඳල නෙමේ එන්නෙ. ඇල්පිටියෙ ළමයි මේ ඉස්කෝලෙට වැටෙනවා. අපේ උපසභාපතිතුමාගෙ ළමයෙක් දාගන්න බැහැ.ලැජ්ජයි. කොහොම වුණත් අපි අධ්‍යාපන ඇමතිතුමාටත් ගරු ජනාධිපතිතුමාටත්,ගරු අගමැතිතුමාටත් ඉල්ලීමක් කරමු මන්ත්‍රීවරයෙක්ටවත් ඔහුගේ ළමයෙක් ඉස්කෝලෙට දාගන්න අවසර දෙන්න කියල. ඒ වගේම මං කණගාටු වෙනවා ළමයි නැති මන්ත්‍රවරුන් දෙදෙනෙක් උද්ඝෝෂණයට සහභාගී වෙලයි කියල විදුහල්පතිතුමා ප්‍රකාශ කර එක ගැන. විදුහල්පතිවරයෙක් ඇත්තටම එවැනි ප්‍රකාශයක් කරන එක සහසුද්දයෙන්ම වැරදියි. නුගත්කම. මං දන්නෑ විදුහල්පතිවරයෙක් වුණාට නුගත්කම. ඒ විදුහල්පතිතුමා හිතන්න ඕන ඒ විද්‍යාලෙ ඉන්න සියලු ළමයි ගැන. එයා එක ළමයෙක්ගෙ පියෙක් නෙමේ.එක ළමයෙක්ගෙ විදුහල්පතිවරයෙක් නෙමේ.මුළු ඉස්කෝලෙම. ඒවගේම අපටත් කැක්කුමක් තියෙනවා ගරු සභාපතිතුමනි මේ අම්බලන්ගොඩ ඉන්න ළමයි ගැන. මෙතුමියන්ලටත් ඒ වගේ කැක්කුමක් තියෙනවා. මෙතුමියන්ලට පාරට නොබහින්න තිබුණා. මොකද මෙතුමියන්ලට ළමයි නෑ කියල මෙතුමියන්ල බැස්සෙ මේ නගරෙ වෙනුවෙන්.නගරෙ ළමයි වෙනුවෙන්. ළමයින්ට ඉස්කෝලයක් නැති වුණාම ඒ මිනිස්සු අධ්‍යාපන ඇමතිතුමා,විදුහල්පතිතුමා හම්බවෙන්න යන්නෙ නැහැ. එන්නෙ අපි ගාවට. අපි තමයි මේ ගැටලුවට මුහුණ දෙන්නෙ. දෙපැත්තෙන් හිරවෙන්නෙ අපි.ඒ හින්ද අපි ඉල්ලීමක් කරනවා අධ්‍යාපන ඇමතිතුමාගෙන් . මේ චක්‍ර ලේඛනය පුළුවන්නම් වෙනස් කරන්න කියල ඉල්ලීමක් කරමින් මං නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

බඩගිනි වෙලාවෙ හොඳම මාතෘකාවක්ඇවිල්ල තියෙන්නෙ. ධර්මාශෝක විද්‍යාලයේ රංගන ශාලාවට පිවිසෙන මාර්ගය අවහිරතා සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කරල තියෙනවා. ගම්වාසීන්. මං හිතන්නෙ ඒ කොට්ඨාසෙ භාර අපේ ගරු සරත් මන්ත්‍රීතුමා කිව්වා විසඳුම අරගෙන

තියෙනවා. මේක සභාවට නොදාම ක්‍රියාත්මක කරල දැම්ම නම් ඉවරයි. ඒක නිසා ඕක සාකච්ඡා කරල ලිඛිතව ගරු සභාපතිතුමා ඔයිට වඩා ගේම් ගහනවනෙ. ඒක කරානම් ඉවරයි.නමුත් දැන් මෙහෙම එකක් තියෙනවා. මේ වෙලාවෙ අපි බුද්ධිමත්ව කටයුතු කරන්න ඕන. සභාව අපකීර්තියට පත්වන ආකාරයෙන් කටයුතු කිරීම එක ප්‍රශ්නෙකට මුල පුරන්න තමයි මේ විදුහල්පතිතුමා මේ කටයුත්ත කරල තියෙන්නෙ. ලිපිය කියෙව්වම ගම්වාසීන්ට කියපු දේ බැලුවහම එතකොට සැලසුමක් අනුමත කරනකොට අපි පාර්කින් බලනවා. රංගන ශාලාවකට කොහොමද තියෙන්නෙ කියල. මං හිතන්නෙ ලේකම්තුමිය එහෙම එකක් තියෙනව නෙ. රංගන ශාලාවක් ඉදිකරන කොට වාහන කොහොමද නතර කරන්නෙ? කොච්චර නතර කරන්න ඕනද? එහෙම තියෙනවා.නීත්‍යානුකූල තත්ත්වෙට යනවනම් ඉස්කෝලෙට විරුද්ධව කටයුතු කරන්න.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රීතුමා මං හිතන්නෙ මේ ගොඩනැගිල්ල හදනකොට එහෙම සැලසුමක් අනුමත කරල නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

අනුමත කරල නැහැ. එතකොට තවත් .තියෙනව ගොඩනැගිලි අනුමත කරල නැහැ සැලසුම් අනුමත කරල නැහැ. ඉතින් එහෙනම් මූලික වරද වෙලා තියෙන්නෙ අර බුද්ධිමත් කියාගන්න විදුහල්පතිතුමාගෙ අතේ තමයි ඕක තියෙන්නෙ. තමන් බුද්ධිමත් කියාගෙන ඉන්න. මේක මං හිතන්නෙ මේ ඒ ප්‍රදේශය තුළ ඉපදිච්ච ප්‍රදේශයේ වරදක්. ධර්මාශෝකෙ කියන්නෙ ඊට එහා ගිහිපු තැනක්. අම්බලන්ගොඩ බුද්ධිමතුන්ගේ නගරය. ඒ වගේම මේ මන්ත්‍රීවරු සියලු දෙනාම හොඳ දැනුමක් තියෙන උදවිය. ඒ වගේම සමාජීය පසුබිමක් තියෙන උදවිය මේවට පත්වෙලා එන්නෙ. මොකද මහජනතාව නිකන් පත් කරල එවන්නෙ නැහැනෙ. අපි නම් පිනට එච්චා. ඒ වගේ නෙමේනෙ. දිනල ඇවිල්ල තියෙනවා. පාලක පක්ෂයේ ඔබතුමාලගෙ පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරල පාලක පක්ෂය භාරදීල තියෙනවා. මේකෙ පූර්ණ වගකීම ගරු සභාපතිතුමා දරන්න ඕන.මොකද හේතුව අපි කියන්නෙ. මේ තීන්දු තීරණ ගැනීමේදී පාසල හෝ වේවා අනෙකුත් ප්‍රදේශවල ජන ජීවිතය හෝ වේවා සියලු දෙනාගේ මහජනතාවට සුභසාධනයක් වන අයුරින් කටයුතු කිරීමේ වගකීම ගරු සභාපතිතුමාටත් තියෙනවා. ඒක නැහැ කියන්න බැහැ. විදුහල්පතිල එනවා. ඔය අම්බලන්ගොඩ ධර්මාශෝකෙ අපි ගිහිපු ඉස්කෝලෙ. විද්‍යාලයට අපි ගරහන්නෙ නැහැ. මේ පත්වෙච්ච විදුහල්පතිතුමාගෙ ක්‍රියාකලාපය දැන් කිව්වා.ඒක තුළ තමයි දැන් මේ ලියුමක් ඔතෙන්ට එවල තියෙන්නෙ. මොකද මේ අහල පහලසිටින ජනතාවගේ කීමට මොනවහරි මේක කරන්න බැහැ. නගර සභාව නෙමේ මේක යෝජනාවක් විදියට එවන්න තිබුණා.විදුහල්පතිතුමාගෙ කාර්යභාරය වෙන්නෙ ඒක. මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. මොකද ආදායමක් ලබනවනෙ විද්‍යාලයෙන්. ආදායමක් ලබනකොට විසඳුමක් ගන්න සාකච්ඡා කරල ගන්න ඕන. මේක මේ අධි මානසිකත්වය තියෙනකොට විනාසයට මුල. ඕකෙ තියෙන්නෙ විදුහල්පතිතුමාගෙ අධි මානසිකත්වයක්. ධර්මාශෝක විද්‍යාලයේ හැබැයි තුන්වැනි පන්තියේ විදුහල්පති කෙනෙක්.තුන ශ්‍රේණියෙ. ඔතෙන්ට පත්වෙන්න ඕන පළමුවන ශ්‍රේණියෙ කෙනෙක්. ඉතින් ඔතන තමයි අපට හිතාගන්න තියෙන එකම දේ. තමන් ඉන්නෙ කොහොමද? වැඩ බලන්න ඇවිල්ල මොකක්ද තමන්ගෙ බලතලය. වැඩ බලන තත්ත්වය තුළ ඇවිල්ල . මේ හැපෙන්නෙ කවුරුත් එක්කද? දේශපාලන අධිකාරියයි පරිපාලනය ඕනම ආයතනයක ඒ ප්‍රධානීන් එක්ක සම්බනදතාවයක් තියෙන්න ඕන. දැන් ප්‍රාදේශීය

ලේකම්තුමියට බලය තිබුණා කියල ලිපියකින් ඉල්ලනව මේක මේව කරන්න. බලධාරියා.ඉතින් එහෙම අත්තනෝමතික විදියට වැඩ කටයුතු කිරීම සම්පූර්ණයෙන්ම හෙලා දකින්න ඕන. ඒ නිසා මේ මාර්ගයේ වැඩ කටයුතු සම්බන්ධව ගරු සරත් මන්ත්‍රීතුමා ප්‍රදේශයේ මන්ත්‍රීවරයා විදියට අපට යෝජනාවක් කරා. මං හිතන්නෙ පොලිසියත් සමග සාකච්ඡා කරන්න. විදුහල්පතිතුමා ඕන්නෑ ඕකට. විදුහල්පතිතුමෙක් ඕන්නෑ. පාර අයිති අපිට. සභාවෙ ගන්න තීන්දුව. විදුහල්පතිතුමා ගෙන්නන්න අවශ්‍යතාවයක් නැහැ අපිට. ගන්න තීන්දුව පොලිසියත් සමග සාකච්ඡා කරල. මොකක්ද ගන්න ඕන මේකට ක්‍රියාමාර්ගය. නෑ අපට වැඩක් නැහැ. කියන එක කියාගන්න පස්සෙ.මේව වැඩක් නැහැ.අපේ තීන්දු අපේ බලය පාවිච්චි කරාම හරි. පාර වහනවනම් වහල දාන්න ඕන මගුලක් වෙන්න. එහෙම නැත්නම් පොලිසිය එක්ක සාකච්ඡා කරන්න. ගමේ ජීවත්වන වැසියන්ගේ අයිතිවාසිකම් සුරකින්න ඕන අපි. පාසලේ අයිතියත් සුරකින්න ඕන. ඒ සුරකින්න බැරිවෙලා තියෙන්නෙ මේ විදුහල්පතිගෙ තියෙන අත්තනෝමතික ක්‍රියාවල් නිසා. මං හිතන්නෙ ගරු උප සභාපතිතුමා ඊට පස්සෙ කිව්ව එතුමා ගියාම කතාකරේ කොහොමද කියන එක ගැන. දැන් බලන්නකො ඔබතුමා ගියා.ඔබතුමාගෙ නමට නෙමේ සලකන්නෙ ඔබතුමාගෙ තනතුරට. නගරෙ ජනතාවගෙ දෙවැනි පුරවැසියා. ඔබතුමාගෙ ප්‍රශ්නයක් තියෙනවනම් ගරු සභාපතිතුමාට කියන්න පුළුවන් ඕනනම් කතා කරල එතුමට. එතුමගෙ වගකීම ඒක.මෙන්න මෙහෙමයි උප සභාපතිතුමා මට මෙන්න මෙහෙම මේ තත්ත්වෙයි කියන එක නෙ. මන්ත්‍රීවරුන්ගෙ ප්‍රශ්නයක් තියෙනවනම් ගරු සභාපතිතුමාට කියල ගරු සභාපතිතුමා හරහා ඒ උත්තරේ ගන්න පුළුවන්. මේක තුළ තමයි මේ නොහැකියාව කියන එක තේරුම් අරන් තියෙන්නෙ. මේ ප්‍රශ්නය මූලිකම වෙන්නෙ ගරු සභාපතිතුමාට ප්‍රශ්ණය ආවෙ. මං හිතන්නෙ පහුගිය.අපිත් ගියා.මොකද අපි යන්නෙ නගරෙ ජනතාවගෙ මොනවහරි ප්‍රශ්නයක් ගැටලුවක් තියෙනවනම් අපි ඒකට මැදිහත් වෙන්න ඕන. අයිතිය ඒක. අපට දීපු මේව එක මහජන නියෝජිතයෙක් හැටියට. ඒක තේරුම්ගන්න බැරිනම් විදුහල්පතිතුමා ඉතින් දෙයියන්ගේම සරණයි ධර්මාශෝක විද්‍යාලෙටත්. ඕක තේරුම් ගැනීමේ හැකියාවක් තියෙන්න එපැයි. මං හිතන්නෙ එතුම කියල තියෙනවනෙ මන්ත්‍රීවරු අවබෝධයෙන් නෙමෙයි කියල කටයුතු කරන්නෙ. එතුමත් ඒ තත්ත්වෙටනෙ වැටිල තියෙන්නෙ.අ වබෝධයකින් නෙමේ කටයුතු කරන්නෙ. ඔබතුමා ගියානම් ඔබතුමාට පිළිතුරු දෙන්න ඕන මෙන්න මේකයි තත්ත්වය මේකයි.කාගෙවත් ප්‍රශ්න මේ මන්ත්‍රීවරුන්ගෙ අවබෝධයක් නැහැ අරහෙ මෙහෙ කියන්නෙ. තනතුරක් කොහෙන් දුනන්ද දන්නෙ නැහැ. උපාධිය කොහෙන් ද දන්නෙ නැහැ ගැහුවෙ.ඒක තමයි අපට අහන්න තියෙන්නෙ. අවබෝධය සාමාන්‍ය දැනීම තියෙන්න ඕන. ඕන මනුස්සයෙක් ආවම ඒ ප්‍රශ්නෙ විසඳන්න. හැබැයි ඒ සාමාන්‍ය දැනීම නැත්නම් ඒ මිනිස්සුන් පිළිබඳව අවබෝධය නැත්නම් මේ ප්‍රශ්ණවලට විසඳුම් දෙන්න බැහැ. අපි මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනා දැන් ඔබතුමන්ල ඒක ගෙනාවට පස්සෙ ඔබතුමාලට වරදක් වෙනවනම් අපෙත් වගකීමක් තමයි තනතුර රැකගැනීම. මන්ත්‍රීවරු හැටියට අපි. අපි ගරු සභාපතිතුමා එක්ක එකතුවෙලා අනික් මන්ත්‍රීවරු එක්ක එකතුවෙලා ප්‍රශ්නයක් තියෙනවනම් විසඳනවා. දැන් සංවිධායකතුමා ගෙන්නුවා. එතුමා කිව්වා මෙතුමට සලකන්නෙ නැත්නම් මං හිතන්නෙ විදුහල්පතිතුමා කොහොමද අනිත් කට්ටියට සලකන්නෙ කියල හිතාගන්න පුළුවන්. මෙතුමනෙ ඒ තනතුරේ මෙහෙට ගෙනැල්ල අර කන්න දීපු අත හපා කනවා වගේ වැඩක්නෙ ඒක. ඒකෙන් හිතා ගන්න පුළුවන් අපට විදුහල්පතිතුමා කොයිවගේද කියන එක. ඒක නිසා මේ ප්‍රශ්නෙ පිළිබඳව අපි හොඳට කල්පනා කරල වැඩ කරන්න ඕන. ඒක නිසා විදුහල්පතිතුමා නැති වුණත් කමක් නැහැ අපිට පොලිසියත් සමග සාකච්ඡා කරල ඒ ප්‍රදේශවාසීන්ගෙ යුතුකම ඉටුකරන්න ඕන. හැබැයි මෙවැනි තත්ත්වයක් තියෙනවනම් වගකීම

කාටද එන්නෙ අපේ ගරු සභාපතිතුමාට තමයි. ඔබතුමා ගරු උපසභාපති තුමා හැටියට පාලන තන්ත්‍රෙය් ඔබතුමාගෙ ගරු ජනාධිපතිතුමා ඒවගේම ඔබතුමන්ලගෙ අධ්‍යාපන ඇමතිතුමා. ගරු ඩලස් ඇමතිතුමා. ඉතින් එතුමලත් එක්ක සාකච්ජා කරල ගරු ආණ්ඩුකාරතුමත් ගරු ජනාධිපතිතුමා පත්කළ එක්කෙනෙක්. මේ සම්බන්ධව ඉහල පෙළේ සාකච්ජාවක් තියන්න. තියල හැබැයි ගරු ඩෙනට් මන්ත්‍රීතුමා පැය 24 න් ගෙන්නුව වගේ ඔබතුමාලට හැකියාවක් තියෙනවා පැය 24 න් යවන්නත්. එහෙම නැත්නම් ඔබතුමන්ලාගෙ මන්ත්‍රී උප සභාපතිකම වත් වැඩක් නැහැ. ඇත්තම කියනවනම්. මෙතුමා පැය 24 න් ගෙන්න ගන්න පුළුවන්කම හැකියාව එතුමට තිබුණා නම් ඔබතුමාල වරදක් කරනවනම් පෙනිපෙනී මහජනතාවට නගරයේ ජනතාවට අසීරු වන ආකාරයෙන් කටයුතු කරනවනම් යැවීමත් ඔබතුමාල මේ දේශපාලන ප්‍රශ්‍ණෙකට නෙමේ. දේශපාලන ප්‍රශ්නයක් නෙමේ මෙතන තියෙන්නෙ. මේ ජනතාව වෙනුවෙන් ළමයි වෙනුවෙන් කටයුතු කරන්න ගියාම.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමත් මේ ආණ්ඩුවෙ හවුල් කරුවෙක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

හවුල්කරුවෙක්.හවුල්කරුවෙක් වුණාට මං මෙහෙමයි . මේ කතා කරන්නෙ පාලක තන්ත්‍රයේ වෙච්ච හානියක් සම්බන්ධව.මොකද හවුල්කාරයෙක් වුණේ අපි ජන්දෙ ඉල්ලනකොට හවුල්කාරයෙක් නෙමේ. මේ නායකයො ගත්ත තීන්දුවත් එක්කනෙ මේ හවුල්කාර කුණ්ඩවාලයක් කර ගහගෙන යන්නෙ.අහක යන මගුලක්. ඒක නිසා මං කියන්නෙ ඒකයි. අහගන්න එපා.මටනම් මොකක්වත් නොකෙරුණත් කමක් නැහැ.මං කියන්නෙ ඒකයි.ඔය ගරු සභාපතිතුමාට ගැන අපි හොඳට අවුරුදු 14 ක් විතර දන්නවා. මෙතනින් මේව කරනවා.අන්තිමට නිලධාරියට කියනව ඕකගෙ එක කරන්න එපා.ඔය වගේ තත්ත්වයකනෙ යන්නෙ. ඒක අවබෝධ වෙලා තමයි අප කටයතු කරන්නෙ. මෙහෙමයි ඔබතුමා කෙලින් කතා කරනවා. ඔබතුමා හරි මැදිහත්වෙලා මේ වැඩේ කරන්න. හැබැයි ඔබතුමාට කරගන්න බැරිනම් ඔබතුමාගෙ උප සභාපති තනතුරෙනුත් වැඩක් නැහැ.අපි කොහේවත් නැති දේකට අපි කෙලින්ම ආවනෙ යන්න. ඔබතුමා එන්න කිව්වහම විදුහල්පතිතුමා මට කතා කරල කිව්වා එන්න කියල ප්‍රශ්නයක් තියෙනව විසඳන්න කියල. ළමයි හතලිස් ගානක් තේරිල නැහැ නගරේ. ඒ වෙනුවෙන් අපේ වැඩ දහසක් දාල එවෙලෙම අපි ගාලු ගිහිල්ල හමුබවුණා ගරු ආණ්ඩුකාරතුමා. හැබැයි එතුමා හොඳට වැඩෙත් කරල දුන්නා. අවුලක් නැහැ. මෙහෙමයි තීන්දුවක් තීරණයක් ගන්නකොට මේක මගින් නතර කරන්න එපා. සමහර මන්ත්‍රීවරු ඉන්නව මේව හිනාවෙවී බලන් ඉඳල එතෙන්ටත් ගිහිල්ල ගේම් දෙන කට්ටිය ඉන්නවනෙ. ඒවයිනුත් ආරක්ෂා වෙන්න ඕන. ඒක නිසා ඒවයිනුත් ආරක්ෂා වෙලා මේ වැඩේ කෙරෙන විදියට වැඩේ කරන්න. හැබැයි අපි නෝන්ඩි වෙන විදියට වැඩ කටයුතු කරන්නත් එපා. යම් තීන්දුවකට ගිහිල්ල අපි ආපස්සට එන්න එපා.ගෙදර ගියත් එහෙම ඉන්න ඕන. ඒකයි මං කියන්නෙ. මට ආරංචියක් ආවා මං දන්නැහැ කවුරු කිව්වද කියල මට කිව්ව එක්කෙනෙක් සභා වාර්තාවක් එතුමා ලඟ තියෙනව කියල. නෑ මං කාටයත් තොප්පිය දාගන්න නෙමේ කියන්නෙ. ඒකෙ මුද්‍රණය කරපු එකම තියෙනවලු. ඉතින් ඕක තමයි තත්ත්වෙ.මෙහෙමයි ජනප්‍රිය පාසලකට ප්‍රශ්නයක් එනකොට නගරයෙ මේ පාසල ගරු සරත් මන්ත්‍රීතුමාට මතකද මේ පාසල අපි ගමට ගෙනියමු කියල යෝජනාවක් ආව ඔබතුමා පාලන තන්ත්‍රයේ ඉන්නකොට. කලින්. ජයන්ත මහත්තය ගෙනාවෙ. මේ පාසල මෙතනින් ඉවත් කරමු කියන එක.නමුත් ඒ වෙලෙත් අපි මේක

රකගෙන මොකද පාලන තන්ත්‍රය තිබුණෙ එක්සත් ජාතික පක්ෂයේ. කෙසේ වෙතත් මේ වැඩකට බහිනවනම් වැඩේ සාර්ථකත්වය කිරීමේ හැකියාව පාලක පක්ෂයේ ඔබතුමන්ලාට තියෙනවා. විපක්ෂයේ අපි සහයෝගය දෙනවා. අපි ඉස්කෝලෙත් එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද අපි ඉගෙන ගත්ත ඉස්කෝලෙ. අදත් ඒක දේවත්වයෙන් සලකනවා. ඒකෙ කිසි ගැටලුවක් නැහැ. මේ කොහෙවක්කත් ඉන්න විදුහල්පති කෙනෙක් දාල තමයි මේ ප්‍රශ්නෙ ඇති වුණේ. ඒක නිසා අපේ සියලු මන්ත්‍රීවරුන්ගේ වගකීම සහ යුතුකම විදුහල්පතිතුමා එක්කො නිවැරදි කරන්න. එහෙම නැත්නම් යවන්න. යවනවනම් වඩාම හොඳයි. මොකද මේ ඉස්කෝලෙට සුදුසුකනුත් නැතුව විදුහල්පති කෙනෙක් පත්කරල තියෙන විපාකනෙ මේ.ඒ නිසා.මං ඉල්ලා සිටිනවා.තීරණය කරන්න ඕන යවන එක තමයි මේක දේශපාලන ප්‍රශ්නෙකට මැදිහත් වෙලා නෙමෙයි.මේ ජනතාවට කරන ප්‍රශ්න සම්බන්ධව තමයි අපි කියන්නෙ.නැත්නම් අපේ පෞද්ගලිකව මේක කරේ නැතිවුණාම කියල නෑ. මේ ජනතාවට වන ප්‍රශ්න මේවයින් මුදවගන්න ඕන.හැබැයි තීන්දු තීරණ ක්‍රියාත්මක කරනවනම් ඉස්කෝලෙට විරුද්ධව ක්‍රියා කරනවනම් ඕනතරම් නීත්‍යානුකූල ක්‍රමවේද අපි ලඟ තියෙනවා.හරි.ඒක ඉතින් මේ ගරු සභාපතිතුමා ක්‍රියාත්මක කරයිද නොකරයිද දන්නෙ නැහැ. හැබැයි වැඩේ ගැස්සිලා ගියොත් ඒකහරි කරන්න ඕන. ඒකයි මං කියන්නෙ. ඒක නිසා මේ වැඩේ නතර කරන්න එපා.අපි ඉල්ලා සිටිනවා. ඔබතුමාට කරපු අපහාසය වගේම නගරයේ ජනතාවට වෙන අවහිරතාවයන් ඉවත් කිරීම සඳහා අපි බුද්ධිමත්ව

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මට විතරක් නෙමේ. මේ මන්ත්‍රීවරුන්ට

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඒක හරි. ඔබතුමා ගියානෙ. ඔබතුමාට ඊට වඩා ප්‍රකාශ කරානෙ. ඒකත් එක්ක මන්ත්‍රීවරුන්ට කරපු මේව එක සම්බන්ධවත් වෙනත් කරුණු යටතෙද මේ කතා වෙන්නෙ.ලිපිය සම්බන්ධවත්.ඒ තත්ත්වය තුළ ඇතිවෙච්ච මේ ගැටුම සම්බන්ධවත් කතා කරල ඉවරවෙලා ඉහලින් ඒ අදාල බලධාරීන් කටයුතු කරන්න ක්‍රියාත්මක කරයි කියල ඉල්ලා සිටිනවා. මං නම් හිතන්නෙ නැහැ ඔය කවුද ඉන්නවනෙ ජාතික පාසල් අධ්‍යක්ෂක.හොරාගෙ අම්මගෙන් පේන අහනව වගේ වැඩක් එයත් එක්ක කතා කරන එක. ඒ නිසා ඔබතුමා දන්නවනෙ ගියාම. සමහර මන්ත්‍රීවරු එනවා විනාඩි 15 කට පස්සෙ ලිෆ්ට් එකේ. මං ඇහුවා එක මන්ත්‍රීවරයෙක්ගෙන් ඇයි ඔයා පරක්කු වුණේ කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

පරක්කු වෙච්ච මන්ත්‍රීවරයා තමයි මම. ඕන්නැති දේවල් කියන්න එපා මේ සභාවෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

මම නමක් කිව්වෙ නැහැනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මට මේ ධර්මාශෝකෙ විදුහල්පතිතුමා මාස දෙකක් කතා කරලවත් නැහැ. මාව අල්ලගන්න එපා හැමදේටම. ධර්මාශෝකෙ මම හිටියයි කියල. මං ඉවසුවා මෙච්චර වෙලා.මේ ලියුමට

අදාල නැහැනෙ මේක. ලියුමට අදාලව කතා කරන්න කරුණාකරලා.මගෙත් ඉවසීමේ සීමාවක් තියෙනවා. අනවශ්‍ය දේවල් කතා කරන්න එපා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

මේක අහන්නකො.මම කාගෙවත් නමක් කිව්වෙ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල්  මහතා කතා කරමින්**</u>

විදුහල්පතිතුමාගෙ නොහැකියාව නෙමෙයි.ඔයගොල්ලන්ගෙ නොහැකියාව මේ කියන්නෙ.

<u>**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

වෙන ප්‍රකාශ නැහැනෙ. කෙටියෙන් කියන්න ගරු මන්ත්‍රීතුමා.සම්බන්ධීකරණ රැස්වීමට යන්න ඕන. කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න කියල ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී  ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගම්වාසීන් එවපු ලිපිය සම්බන්ධව කතා කරන්නෙ. මම හිතනව ඒක උත්සව දවසට ඒ පාර වැහුවනම් හොඳයි කියල. ගම්වාසීන්ගෙ වාහන විතරක් ගන්න.නරඹන්න එන අයගෙ වාහන නොගෙන ඒව පාරෙ ගහන විදියට කරානම් සමහරවිට හරියයි කියල. අනිත් එක මේ විදුහල්පතිවරයා අපේ ගරු උප සභාපතිතුමා විදුහලට ගිය වෙලාවෙ මේ සියලුම ගරු මන්ත්‍රීවරු 21 දෙනාටම අපහාස වන පරිදි කිසිම දැනුමක් නැති මන්ත්‍රීවරු තමයි කියල මේ සභාවෙ ඉන්නෙ කියල ප්‍රකාශ කරා. අපි මේ හැම මන්ත්‍රීවරයෙක්ම ජනතා ඡන්දයෙන් පත්කරල මෙතනට ඇවිල්ල තියෙන්නෙ. මහජන නියෝජිතවරු වශයෙන්. මොකද නගරයේ ප්‍රශ්න ගැන කතා කරන්න.ප්‍රදේශයේ ප්‍රශ්න ගැන කතා කරන්න තමයි මෙතනට එවල තියෙන්නෙ. ධර්මාශෝක මාතාවට කිසිම අපහාසයක් කරන්නෙ නැහැ. හිස නමා ආචාර කරනවා ධර්මාශෝක මාතාවට. මේ තුන්වැනි පන්තියේ විදුහල්පතිවරයෙක් ධර්මාශෝක විද්‍යාලයට අරං ආපු මේ අපේ විපක්ෂ නායකතුමා දැන් ප්‍රකාශ කරා එතුමයි කියල මේ විදුහල්පතිවරයා මේ ඉස්කෝලෙට අරං ආවෙ. තුන්වැනි පන්තියේ විදුහල්පතිවරයෙක් මේ ඉස්කෝලෙට ඇවිල්ල තමයි මේ ගමේ ජනතාවට ජනතාවගේ දරුවන් ධර්මාශෝක විද්‍යාලයට ඇතුළත් කරගන්න බැරිවෙලා තියෙන්නෙ. මෙතුමාගෙ දේශපාලන බලධාරීන්ගෙ උවමනාවට තමයි මේ ධර්මාශෝකෙට පත්වෙලා ඇවිල්ල තියෙන්නෙ. මෙතුමා කටු ඔටුන්නක් තමයි ඔළුවෙ මේ පැළඳගෙන ඉන්නෙ ධර්මාශෝකෙට ඇවිල්ල මේ වගේ ප්‍රදර්ශනය කර කටු ඔටුන්නක් දාගෙන මෙතුමා දන්නෙ නැහැ හෙට අනිද්දට යන්න වෙනවයි කියන එක. අම්බලන්ගොඩ ධර්මාශෝකෙන් යන්න වෙනවයි කියන එක දන්නෙ නැහැ මෙයා. මෙයා ඒව දැනගන්න තමයි අපේ ගරු මන්ත්‍රීවරුන්ට අපහාස කරල තියෙන්නෙ. නගරෙ ප්‍රධාන පුරවැසියා තමයි නගර සභාවෙ සභාපතිතුමා. එතුමාට ආරාධනා කරන්න ඕන හැමදේටම මුලින්.පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මහත්තයත් විදුහල්පතිවරුත් නගරෙ ප්‍රධාන පුරවැසියට කතා කරන්න ඕන මූලස්ථාන පොලිස් පරීක්ෂක මහත්තයා ආවත් ගෙදරට ඇවිල්ල හම්බවෙලා තමයි මං හෙට  ඉඳන් සර් මෙහෙ වැඩ භාර ගන්නවා කියල කතා කරල යන්නෙ. මේ විදුහල්පතිවරයා මේ ගමේ ජීවත්වන මන්ත්‍රීවරුන්ට අපහාස කරපු හැටි මට ගරු උප සභාපතිතුමා ඒ වෙලාවෙම කතා කරල කිව්වා. මෙතන දේශපාලන පාට  පක්ෂ මොකුත් නැහැ. කුමන හෝ දේශපාලන පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරු තමයි මෙතන ඉන්නෙ. අපට විදුහලත් එක්ක ධර්මාශෝක මාතාවත් එක්ක කිසිම තරහක් නැහැ. හිස නමා ආචාර කරනවා.

මේ විදුහල්පතිවරයා පුළුවන් තරම් ඉක්මනට අම්බලන්ගොඩ ධර්මාශෝකෙන් මාරු කරල යවන්න. ඒක තමයි මගේ ඉල්ලීම. බොහොම ස්තූතියි.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ නිවැසියන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය අනුව දීර්ඝ වශයෙන් මන්ත්‍රීවරු කතා කරා. මොකද මම කතා කරේ ධර්මාශෝක විද්‍යාලයට සම්බන්ධ ගැටලුවක් නිසා තමයි මං ලියුම හරහා අදහස් ප්‍රකාශ කරේ. නමුත් මෙතන දිගින් දිගටම ගරු මන්ත්‍රීවරුන්ට වුණු හානිය සම්බන්ධව තමයි සියලු මන්ත්‍රීවරු කතා කළේ. මං හිතන්නෙ ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා දැඩි ආවේගශීලීව කතා කළා. මං හිතන්නෙ එතුමාට අසාධාරණයක් වෙන්න ඇති. ගරු රාහුල මන්ත්‍රීතුමා මං හිතන්නෙ නමක් කියල ප්‍රකාශ කරේ නැහැ. ඒ නිසා එහෙම දෙයක් වුණා නම් මේ සභාවෙ අපේ සියලුම ගරු මන්ත්‍රිවරු මේ නගරයේ දියුණුව සඳහා පත්වුණු මන්ත්‍රීවරු. මොකද අපි එදා අමාත්‍යාංශයටත් ගියේ පක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරු ඒ කාරණයට දරුවන්ට සාධාරණයක් ඉෂ්ඨ කරන්න විදුහල්පතිතුමා මොන තීන්දුවක හිටියත්. ඒ නිසා විද්‍යාල මාවතේ ඉන්න ජනතාවට ගරු සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා මැදිහත් වෙලා සභාව හරහා බෝඩ් ගහලා ඒ ජනතාවට යම් කරදරයක් නැතිව ඒ මාර්ගයේ යන්න හැකියාවක් තියෙන්න ඕන. මොකද හේතුව විද්‍යාල මාවත කියන්නෙ ධර්මාශොකෙන් පැන්න ගමන් තියෙන්නෙ පටු මාර්ගයක්. ඉතින් ඒ නිසා ඒ මිනිස්සුන්ට සාධාරණයක් ඉෂ්ඨ වෙන්න ඕන. ප්‍රදේශවාසීන් හැටියට. ගරු සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා කිව්වා මං හිතන්නෙ ප්‍රකාශ කරා එතුමා බෝඩ් ගහලා ඒක සාධාරණට ඉෂ්ඨ කරනව කියලා. ඒ නිසා ඒක මං හිතන්නෙ ඉෂ්ඨ වෙයි කියන අපි එතුමාට භාරදෙමු . කොට්ඨාස මන්ත්‍රීවරයා වශයෙන් ඒක විසඳන්න. ඒ නිසා ඒ සියලු දේවල් ඒ තීන්දුව ගනිමින් පොඩි ඉල්ලීමක් කරනවා. වත්කම් ප්‍රකාශය ඉදිරිපත් කරල නැත්නම් ඒක ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන්න කියල කියනවා. සම්බන්ධීකරණ රැස්වීම ප.ව.2.00 ට පැවැත්වෙනවා. ඒ නිසා ගරු සභාව ප.ව. 5.00 දක්වා කල් තියනවා

**තීරණය-**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ උත්සව අවස්ථාවලදී විදුහල් මාවතේ යතුරුපැදි, වාහන අක්‍රමවත්ව නතර කිරීම නිසා ඇතිවන අපහසුතාවය පිළිබඳව අම්බලන්ගොඩ විදුහල් මාවත ගම්වාසීන් විසින් එවා ඇති ලිපිය සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා එම කොට්ඨාසය භාර ගරු මන්ත්‍රීතුමා වෙත එම කාර්යය භාරදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා ඩෙනට් පනියන්දූවගේ විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- **පස්වරු 6.00 ට කල් තබන රැස්වීම ආරම්භ කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කල් තැබීමන් පසු සභාව නැවත ආරම්භ කරනවා.

**12.02 අම්බලන්ගොඩ, කෙරමිණිය, ග්‍රාම නිලධාරි පී.එච්.කුමාර ද සිල්වා මහතා විසින් කෙරමිණිය පුස්තකාල ගොඩනැගිල්ලේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය රාජකාරි කරන කාමරයේ රාජකාරි කටයුතු සිදු කිරිමට අවස්ථාව ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු නගරාධිපතිතුමා, නගර සභාව, අම්බලන්ගොඩ. කෙරමිණිය පුස්තකාල ගොඩනැගිල්ලේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය රාජකාරි කරන කාමරයේ මාගේ රාජකාරි කටයුතු සිදුකිරීමට අවස්ථාවක් ලබාගැනීම සඳහා ඉල්ලීමයි.මේකට වෛද්‍යාචරිය කතාකරල කිව්වලු එහෙම කරන්න බැහැයි කියලා. එක තමයි කෙරමිණිය පින්නදූව ප්‍රදේශයේ නිල පියසක් නොමැති බැවින් ගම් දෙකක ජනතාවට පහසුවෙන් ළඟා විය හැකි අතරමැද ස්ථානයක පිහිටා තිබෙන නගර සභාවට අයත් පුස්තකාල භූමියේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය මසකට එක් වරුවක් පමණක් භාවිතා කරන කාමරයේ ඇය නොමැති දිනවල සතියට වරු දෙකක් පමණක් භාවිතා කිරීමට අවකාශ සලසන හැටියට ගරු සභාවෙන් ඉල්ලා සිටිමි.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු උප සභාපතිතුමා නැගිටින්න ඕන නැහැනෙ. මේ කාරණේ මෙහෙමයි.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නැගිටින්න ඕන සභාවනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරුසභාපතිතුමනි,භූමිය බොහොම වටින සම්පතක්.මේ භූමි සම්පත අපට මේ ස්ථානයේ අක්කර කාලක් පමණ පින්නදූවෙ ගම්වැසියෙක් පරිත්‍යාගශීලීයෙක්. ඒ පරිත්‍යාගශීලීයෙක් පිදුව විතරක් නෙමේ ගම්වැසියෝ සිමෙන්ති ,ගල්,වැලි එකතු කරල වැර වෑයමින් 80% ක් පමණ මේ ගොඩනැගිල්ල ඉදිකළේ. අපි ඉන් අනතුරුව 20%ක් පමණ නගර සභාවෙ දායකත්වයෙන් මේ ගොඩනැගිල්ල ගොඩනැගුවේ. මෙම ස්ථානයේ පුස්තකාලය ප්‍රධානයි. දෙවනුව ළදදරු පාසල තියෙනවා.ඊට එහා පැත්තෙ තියෙනවා හුදෙකලා කාමරයක්.ඒ කාමරේ ගරු මොහාන් පී ද සිල්වා මැතිතුමා මීට පෙර ධූර කාලයේ අපට රුපියල් 80,000/- ක් දුන්නා අපට.ඒ ගමන මම අපේ ගෙදර තිබ්බ්ච දොරකුත් ගෙනැල්ල හයිකරලා ඔය පවුල් සෞඛ්‍ය සේවිකාවට නවාතැන් දෙන්නට මාසයකට එක් දිනක් දරුවො කිරන්නට අවස්ථාව සැලසුවා. දැන් මේ සලසපු තැන මේ නිලධාරිණිය මේ කාමරයේ ඉන්නේ මාසයකට එක වරුවක් පමණයි. අර දරුවන් කිරන වේලාව පමණයි. ඇයගෙ කිසිම වටිනා උපකරණයක් මේ කාමරය තුළ නැහැ.මේකෙ තවත් අපේ ආර්ථික සංවර්ධන නිලධාරිතුමිය පසුගිය දවස්වල ටිකදවසක් හිටියා. නමුත්ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඇයත් එළියට බැස්සා. මේ ග්‍රාම නිලධාරී කියන්නෙ අපේ බල ප්‍රදේශයට අත්‍යාවශ්‍යම නිලධාරියා.

**මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි විනාඩික් දෙන්න.මේ නිලධාරියාට ඉන්න අපි මේ වරු දෙක දෙන්නෙ පවුල් සෞඛ්‍ය සේවිකාවත් එක්ක උසුළු විසුලු කරන්නවත් වෙන එක්කහින් වෙලා ඉන්නවත් නෙමේ මේ කාමරයේ. ඇය නැති අවස්ථාවල වරුවක් දුන්නයි කියල අභවල් දෙයක් වෙනවද

ගරු සභාපතිතුමා.අන්න ඒ ගැන මම අවධානය යොමු කරනවා. ඇය නැති වෙලාවේ හිටියට කුමක්ද වෙන්නෙ ගරු සභාපතිතුමනි ,කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මට අදහසක් පලකරන්න පුළුවන්ද කෙරමිණියෙ වුණාට. දැන් මට තියෙන ගැටලුව ඒ පැත්ත නෙමේ ගරු සභාපතිතුමනි.දැන් ඔතනට කුඩා දරුවො එන්නෙ.සිහිති දරුවො එතකොට ග්‍රාම සේවක මහත්තයා ඔතන ඉන්නවයි කියන්නෙ නානාප්‍රකාර පුද්ගලයින් ඔය ළදරු පාසල පවත්වන වේලාවට එතනට ඇතුලු වෙන්න පුළුවන්.ළදරු පාසල පවත්වන අවස්ථාවේ එහෙම අනවශ්‍ය පුද්ගලයින් එතනට ඇතුලුවීම වැළැක්වීම කළ යුතුයි. කොහොමත් ඒක එක ඉඩමනෙ. එක ඉඩමෙ වෙන්කරල නැහැනෙ.ඒක හින්දාම කියන්නෙ ළදරුවන් නොතේරෙන දරුවන් ඉන්න හින්දා ග්‍රාමසේවක මහත්තයා ඉන්න එක නෙමේ ප්‍රශ්නෙ. පරිබාහිර පුද්ගයින් එන එක නවත්තන්න කිසිම ක්‍රමයක් නැහැ.ග්‍රාමසේවක මහත්තයා ඉන්න හින්දා ඒක පොඩි ළමයින්ට හොඳ නැහැ.අන්න ඒකයි මම කියන්නෙ. ඒක දෙවරක් හිතල බලන්න. වෙනත් ස්ථානයක් හොයාගත්තා නම් හොඳයි කියල තමයි මම කියන්නෙ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මහජන සෞඛ්‍ය වෛද්‍යතුමිය මට කතාකරල කිව්වා මේක පවුල් සෞඛ්‍ය සේවා ස්ථානය නිසා ඒවත් එතන කතා කරන හින්දා මේක ඒ ගොල්ලො ගරු සභාපතිතුමා එක්කත් කතා කරල කිව්වලු ඒක අමාරුයි කියල. ඒ නිසා මං හිතන්නෙ

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඒ කියන්නෙ ඇත්තටම එතන තියෙන්නෙ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියනෙ ඉන්නෙ. ඉතින් එතකොට ඒ වෘත්තියට අදාළ අවශ්‍ය දේවලුත් ඒ කාමරය තුළ තිබෙනවා. එතකොට ඒක එකක්. ඒකත් එක්ක තමයි මං හිතන්නෙ මට වැඩිපුර දැනගන්න ලැබිච්ච විදියට ඉතින් ඒක නිසා අපිටත් ඒක අනුමත කරන්න බැහැ. මං යෝජනාවක් විදියට ගේනවා පුළුවන්නම් හාමුදුරුවොත් එක්ක කතා කරලා දැන් සමෘද්ධි නිලධාරිතුමා ඉන්නෙත් පන්සලේනෙ. අපේ දහම් පාසල් ගොඩනැගිල්ලෙ ඉන්නෙ ඒක ඉල්ලගන්න.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා අපි මේ ගැන කතාකරල ඔබතුමාට තේරෙනවනෙ දැන් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීය කියන්නෙ ඒ වගේ කාමරයක් තිබුණොත් ඒක ලොකු ගැටුමක් වෙනව ඒ පාර. ඒ නිසාතමයි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය මේක ප්‍රතික්ෂේප කරල තියෙන්නෙ. අපි වෙන තැනක් ග්‍රාම නිලධාරීතුමියට සොයාදීමට කටයුතු කරම ඔබතුමාට පුළුවන්.

**තීරණය-**

කෙරමිණිය පුස්තකාල ගොඩනැගිල්ලේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය රාජකාරි කරන කාමරයේ රාජකාරි කටයුතු සිදුකිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා කෙරමිණිය ග්‍රාම නිලධාරී පී.එච්.කුමාර ද සිල්වා මහතා විසින් එවා ඇති ලිපිය අනුව ඔහුට වෙනත් ස්ථානයක් ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.03 අම්බලන්ගොඩ , පටබැඳිමුල්ල ,ධීවර කාර්මික සමිතිය විසින් බීකන් විදුලි පහනක් ලබා ගැනිම සඳහා අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ධීවර කාර්මික සමිතිය, පටබැදිමුල්ල,අම්බලන්ගොඩ.බීකන් විදුලි පහනක් ලබාගැනීම සම්බන්ධවයි.ගරු සභාපතිතුමනි පහත අත්සන් කරන අපි පටබැදිමුල්ල ධීවර සමිතියේ වෙමු.අපි හවසට මුහුදු ගොස් රාත්‍රී කාලය් ගොඩබිමට එන්නෙමු. අපිට රාත්‍රී කාලයේදී මුහුදු වෙරළට ගොඩ ඒමට නොහැකිය.අපිට රාත්‍රී එළිපහන් වනතුරු ධීවර ඇතුලට වී සිට එළිය වැටෙන විට ගොඩබිමට එන්නෙමු.එසේ වන්නේ රාත්‍රී කාලයේ පවතින දැඩි අඳුර නිසාය. ජීවිත අවධානම කියා නිම කිරීමට නොහැකිය.මෙකී කරුණු ගැන සොයා බලා ධීවර වරායේ බෝට්ටු පිටවන හා ඇතුල්වන ස්ථානය පෙනෙන සේ පටබැදිමුල්ල ෂෙන්ග්‍රිලා හෝටලය ඉදිරිපිට මුහුදු වෙරළේ විදුලි පහනක් ලබාදෙනෙ ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. අත්සන් කරල තියෙනවා හත් දෙනෙක්. රුවන් ඉන්දික, ඩබ්.ගාමිණී, ආර්.පී.සජිත්, ආර්.පී.චරිත්, එස්.ඩබ්.ගාමිණී, ඩී.ඩී.ගාමිණී, ඩී.ඩී.ආර් ඉන්දික ්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඒක දෙන්න ගරු සභාපතිතුමනි, කොහොමත් රෑ 12 ට 11 ටත් ඒ ගොල්ලො ගොඩකරනවා. ඒ නිසා ඔය ලයිට් එකක් දීම වරදක් නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් මේක සවිකරදීමට කටයුතු කරන්න කියල සභාවට තීරණය කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, ෂෙන්ග්‍රිලා හෝටලය ඉදිරිපිට මුහුදු වෙරළට බීකන් විදුලි පහනක් ඉල්ලා ධීවර කාර්මික සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව එය ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 විලේගොඩ ග්‍රාමයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා දුම්රිය මාර්ගය හරහා පාලමක් තැනිම සම්බන්ධව දකුණු පළාත් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

විලේගොඩ ග්‍රාමයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා දුම්රිය මාර්ගය හරහා පාලමක් තැනීම - නිර්මිත සැලැස්ම ලබාගැනීම. නගරාධිපති/ලේකම්,නගර සභාව,අම්බලන්ගොඩ.නියෝජ්‍ය ප්‍රධාන ලෙක්ම්(ඉංජිනේරු සේවා) දකුණු පළාත. ඉහත කරුණ සම්බන්ධව පැවති ප්‍රධාන සාකච්ජාවේ පරිදි ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ඉදිරි කටයුතු සිදු නොකරන ලදි. කෙසේ වුවද 2020.01. දින ඔබ ආයතනයේ උප සභාපතිතුමා, ගණකාධිකාරීතුමියද ඇතුලු නිලධාරීන් විසින් මෙම කාර්යාලයේ පැවති සාකච්ජාවේදී උක්ත කාර්යය සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විමසන ලදී. මූලික ප්‍රතිපාදන ගාස්තු වශයෙන් සැලසුම් කටයුතු ආරම්භ කිරීම සඳහා මූලික වියදම ලෙස රුපියල් ලක්ෂයක මුදලක් (රු.100,000/-) නියෝජ්‍ය ප්‍රධාන

ලෙක්ම් නමින් වෙත්පතක් එවීමට (ඉංජිනේරු සේවා) කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලමි. ඉන්පසු සියලු ආයතන නියෝජනය වන පරිදි සාකච්ඡාවක් නැවත කැඳවා ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් නිවැරදිව තීරණය කර අප වෙත දැන්වීමෙන් පසු ව්‍යාපෘතිවේ වැඩ ආරම්භ කළ හැකි බවද කාරුණිකව දන්වා සිටිමි කියල අර රේල්වේ පාර හරහා පාලම හදන එකේ සැලසුම් සකස් කරන්න රුපියල් ලක්ෂයක මුදලක් ඉංජිනේරු සේවා දකුණු පළාත් එකෙන් ඉල්ලීමක් කරල තියෙනවා.ඒ ගොල්ලන්ගෙ ගාස්තු වශයෙන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ලබාදෙන්න ගරු සභාපතිතුමා.

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඒක ලබාදීල හරි ඒ කටයුත්ත රජයේ ගාස්තු. රජයේ ආයතනයක්. ඒ නිසා ඒක ලබාදීල ඒ සැලසුම් ලබාගන්න කියල කියනවා.ලේකම්තුමිය ඉක්මනින් දන්වන්න.

**තීරණය-**

විලේගොඩ ග්‍රාමයේ සිට ප්‍රධාන මාර්ගය දක්වා දුම්රිය මාර්ගය හරහා පාලමක් තැනීම - නිර්මිත සැලැස්ම ලබාගැනීම යන මැයෙන් දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් එවා ඇති ලිපිය අනුව මූලික ප්‍රතිපාදන ගාස්තු වන රු.100,000/- ක මුදල ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 කම්කරු දෙපාර්තමේන්තුවෙන්. 2019.1.02 දින මානිමුල්ල පාර කාණුව පිළිසකර කරමින් සිටිදී සේතුගේ අමරසිංහ යන අයට සිදුවූ මරණීය අනතුර සම්බන්ධව එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

නගරාධිපතිතුමා,නගර සභාව,අම්බලන්ගොඩ. කම්කරු දෙපාර්තමේන්තුවෙන්. 2019.1.02 දින මානිමුල්ල පාර කාණුව පිළිසකර කරමින් සිටිදී සේතුගේ අමරසිංහ යන අයට සිදුවූ මරණීය අනතුර සම්බන්ධවයි. කිසියම් ඉදිකිරීම් කටයුත්තක් යම් ආයතනයකට හෝ පිරිසකට එම කටයුත්ත සිදුකරවා ගැනීමට පැවරීමේදී අදාළ පාර්ශවය විසින් ඒ සඳහා අදාළ සුදුසුකම් හා නිපුණත්වයක් ලබා සිටින පිරිසක්දැයි පරීක්ෂා කිරීම සහ වෘත්තිය සුරක්ෂිතතාවය පිළිබඳ ඔවුන් දැනුවත් වී ඇත්දැයි පරීක්ෂා කර ඉදිකිරීම් වැඩ පැවරීම සිදුකිරීම සුදුසු යැයි මා දකිමි. එවන් ක්‍රියාවලියක් අනුගමනය කිරීම තුළින් මේ ආකාරයේ අවාසනාවන්ත ලෙස සිදුවන මරණීය අනතුරු බොහොමයක් වළක්වා ගැනීමට හැකියාව ඇතැයි අප අපේක්ෂා කරමි. එම නිසා මෙවන් ආකාරයේ කටයුතු සිදි කිරීමේදී මේ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි. ටී.පී.ආර්.කේ.හේමචන්ද්‍ර, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු වෙනුවට. අර කර්මාන්තය දීල ක්ෂේත්‍රය නැති එක තමයි මේ කියන්නෙ.ඒ කියන්නෙ අපි කර්මාන්තයක් පිරිනමනකොට පළපුරුද්ද සොයා බලන්න කියන එකයි කියන්නෙ. ලේකම්තුමිය අපි ඇත්තටම අප් සභාවක් සභාවක් වශයෙන් සැලකිලිම් විය යුතු වෙනවා. මොකද අපි දැන් මේ වගේ කටයුතු සමිතිවලට

දෙනකොට අපේ මන්ත්‍රීතුමාල අපි පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වශයෙන් අපි අත්සන් කරනකොට ගිවිසුමක් ගන්නවා.ඉන්ෂුරන්ස් ගිවිසුමක් දෙන්න ඕන ඊට පස්සෙ 2 ½% ක ගිවිසුමක් දෙන්න ඕන.නමුත් මේව මොකක්වත් නැතුව තමයි අපි සමිතිවලට මේව දෙන්න. එතනදි අපි එක්කො ඒ ගොල්ලොත් එක්ක ඒ ගොල්ලොන්ගෙ පළපුරුද්ද අහල ඒ ගොල්ලොන්ට තියෙන හැකියාව සම්බන්ධවවත් සොයා බලන්න වෙනවා. ඒ නිසා ඉදිරියේදී කටයුතු කිරීමේදී ඒ සම්බන්ධව අවධාන යොමුකරන ලෙස ලේකම්තුමියට දන්වා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඔතනදි මැටර් වෙන්නෙ ඒ ගොල්ලන්ගෙ ඒ පිළිබඳ තියෙන පළපුරුද්දට වැඩිය ආරක්ෂිත ක්‍රියාකාරකම් හරියට තියෙනවද නැද්ද කියන එක.දැන් කාණුව හදන්න පුළුවන් එවුන්ටනෙ අපි දෙන්නෙ. නමුත් ආරක්ෂිත ක්‍රියාකාරකම් හරියට සිද්ධ වෙන්න ඕන හෙල්මට් එකක් දාගෙන ඉන්නවද?. හරියට සපෝර්ට්ස් දීල තියෙනවද? අන්න ඒ ටික බලන්න අපි මොකක්හරි ක්‍රමවේදයක් හදමු. එහෙම නැත්න් ඒ ගොල්ලන්ට කොන්ත්‍රාත් එක දෙනකොට මෙන්න මේව සපුරන්න ඕන වැඩකරනකොට කියල හැන්ඩ් අවුට් එකක් හරි දෙමු. නැත්නම් ආරක්ෂි ක්‍රියාමාර්ග පිළිපැද්දෙ නැති හින්දා තමයි ඕක වෙලා තියෙන්නෙ නැතුව වැඩේ කරන්න දන්නෙ නැතුව නෙමෙයි ඒ ගොල්ල සපෝර්ට් එකක් හරි ගහල කරානම් ඕක වෙන්නෙ නැහැ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒක තමයි මට හිතෙන්නෙ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

පොඩි වැඩකට නගර සභාවෙ ඉන්න සාමාන්‍ය කොන්ත්‍රාත්කාරයොන්ට ඕව නැහැනෙ. නමුත් අපිට වැඩේ කරගන්න බැරිවෙනවා. නමුත් අපි සාමාන්‍ය විදියට කොන්ත්‍රාත් කරල ගිවිසුම් අත්සන් කිරීමේදී ෆෝමැට් එක අත්සන් කරනවා. එතකොට නගර සභාව බේරිලානෙ. වෙනව කියලත් නෙමේ. නොවෙනව කියලත් නෙමේ.සභාව බේරෙන්න ඕනනෙ. ෆෝමැට් එක අත්සන් කරවගන්නව කොන්ත්‍රාත්කරුවන්ට කියල.

**තීරණය-**

2019.12.03 දින මානිමුල්ල පාර කාණුව පිළිසකර කරමින් සිටියදී සේතුගේ අමරසිංහ යන අයට සිදුවූ මරණීය අනතුර සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය අනුව ඉදිරියේදී සිදුකරනු ලබන මෙවන් ආකාරයේ කටයුතු කිරීමේදී ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග

අනුගමනය කරමින් කටයුතු සිදුකිරීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.06 ශාසනාරක්ෂක බල මණ්ලයේ ලේඛකාධිකාරී ශාස්ත්‍රවේදී නින්නාදේ චන්දිම හිමි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ශාස්ත්‍රවේදී නින්නාදේ චන්දිම හිමි. ලේඛකාධිකාරී ශාසනාරක්ෂක බල මණ්ලය, අම්බලන්ගොඩ, නගරාධිපතිතුමා,නගර සභාව. මේක ගෙවීමක්නෙ.ඇස්තමේන්තුවක් තියෙනවා. 2019 සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය කියල.2019.09.08 දින පැවති බෞද්ධ කටයුතු දෙපාර්මේන්තුව විසින් පැවැත්වූ අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනා තරඟ අනුව ත්‍යාග ප්‍රදානෝත්සවය 2020.03.01 වන දින පැවැත්වීමට අදහස් කරමි. පසුගිය වසරේදී අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රතිපාදන මත තෑගි හා පදක්කම් ලබාදෙමින් ඔබතුමා ඇතුලු නගර සභාවේ දැක්වූ අනුග්‍රහය ස්තූති පූර්වකව සිහිපත් කරමි. මෙවරත් ප්‍රථන ස්ථාන 41 ක් , දෙවන ස්ථාන 42 ක් හා තෙවන ස්ථාන 40 ක් ,හතරවන ස්ථාන 43 ක් , පස්වන ස්ථාන 46 ක් වශයෙන් ත්‍යාගද ප්‍රථම, දෙවන, තෙවන සඳහා පදක්කම් ද ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි කියලා ඇස්මේන්තුවක් එවල තියෙනවා. රු.231900/- ක සභාවෙන් ඉල්ලලා.ගිය පාර දීල තියෙනවා.හැබැයි මේක දෙනව නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

වැඩි මන්ත්‍රීවරු කොටසක් නැහැ මෙතන. ඒ අය විරුද්ධ වුණොත් මොකද කරන්නෙ. ඒ ගොල්ලො විරුද්ධ වුණොත් සියලු දෙනා ගන්නා ක්‍රියාමාර්ගය .

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නෑ නෑ.මේක වෙනදා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

හරි දෙන එක නෙමේ ගරු සභාපතිතුමනි. දෙන එකේ කිසිම ගැටලුවක් නැහැ. නීතිමය පැත්තේ අපිට ගැටලුවක් නැද්ද ලේකම්තුමිය.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැහැ. නැහැ. එහෙනම් අපි මේක ලබාදීමට කටයුතු කරනවා. එහෙනම් ලබාදීමට කටයුතු කරන්න.

**තීරණය-**

2020.03.01 දින පැවැත්වෙන අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුනතා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ත්‍යාග හා පදක්කම් නීත්‍යානුකූලව ලබාදීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.07 අම්බලන්ගොඩ,පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංනයේ සෑම දිනකම ආලෝක පද්ධතිය ක්‍රියාකරන චමින්ද ජයලත් මහතාට යම්කිසි මුදලක් ගෙවන ලෙස ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නන්දන රාජපක්ෂ, පොල්වත්ත, අම්බලන්ගොඩ. නන්දන මන්ත්‍රීතුමානෙ. හරි ගරු නගරාධිපතිතුමා, නගර සභාව, අම්බලන්ගොඩ. අම්බලන්ගොඩ,පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංනයේ සෑම දිනකම ආලෝක පද්ධතිය ක්‍රියාකරන චමින්ද ජයලත් මහතාට සවස 6.00 සිට රාත්‍රී 10.00 දක්වා යම්කිසි ගෙවීමක් කිරීමට ඔබතුමාගේ අවධානය යොමුකරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.මෙයට නන්දන රාජපක්ෂ නාගරික මන්ත්‍රී. ලේම්තුමිය/සභාපතිතුමා උක්ත කරුණට අදාලව රුපියල් 300/- ක දීමනාවක් ගෙවන්න නිර්දේශ කරල තියෙනවා.ඒ අනුව ගලි බවුසරයේ සේවය සැපයීම වෙනුවෙන් සේවයේ දිරිදීමනා එක් සේවකයෙතු සඳහා රුපියල් 200/- ක දීමනාවක් ගෙවනු ලබයි. මාර්ග තලනයේ දීමනාව මූල්‍ය කමිටුවේ තීරණය වූ 1/4/2017/10 අනුව රුපියල් 125/- ක් දීමනාවක් ගෙවීමට නිර්දේශ කරයි. සභාපතිතුමා මෙම කාරණය සඳහා රුපියල් 100/- ක දීමනාවක් ලබාදීමට නිර්දේශ කරමි. රුපියල් 100/- ක් දීමට තමයි පස්සෙ තීරණය කරල තියෙන්නෙ. ගරු සභාපතිතුමා ගරු සභාවට යොමුකරල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

මං නම් ඒකට විරුද්ධ වෙනවා. මොකද රුපියල් 100/- ක් කියන්නෙ මේ කාලෙ. හවස හයේ ඉඳලා රෑ දහය වෙනකන් මෙයා මෙතන සේවය කරනවා. අඩු ගානෙ රුපියල් 200/- ක් වත් එයාට ගෙවීමට කටයුතු කරන්න කියල මං ඉල්ලා සිටිනවා. මාස 04 ක් තිස්සෙ ඕක කෙරීගෙන යන්නෙ. ගෙවනවනම් හිඟ මුදල් සමග ඔහුට ගෙවන්න කියල තමයි මං ඉල්ලා සිටින්නේ.ගෙවීමක් කරන්න ඕන.රුපියල් 100/- ක් කියන්නෙ මොකක්ද මේ කාලෙ.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් රුපියල් 200/- ක් ගෙවන්න තීරණය කරමු නේද? රුපියල් 200/- ක් ගෙවීමට තීරණය කරනවා සභාවෙන් . ලේකම්තුමිය තමයි මේ ගෙවන ඔක්කොගෙම මාර්ග තලනයේ ගලි බවුසරයේ නෝට් ගහල තියෙනව මෙහෙම ගෙවනව කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕක මාස 04 ක් තිස්සෙ කෙරීගෙන යනවා.හිඟ මුදලත් එක්ක ගෙවීමට මං කටයුතු කරන්න කියල ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් රුපියල් 100/- ක් නම් මදියි ඇත්තටම. ඒ නිසා රුපියල් 200/- ක දීමනාවක් ලබාදීමට මන්ත්‍රීවරු එකඟද? මොකෝ මන්ත්‍රීවරු කියන්නෙ? එහෙනම් රුපියල් 200/- ක් ලබාදීමට තීරණය කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

මමත් එතෙන්ට ගිහිල්ල බලනවා එයා ලයිට් දානවද ? එයා එතන ඉන්නවද? කියල මාත් සාමාන්‍යයෙන් පැය 1 ½ ක් විතර රස්තියාදු වෙනව එතන එයා ගැන සෝදිසි කරන්න.

**තීරණය-**

පොල්වත්ත ක්‍රීඩාංගනයේ ආලෝක පද්ධතිය ක්‍රියාකරවනු ලබන චමින්ද ජයලත් මහතාට දිනකට රු.200/- ක දීමනාවක් ගෙවීම සුදුසු බවට මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.08 ආචාර්ය ඩබ්.ඩබ්.ගමගේ,දකුණු පළාත් ආණ්ඩුකාරවර. පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත. අම්බලන්ගොඩ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අසාධාරණ ලෙස වැඩි කරන ලද කඩ කුලිය සංශෝධනය කරදෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>මූලාසනය හෙබවූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ආචාර්ය ඩබ්.ඩබ්.ගමගේ,දකුණු පළාත් ආණ්ඩුකාරවර. පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත. අම්බලන්ගොඩ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අසාධාරණ ලෙස වැඩි කරන ලද කඩ කුලිය සංශෝධනය කරදෙන ලෙස කරන ඉල්ලීම.

- **පස්වරු 6.20 ට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා ගරු සභාවට පැමිණෙන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දකුණු පළාත් ආණ්ඩුකාරතුමා ලිපියක් එවල තිබෙනවා. අම්බලන්ගොඩ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අසාධාරණ ලෙස වැඩි කරන ලද කඩ කුලිය සංශෝධනය කරදෙන ලෙස කරන ඉල්ලීම. උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.02.07 දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ජාවේ එකඟ වූ කරුණු හා බැදේ. 2019.10.30 දිනැති ලිපිය මගින් නගර සභාව බදු කරුවන්ට කඩකුලී වැඩිකරන බව දැනුම් දී ඇති බවත්, ඒ අනුව සංශෝධිත කඩකුලී දෙසැම්බර් මාසයේ සිට ගෙවිය යුතු බවත්, එම මුදල දැනට ගෙවන මුදල මෙන් 400% ක පමණ වැඩිවීමක් බව හා එක්වන් මුදල්ද (key money) නොසලකා හැර තක්සේරුව සිදුකර ඇති බවත් කඩ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන් ප්‍රකාශ කරන ලදී. එබැවින් මේ සම්බන්ධයෙන් නව තක්සේරුවක් ලබා ගත යුතු අතර ඒ සඳහා නොසළකා හැර තිබෙන එක්වන් මුදලද (key money) මෙතෙක් වාර්ෂිකව වැඩිවන 5% ක මුදලද සැලකිල්ලට ගෙන කළ යුතු බව දන්වා සිටිමි.ඉහත කරුණු සැලකිල්ලට ගෙන 2020 ජුනි මස දක්වා පැරණි බදු කුලියම අයකර ගන්නා ලෙස දන්වමි. ඒ අනුව ආණ්ඩුකාරතුමා කියල තියෙනවා මම මේ සම්බන්ධව විමසීමක් කළා. බලනකොට මේකෙ එක්වන් ගෙවීම

නොසලකා තමයි මේ බදු මුදල සඳහන් කරල තියෙන්නෙ. ඒක පිළිගත්ත තක්සේරු දෙපාර්තමේන්තුව. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එක්වන් ගෙවීමක් කරන අවස්ථාවේදී මේ කුලිය මීට වඩා අඩුවෙන්න ඕන. එක්වන් ගෙවීමක් නැති අවස්ථාවකදී මේ කුලිය මීට වඩා වැඩිවෙන්න ඕන. ඒ නිසා නැවත තක්සේරු කිරීමට එකඟතාවය පලකළා. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමා නියෝග කළා 2020 ජුනි වෙනකොට නව තක්සේරුව එවනව කියල. එතෙක් තියෙන තක්සේරුවම පරණ තක්සේරුවම අයකරන්න ගරු සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. නව තක්සේරුවට යොමු කරන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා අසාධාරණ ලෙස වැඩි කරන ලද කඩ කුලිය සංශෝධනය කරදෙන ලෙස කරන ඉල්ලීම යන මැයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් එවා ඇති ලිපිය අනුව 2020 ජුනි මස වන විට තක්සේරුව ලබාදෙන බවට ගරු ආණ්ඩුකාරතුමා විසින් දැන්වූ බවත් එතෙක් පැරණි තක්සේරුව මත බදු කුලිය අයකර ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.09 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව. දුෂ්කර පළාත්වල ආරක්ෂක කටයුතු සඳහා යොදා ඇති සිවිල් ආරක්ෂක භට පිරිස් මුදවා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව. දුෂ්කර පළාත්වල ආරක්ෂක කටයුතු සඳහා යොදා ඇති සිවිල් ආරක්ෂක භට පිරිස් මුදවා ගැනීම. මෙම දෙපාර්තමේන්තුව හා දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටි බලකාවල රාජකාරි කරනු ලබන සෙබළ සෙබළියන් ආර්ථික දුෂ්කරතාවලින් පිරි ඉතාමත් දුෂ්කර ප්‍රදේශවල වෙසෙන්නන් වන අතර රැකියාවට අමතරව කෘෂිකර්මය, සත්ත්ව පාලනය හා වෙනත් අමතර ක්‍රියාකාරකම්වලින් ජීවිකාව කිරීමට පුරුදු වූ පිරිසකි. ඔවුන් කොළඹ ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවල ආරක්ෂක කටයුතුවල යෙදීමේදී කුඹුරු ගොවිතැන් පාලු වීම, සත්ත්ව පාලනය වැනි අමතර ආදායම් මාර්ග නොමැතිවීම හේතුවෙන් ආර්ථික වශයෙන් අපහසුතාවයන්ට පත්වන අතර පවුල් සංස්ථාවන්ටද බලපා ඇති බැවින් සහනයක් අපේක්ෂාවෙන් විශේෂ රාජකාරිවලින් මුදවන ලෙස අයැදීම් රාශියක් ලැබී ඇත.ඉහත කරුණු සබැඳියාවල් සානුකම්පිතව සලකා බලා අතිගරු ජනාධිපතිතුමා විසින් පිටත බලකා භට පිරිස් කොළඹ ප්‍රදේශයේ විශේෂ ආරක්ෂාව සඳහා යෙදවීම අවම කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇති බැවින් ඔබ ආයතනයේ ආරක්ෂක රාජකාරිහි සිටින සිවිල් ආරක්ෂක භට පිරිස් 2020 ජනවාරි 31 වන දිනට ප්‍රථම ඉවත් කිරීමට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන ඇත. සිදුවන අපහසුතාවය පිළිබඳව අපගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතර 2020 ජනවාරි මස 15 වන දින සිට භට පිරිස් ඉවත් කිරීමට අවැසි කටයුතු සිදුකරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ආනන්ද පීරිස්, අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මං හිතන්නෙ දැන් ඔය ගත්ත ප්‍රතිපත්තිමය තීන්දුව නැවත වරක් සංශෝධනය වෙලා කියල තමයි මං කතා කළාම කිව්වෙ. ඒ නිසා තවම එහෙම තීන්දුවක් අරගෙන නැහැ කිව්වා. ඒ හින්දා තමයි මං හිතන්නෙ ස්ථිර ඕ.අයි.සී.කෙනෙක් එවල තියෙන්නෙ.මෙයා මාරුවෙන්න නෙමෙයි.වෙන කට්ටිය සති දෙකෙන් දෙකට මාරු වුණා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය මේ කියන අදහස බලලා එහෙම තියෙනවනම් අපි කලින් ගත්ත තීන්දුවම යන්න.නැහැයි කියනවනම් නැවත ටෙන්ඩර් කිරීමකට යන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මෙයා ඇල්පිටියෙ කෙනෙක් දාල තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි.

**තීරණය-**

දුෂ්කර පළාත්වලින් ආරක්ෂක රාජකාරීන්හි යොදවා ඇති සිවිල් ආරක්ෂක භට පිරිස් මුදවා ගැනීම සම්බන්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය අනුව කරුණු විමසා බලා ක්‍රියාත්මක නොවේ නම් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.10 පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව 2019.12.31 දිනට වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව 2019.12.31 දිනට වාර්තාව ඉදිරිපත් කරනවා. කියවන්න ඕනද මේක.අවශ්‍ය නැහැනෙ.අනුමතකරනවා.ඕනනම් පිටපත් අරගෙන බලන්න.

**තීරණය-**

2019.12.31 දිනට ප්‍රධාන පුස්තකාලයේ පොත් සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.11 2019.12.31 දිනෙන් අවසන් වන පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019.12.31 දිනෙන් අවසන් වන ශාඛා පුස්තකාලවල වාර්තාව ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

අනුමත කරනවා.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අනුමත කරනවා.

**තීරණය-**

2019.12.31 දිනට මහ අම්බලන්ගොඩ, පොල්වත්ත, හෙප්පුමුල්ල, හිරේවත්ත, ඕකන්ද, පෝරඹ, කෙරමිණිය යන ශාඛා පුස්තකාලවල පොත් සමීක්ෂණ වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.12 2019.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ගබඩා සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

2019.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ගබඩා සමීක්ෂණ වාර්තාව මා යෝජනා කරනවා. ස්ථිර කරනවා.

**තීරණය-**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.13 අම්බලන්ගොඩ ගා/පී ද එස්. කුලරත්න විද්‍යාලයීය සුභසාධක සංගමය . සංගීත සංදර්ශනයක ආදායම විනෝද බද්දෙන් නිදහස් කර ගැනීම ( නුරාවි නැමැති ප්‍රසංගය) සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ ගා/පී ද එස්. කුලරත්න විද්‍යාලයීය සුභසාධක සංගමය . සංගීත සංදර්ශනයක ආදායම විනෝද බද්දෙන් නිදහස් කරගරනීම සඳහා. අම්බලන්ගොඩ ගා/පී ද එස්. කුලරත්න විද්‍යාලයීය සුභසාධක සංගමයේ අරමුදලට ආධාර පිණිස නුරාවි නමැති සංගීත ප්‍රසංගයක් 2020.02.23 වන දින සවස 3.00-6.30 ට අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය රංග ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම ප්‍රසංගයෙන් ලැබෙන ආදායම විද්‍යාලයේ ගුරු භවතුන්ගේ සුභ සාධන කාර්යයන් වෙනුවෙන් අරමුදලට බැරවෙන බැවින් ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා සිටිමි කියල විදුහල්පතිතුමා විසින් ඉල්ලීමක් කරනවා.විනෝද බද්ද ක්‍රමවේදයට යටත්ව ලබාදෙන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ ගා/පී.ද එස්.කුලරත්න විද්‍යාලයේ 2020.02.23 දින ප.ව.3.00-6.30 දක්වා පවත්වනු ලබව නුරාවි සංගීත ප්‍රසංගය විනෝද බදු ආඥා පනත ප්‍රකාරව නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.14 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සුභසාධක සංගමය.නිල සොබා ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීම. සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සුභසාධක සංගමය.නිල සොබා ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීම ග්‍රාම නිලධාරී වසම් 36 ක් නියෝජනය කරමින් කොට්ඨාසයේ සියලු පරිපාලන කටයුතු මෙහෙයවමින් නිරන්තර ජනතාවගේ සුබසිද්ධිය අපේක්ෂා කරන අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්කාර්යාලයේ සුබසාධක සංගමය තවත් එක් සමාජ මෙහෙවරක් ඉටුකිරීමට බලාපොරොත්තු වේ. මෙහිදී කොට්ඨාසයේ දරිද්‍රතාවයෙන් පෙළෙන නිවසක් අහිමි පවුලක් සඳහා නිවහවක් තනාදීමට අපි අරමුණු කර ඇත. මේ වන විට කොට්ඨාසය තුළින් එම ප්‍රතිලාභය හිමිවිය යුතු වඩාත් සුදුසු පවුල තෝරාගෙන ඇති අතර මොවුන් දැනට විවිධ ගැටළුවලට මුහුණදෙමින් සහෝදරයන්ගේ නිවෙස්වල දිවි ගෙවති.වර්තමානගෘහ මූලිකත්වය දරණ කාන්තාව , ලියුකේමියාව රෝගය නිසා සිවාමි පුරුෂයා අහිමි වැන්දඹුවක් වන අතර,අවුරුදු 01,04,06 යන වයස් කාණ්ඩයන්හි දියණියන් තිදෙනෙකුගේ මවකි.මේ වන විට ග්‍රාමයේ පරිත්‍යාගශීලියෙකු විසින් ඇයට පර්චස් 06 ක බිම් ප්‍රමාණයක් පරිත්‍යාග කර ඇත. ඒ සඳහා ඔප්පු සකස් කරඇති අතර නිවාස සැලැස්මද සකස් කර ඇත. නිවස ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ දොළහක් (රු.12,00,000/-) වැය වෙතැයි ඇස්තමේන්තු කර ඇත. උක්ත කරුණු සැළකිල්ලට ගනිමින් ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා හිසට සෙවණක් ලබාදීමේ "සුරක්ෂිත හෙටක්-සතුටු පවුලක්" ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීම ප්‍රධාන අරමුණු කරගෙන කාර්යාලයේ නිලධාරීන්ගේ හැකියාවන් එළිදක්වන නිල සොබා පුසංගය පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ප්‍රසංගය 2020.03.14 දින අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය ප්‍රධාන ශ්‍රවණාගාරයේ පැවැත්වීමට බලාපොරොත්තු වේ. අසරණ පවුලක් වෙත පිහිට සඳහා අරමුදල් සපයා ගැනීමට අපේක්ෂාවෙන් සිදුකරන මෙම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි කියල ගරු සභාපති ප්‍රාදේශීය ලේකම් වශයෙන් අත්සන් කරල තියෙනවා. ප්‍රාදේශීය ලේකම්වරයා අත්සන් කරල තියෙනවා.

**තීරණය-**

නිල සොබා ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය අනුව විනෝද බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව සම්මත විය.

**12.15 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාගාරයේ වැසිකිළි පද්ධති අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පරිපාලක ජානක සිල්වා මහතා විසින් ඉල්ලා ඇති බඩු ලැයිස්තුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාගාරයේ වැසිකිළි පද්ධති අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පරිපාලක ජානක සිල්වා මහතා විසින් ඉල්ලා ඇති බඩු ලැයිස්තුව 2020.01.29 දින ටෙන්ඩර්

කමිටුව වෙත මිල ගණන් ගෙන්වා විධිමත් පරිදි භාණ්ඩ මිලදී ගැනීම සඳහා කටයුතු යොදන ලදී. ඒ අනුව ඇණවුම් අංක 2371 යටතේ පූර්ණා වෙළඳසැලෙන් රුපියල් පන්දහස් තුන්සිය තිහක (රු.5330/-) භාණ්ඩ මිලදී ගැනීම සඳහා 536337 අංක දරණ චෙක්පත රැගෙන මා ගියේ එම වෙළඳසැල නගර සභාව වෙත ණයට භාණ්ඩ ලබා නොදෙන බැවිනි. එහෙත් මෙම ඇණවුමේ සඳහන් පළමුවන අයිතමය එම වෙළඳසැලේ නොතිබිණි. ඔවුන් එම මිල ගණන් ලබාදී තිබුණේ ටී ෂොකට් වෙනුවට ෂොකට් සඳහාය.එහෙයින් මිල ගණන්ද පරස්පර වේ. ඒ නිසා මා ඔවුන් හට පැවසුවේ එම පළමු අයිතමය හැර අනෙකුත් භාණ්ඩ මා හට ලබාදෙන ලෙසත් චෙක්පත මා රැගෙන ගොස් නිවැරදි කර සඳුදා දින නැවත ලබාදෙන බවත්ය. එහෙත් ඔවුන් මා හට භාණ්ඩ ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. චෙක්පත නිවැරදි කර නැවත වෙළඳසැල වෙත රැගෙන යාමටද වේලාවක් නොතිබිණි. ඒ වන විට පස්වරු 4.30 ත් පසුවී තිබිණි. මා විසින් ඇණවුම හා චෙක්පත රැගෙන නැවත පැමිණෙන ලදී. අවශ්‍ය කාර්යය සඳහා භාණ්ඩ මිලදී ගැනීම ඉතා හදිසි වේ. උපදෙස් පතනවා.දෙවන මිල ගණන් සඳහා යොමුවීම සුදුසුද? කියල සභාවට යොමුකරල තියෙව්වෙ.හැබැයි මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. මේ කඩේ බ්ලැක් ලිස්ට් කරානන් හොඳයි.මීට පස්සෙ බඩු ගන්න ඕන්නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මමත් කියන්නෙ අපි කරුණාවෙන් හුඟක් බඩු ගත්ත එයාගෙන්.සමහර පොඩි පොඩි දේවල් තියෙද්දි අපේ ටෙන්ඩර් කමිටුවේ අනුමතත් කරා එයාගෙ දේවල්. මම නම් කියන්නේ ඒ වගේ අපට සලකන්න බැරිනම් බ්ලැක් ලිස්ට් කරන්න. මගේ ඡන්ද දායකයෙක් තමයි.අපට වැඩ කළේ. සභාවට ඒ වගේ දෙයක්වත් කරන්න බැරිනම් වැඩක් නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මම විරුද්ධ නැහැ බ්ලැක් ලිස්ට් කරාට. හැබැයි ඒ මිනිස්සුන්ගෙන් බඩු අරගෙන සල්ලි ගෙවන්න පරක්කු වෙච්ච නිසා තමයි ඔහොම වෙන්නෙ. එහෙම සිද්ධියක් වුණාම.මේ කඩේ විතරක නෙමේ අම්බලන්ගොඩ.තව කඩ තියෙනවා. ඔහොම දෙන්නෙ නැති. ඒ නිසා සභාව ගන්න තීන්දුවලට මම එකඟයි.කිසි ගැටලුවක් නැහැ. හැබැයි සභාවෙන් වෙන අතපසුකනුත් තියෙනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි මෙහෙම කරමු. මාස හයකට බඩු ගැනීම නවත්තමු.කුණු ගැනීමත් නවත්තන්න ඕන හරිනම් මාස හයක්. මාස හයකට බඩු ගැනීම නවත්වනවා. බ්ලැක් ලිස්ට් කරනවා.

**තීරණය-**

2020.01.31 දිනැති 536337 අංක දරණ රු.5330/- ක් වූ චෙක්පතට අම්බලන්ගොඩ පූර්ණා වෙළඳසැලෙන් ජල උපාංග ලබානොදීම හේතුවෙන් මාස 06 ක් එම වෙළඳසැලෙන් භාණ්ඩ ලබා නොගන්නා ලෙසට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.16 සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා මැයි 07 සිට මැයි 13 දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා මැයි 07 සිට මැයි 13 දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීමට අවසර ඉල්ලා සිටිනවා. ඒකට විරෝධතාවයක් නැහැ කියල අවසර ලබාදීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

වෙසක් තොරණේ ප්‍රචාරක කටයුතු සඳහා මැයි 07 සිට මැයි 13 වන දින දක්වා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව ඒ සඳහා අවසර ලබාදීම සුදුසු බවට ඒකමතිකව සම්මත විය.

**12.17 සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය. වෙසක් තොරණ ඉදිකිරීමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය. වෙසක් තොරණ ඉදිකිරීමට අවසර ඉල්ලීම.ඉහත කරුණට අදාලව අම්බලන්ගොඩ මහවීදියේ සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය මගින් වසරක් පාසා පවත්වනු ලබන තොරණ ඉදිකරලන්න අවසර ඉල්ලනව පාරෙ.කලින් තැනම.පාරට පළුද්දක් වෙනවනම් ඒ අදාල ගාස්තු අයකරගෙන ලබාදෙන්න.

**තීරණය-**

2020.05.07 දින සිට 2020.05.13 දින දක්වා  වෙසක් තොරණ තානායම ඉදිරිපිට මාර්ගයේ කෙළවරක ඉදිකරලීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව ඒ සඳහා අවසර ලබාදීම සුදුසු බවට සහ  මාර්ගය පළුදු වේ නම් එම මුදල් අයකර ගැනීම සුදුසු බවට ඒකමතිකව සම්මත විය.

**12.18 සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය. වෙසක් තොරණට ආධාර පිණිස පවත්වනු  ලබන විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා  ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය. වෙසක් තොරණට ආධාර පිණිස පවත්වනු  ලබන  විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඉහත සඳහන් අප සමිතිය මගින් වසරක් පාසා  පවත්වනු ලබන වෙසක් තොරණ 26 වන වරටත් තානායම ඉදිරිපිටදී මහජනතාවට ප්‍රදර්ශනය කිරීමට කටයුතු සංවිධානය වෙමින් පවතියි. මේ සඳහා විශාල මුදලක් වැය වේ. එම මුදලින් තොරණට ආධාර පිණිස  ප්‍රදර්ශනය කරනු ලබන විනෝද ක්‍රීඩාවන් වූ මැරිගෝ රවුම, කතුරු ඔන්චිල්ලාව, පුංචි තෝච්චිය, යන ක්‍රීඩා මගිනි. මේප්‍රදර්ශනය පැවැත්වීමෙන් ලැබෙන ආධාර විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

බෞද්ධ නගරෙ නිසා ගරු සභාපතිතුමා ඒ වගේ දෙයක් කරන එක ඇත්තටම හොඳයි. මොකද නැත්නම් නගරෙ පාලුවට යනවනෙ.

**තීරණය-**

වෙසක් තොරණට ආධාර පිණිස පවත්වනු ලබන විනෝද ක්‍රීඩා විනෝද බද්දෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව විනෝද බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.19 12.19 සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය.2020 වසර සඳහා ඉදිකරනු ලබන වෙසක් තොරණ පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සී. ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය.2020 වසර සඳහා ඉදිකරනු ලබන වෙසක් තොරණ පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා තිබෙනවා. ඒ අනුව දැනුවත් කිරීම අප සමිතිය මගින් බැනර් කටවුට් කීපයක් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ බස්නැවතුම්පොල ඉදිරිපිට පොදු වෙළඳපොල තානායම්පල ඉදිරිපිට සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව අසල ස්ථාන කිහිපයක ප්‍රදර්ශනය කරන්න අවසර ඉල්ලනවා. සල්ලි නැතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා. බස් නැවතුම්පලේ අර ලයිට් කණුවෙ එල්ලන්න දෙන්න එපා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ.නෑ. ඉදිරිපිට කියල ලියලම තියෙනවා.

**තීරණය-**

2020 වෙසක් තොරණ පිළිබඳ දැනුවත් කිරීම සඳහා පුවරු ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ සී.ඩ්‍රැගන්ස් බෞද්ධ සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව ඒ සඳහා අවසර ලබාදීම සුදුසු බවට ඒකමතිකව සම්මත විය.

**12.20 පී.ඩී.ආරියපාල, අම්බලන්ගොඩ, පනියන්දූව, අංක 35 .පී.ඩී.ආරියපාල මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පී.ඩී.ආරියපාල, අම්බලන්ගොඩ, පනියන්දූව, අංක 35 .පී.ඩී.ආරියපාල වන මම වෘත්තියෙන් ගව පාලනය කරන තැනැත්තෙක්. මේ සම්බන්ධයෙන් අපි දැන් කතා කළා. තණ වගාකිරීම සඳහා සුදුසුබිමක් අපි පවරාගත්ත ඉඩමක් ලබාදෙන්න අපි සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටිනවා.තාවකාලිකව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඒ මනුස්සය විතරයි දැනට මේ ගව පාලනය කරන්නෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි දෙමු.ඔයගොල්ලන්ගෙ ගෙවල් පිටිපස්සෙ කැල්ල.ඒක දෙමු හරි එකඟයි.

**තීරණය-**

ගවයන් වෙනුවෙන් තෘණ වගාකිරීමට ස්ථානයක් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, පනියන්දූව, නො.35 ලිපිනයේ පදිංචි පී.ඩී.ආරියපාල මහතා විසින් එවා ඇති ලිපිය අනුව ඔහුට ඒ සඳහා තාවකාලිකව ස්ථානයක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ස්ටැන්ඩ් එක ඉස්සරහා අර ගස් හිටවපු තැන් ඔක්කොම කැඩිල තියෙන්නෙ දැන්. නගර පිරිසිඳු කරනවනම් ඕව ඔහොමම තිබුණොත් කවුරුහරි ෆොටෝ ගහල දාවි මෙන්න නගරෙ හැටියි නියල. අනිත් එක පාරවල් පිහිදුවට යන්නෙ නැහැ ගරු සභාපතිතුමා.පාර පිහිදගෙන යනවා අර අයින්වල තියෙන ඒවා ගන්නෙ නැහැ. ඒක තවම සිද්ධ වෙනවා.ඒකට කට්ටියක් අරගෙන හරි දැන් මහජන බැංකුව පාර පිහිදන්නෙම නැහැ. කොළ වැටිල ඒක මොකක් හරි ලේකම්තුමිය අර ස්ටැන්ඩ් එකේ කාණු අන්න අදත් කතා කළා සම්බන්ධීතරණ කමිටුවෙත් දහතුන් පාරක් නගර සභාවට කිව්වයි කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර මාර්ග පිරිසිඳු කිරීමේදී පුංචි පොළ පාරෙ බස් ස්ටැන්ඩ් එක පැත්තෙන් ඇතුල් වෙනකොට දකුණු පැත්තෙ අයිනෙ කාණුව දිගේ සමහර තැන්වල ස්ලැබ් කැලි නැහැ. කඩන් වැටිලා. කාණු අවහිර වෙලා. තැන් තැන්වල අඩුයි තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මම අදහසක් අහන්නෙ. දැන් අපේ මන්ත්‍රීලගෙ කොටස්වලට වෙන වෙනම දාලද? නැතුව දවස් හතෙන් ඔය ලොකු කාර්යභාරයක් කරන්න බැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි අපි ලේකම්තුමියට හදන්න කිව්වෙ. වෙනස් වෙනස් විදියට දීල ඔයාගෙ ගමේ එක පාටියයි. මෙයාගෙ ගමේ එක පාටියයි. එහෙම එහෙම පාටි 07 ක් දාන්න දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   ලලිත් ධම්මික කොඩිකාර  මහතා  කතා කරමින්</u>**

මොකද මං කියන්නෙ කොටස්වලට  බෙදල දෙන්න. එතකොට අපි ඉස්කෝල හරි මොනවහරි අල්ලගෙන

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය ඒක ලෑස්ති කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්</u>**

පොඩි වැඩසටහනක් හදල කතා කරන්න.එතකොට තියෙන වාහනත් බෙදල තියන්න ඒ විදියට ඒ කොටස්වලට.නැත්නම් අපට ට්‍රැක්ටර් නෑ.අරයට ට්‍රැක්ටර් නෑ එහෙම නැති වෙන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම නැති වුණොත් පාර මැද්දෙන් තියල තියන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  ලලිත් ධම්මික කොඩිකාර   මහතා  කතා කරමින්</u>**

නෑ. නැත්නම් ඊලඟට ඕක ප්‍රශ්නයක් වෙනවනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි.දැන් සියලු මන්ත්‍රීවරු 21 දෙනාම ටවුන් එකට බස්සලා

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක බලාපොරොත්තු වෙන්නෙ ප්‍රධානව ටවුන් එක ඇතුලෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ඔව්.දවස් දෙකක් ඒක කරල ඊට පස්සෙ අතුරු මං මාවත් බලමු.එතකොට ස්ලෝ වෙනවනෙ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තව මොනවහරි තියෙනවද වෙනත් කරුණු. අද ඉවර කරන්නෙ අටට විතරනෙ.ඒකයි ඇහුවෙ. තව තියෙනවනම් කියන්න. නැද්ද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි අද කතාකරත් ගරු සභාවට යෝජනා කරා . ධීවර සංකීර්ණය පවර ගන්න එකේ ලිපිය . මේ වෙනකොට තත්ත්වෙ මොකද? මාස දෙකක් විතර වෙනව කතා කරලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

යැව්වද ඒ ලියුම? යවල නැහැ.දැන් ලේකම්තුමියට අපි ලේකම් කෙනෙක් පත් කරමු. වෙන පොතක් තියාගෙන ලියාගන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ පාරවත් ඉතා ඉක්මනින් අපි සම්බන්ධීකරණ රැස්වීමෙදිත් කතා කරා.මේක පවරා ගැනීම සඳහා මොකද මේක අම්බලන්ගොඩ නගරයේ ධීවර ජනතාවට තිබුණු අපේ ගරු සරත් මන්ත්‍රීතුමත් කතා කරා. ධීවර ජනතාවගේ උත්සවයක් සහභාගී කරවන්න තිබුණු තැන මෙතන. ඒ මිනිස්සුන්ට සල්ලි ගෙවල නැහැ.අපි නම් නිකං දුන්නෙ. ඒ නිසා ඉතා ඉක්මනින් මේක ආපහු පවරා ගන්න ලේකම්තුමිය ඉතා ඉක්මනින් කටයුතු කරන්න. ඔබතුමිය ඕක පැවරුවෙ කාටද අපි දැන් ගිය සභාවෙ කතා කරපු එක කාටවත් පැවරුවද ලේකම්තුමිය. මොකද අපේ කාර්යාල මණ්ඩලයේ ඉන්නවා සාමාන්‍යයෙන් අර මන්දගාමීව වැඩ කරන ටික දෙනෙක්.ඉතින් ඒ ගොල්ලො

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි ලේකම්තුමිය පිට්ටනිය බලන්න කියල තාක්ෂණ සේවා නිලධාරී කෙනෙකුට ලිඛිතව පවරන්න ඕන්නෑ. පාරක් බලන්න කියල පවරන්නෙ නැහැ. එයාගෙ රාජකාරියෙ කොටසක් ඒක. මං ඒකට උත්තර දුන්නෙ නැහැ.ඒක නිසා පැවරීම් කරන්න ඒවා. වැඩ කොටස්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඉස්සෙල්ලා අර සම්බන්ධීකරණ කමිටුවෙ කිව්වා වගේ ඔය ලිපිගොණුව පොඩ්ඩක් පරිශීලනය කරන්න මිස්.මොකද ඉඩම විතරයි ධීවර දෙපාර්තමේන්තුවට අයිති.ඉඩමත් පවර ගත්තු එකක් හිටපු ලේකම්ගෙන්.එතකොට ඒ ගොල්ලන්ගෙ අයිස් ගබඩාව තිබුණා. ගොඩනැගිල්ල රජයෙ ප්‍රතිපාදනවලින් ආවෙ. ගරු මන්ත්‍රි ප්‍රතිපාදන වලින් හැදුවේ. ගරු හිටපු පළාත් සභා මන්ත්‍රි සිරිනාවති ද සිල්වා මැතිණිය හා ගරු හිටපු මන්ත්‍රි ගරු අශෝක වීරසිංහ හැදුවෙ.එතකාට මේකෙ පොරොන්දුවක් තියෙනව ගිවිසුමේම තියෙනවා මේක ධීවර ජනතාව වෙනුවෙන් හදන්නෙ. ධීවර ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් . පාලනය දුන්නා නගර සභාවට. එහෙමයි තියෙන්නෙ ඉතින්.ඒක නැවත ගන්න මේ පැත්තට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීමක් තියෙනවා අපේ වැඩිහිටි නිවාසෙ ඊයෙ පෙරේදා එක්කෙනෙක් මිය ගියා. අපි ඒකට රුපියල් හයදාහක් (රු.6000/-) බැන්දා හරි අමාරුවෙන්. අපිට ඒක නැවත නිදහස් කරල දෙන්න බැරිද? මින් පස්සෙ මළ ගෙයක් වුණොත් එහෙම ඒක නොමිලේ ලබාදීමට කටයුතු කරන්න පුළුවන්ද කියල ආදාහනාගාරය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

දෙන්න දෙන්න ගරු සභාපතිතුමා ඒක දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ඒක අපිට නැවත ලබාගැනීමේ හැකියාවක් තිබෙනවාද?

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එහෙම තියෙනවනම් සභා තීන්දුවක් තියෙන්න ඕන. දැනට සභා තීන්දු 03 ක් තියෙනවා නිදහස් කිරීමට.

01. බද්දෙගම වයෝවෘද්ධ භික්ෂු ආරණ්‍යයේ අපවත් වන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් මුදල් අය කරන්නෙ නැහැ.
02. අපේ නගරය තුළ තියෙන පන්සල්වල කිසිම හාමුදුරු කෙනෙක් වෙනුවෙන් මුදල් අයකිරීමෙන් තොරව තමයි ආදාහනාගරය ලබාදෙන්නෙ.
03. සමෘද්ධිය තියෙන කෙනෙකුට 2/3 ක් අය කරනවා.1/3 ක් අය කරනවා.

එහෙනම් යෝජනාවක් වශයෙන් ගරු සභාවට ගේන්න.මේක දැන් වෙලා ඉවරයි.වෙලා ඉවර නිසා ඒක නිදහස් කිරීම යුතු නැහැ මං නම් කියන්නෙ.ඔබතුමා යෝජනාවක් වශයෙන් ගේන්න. ඒ ගෙකාවම ඒක අනුමත කරල අපි ගරු සභාවෙ ඒ ප්‍රතිපත්ති ගෙනියමු.

<u>**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

මං යෝජනාවක් ගේන්නම්. වැඩිහිටි නිවාසෙ අපේ යම්කිසි කෙනෙක් මිය ගියොත් අපිට ආදාහනාගාරය නොමිලේ ලබාදීමට කටයුතු කරන්න කියල මං යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

යෝජනාව පැහැදිලි නැහැ. හරියට කරන්න ඕන. අපේ වැඩිහිටි නිවාසෙ නෙමේ.වරුසවිතාන

<u>**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

වරුසවිතාන වැඩිහිටි නිවාසෙ වැඩිහිටියෙක් මිය ගියොත් එහෙම අපිට ආදාහනාගාරය නොමිලේ ලබාදීමට කටයුතු කරන්න කියල මං යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් අපි නගරය පවිත්‍ර කිරීමේ අලංකාර කිරීමේ ව්‍යාපෘතියක් අපිට යෝජනා වුණා. හැබැයි ඔය දැන් අපි තමයි අපවිත්‍ර කරන්නෙ.මොකද අපිට දැන්වීම් ගහන්න තැනක් නැහැ. කොහේහරි ගහනවා අපිට එන දැන්වීම්. එතකොට අපි දන්නව අපේ අතින් නගරය අපවිත්‍ර වෙනවා. ඒක මං පිළිගන්නවා. හැබැයි අපට නාම පුවරු ඒ කියන්නෙ දැන්වීම් පුවරු තිබුණා නගරය පුරාම. මේ වෙනකොට 90% ක් ම කැඩිල.එක්කො කඩල අයින් කරල.එතකොට මේ සියලුම තිබ්ච්ච පරණ තාප්ප අනං මනං අලංකාර වෙලා හරි ලස්සනයි

දැන් නගරය. නමුත් අපට ප්‍රශ්නයක් තියෙනවා ප්‍රායෝගික ප්‍රශ්නයක්.අපේ දැන්වීමක් අපට ගහන්න නෝටිස් බෝඩ් එකක් නැහැ. නීත්‍යානුකූල එකක් අපට නැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හොඳ වෙලාවට අපේ නායකයගෙ ප්‍රතිපත්තිඅනුව අපට නම් දැන් පෝස්ටර් එන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපට එනවා. අපට රූපවාහිනී මාධ්‍ය නැහැ. පත්තර නැහැ.අපට වෙනත් මාධ්‍ය නැහැ. අපට තියෙන එකම මාධ්‍යය තමයි පෝස්ටර් එක. අවංකව කියන්න ඕන.බොරු කියන්න ඕන නැහැනෙ. අපි ගහනව කොහේහරි පෝස්ටර් එක. නමුත් අපිට දැන් එහෙම ගහන්න පෝස්ටර් ගහන්න තැනක් නැහැ. හැබැයි අපි ගැහුවෙ සදාචාරාත්මක විදියට තමයි අපි පෝස්ටරේ ගහන්නෙ. අපි හැමතැනම අලවන්නෙ නැහැ. අපිට තිබුණා නීත්‍යානුකූල දැන්වීමු පුවරු සමූහයක් නගර සභාව විසින් නඩත්තු කරන. ඒ සියල්ලම දැන් අයින් කරල තියෙන්නෙ. මට හිතෙනව දැන් ඔයගොල්ලො අයින් කරා කියල. අපේ පෝස්ටරේ නවත්වන්න. මට එහෙම චෝදනාවකුත් තියෙනවා. එහෙනම් කරුණාකරල අපට ඒ අවස්ථාව ලබාදෙන්න. අපි අතින් නගරය අපවිත්‍ර වීම වළක්වන්න කියල.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනිවාර්යයෙන්ම ඒ ඉල්ලීම ඉටු කළ යුතු එකක්. දැන් හැබැයි මෙහෙමයි ඕක දැන් 3% ට බැහැල තියෙන්නෙ. ඒක හින්දා වැඩකුත් නැති තරම්. අපි ඒක ඉෂ්ඨ කරමු. ආදායම් පරීක්ෂක මහත්මයා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපි වැඩසටහනක් පටන් ගත්තා. ආදායම් පරීක්ෂක මහත්වරු අනවුන්ස් එකක් එහෙම ගිහිල්ල පාරෙ තියෙන අර තියෙන ඒව අයින් කරනව කියල. දැන් ප්‍රගතිය කොහොමද දන්නෙ නැහැ.ගරු සභාපතිතුමා දැන් ඇත්තටම ඉතාමත්ම

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මේ ප්‍රශ්නෙ නිසා මම ලේකම්තුමියටත් කිව්වා ආදායම් පරීක්ෂක මහත්වරුන්ගේ ඩියුටි ලිස්ට් එකේ වෙලාව වෙනස් කරන්න කියල. මොකද සෙනසුරාදා ඉරිදා එතුමාලගෙ යම්කිසි රාජකාරියක්අපිට කරන්න අවශ්‍යයි. ඒ නිසා එක්කෙනෙක්ගෙ නිවාඩුවක් සතිය මැද්දට වගේ දාල ඒ වගේ ඔයගොල්ලො මාරුවෙන් මාරුවට යම්කිසි සේවාවක් ලබාගැනීම සඳහා කටයුත්තක් කරන්න ඕන.මොකද අපට වෙලා තියෙන දෙයක් තමයි මේ නීති කඩන්නෙ හුඟක් වෙලාවට සෙනසුරාදා ඉරිදත් පහෙන් පස්සෙ. ඒක නිසා අපි මේ ඔයගොල්ලොන්ට කරදරයක් ලෙස දකින්න එපා . මේක යම් විනයක් හදන්න ඕන නිසා ඒ යුතුකමක් ඉෂ්ඨ කරන එකක් වශයෙන් කරන්න. අපි ඉස්සරහට මං ලේකම්තුමියට එදා උපදෙස් දුන්නා ඇත්තටම මට වෙලාව වෙනස් කරන්න කියල .ඔය ගොල්ලන්ගෙ යම්කිසි අපේ දැනට කරල තියෙන දේ

සම්බන්ධයෙන් යම් විරුද්ධ මතයක් තියෙනවනම් ඒකත් ලේකම්තුමියට කියන්න. එතකොට අපට ඒක දැනගන්න හම්බවෙනවා. අපි යම්කිසි වැඩක් කරනවා ඒ විදියට මාරුකරලා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නෑ ගරු සභාපතිතුමා, මං කියන්න හැදුවෙ ඉතාමත් අසෝභන ස්ථානයක් බවට පත්වෙලා තියෙනවා කුලරත්න හන්දියෙ අපේ තැපැල් කාර්යාලයට යන තැන මුල්ල.ඒක අද කඬේ පවත්වගෙන ගිහිපු මනුස්සයා පාරට වෙනකන් ලැලි ආල දැන් කඬෙත් වහල දැන් වෙන පුද්ගලයො එතෙන්ට ඇවිල්ල කෙසෙල් කැන් තියාගෙන විකුණනවා. කොහේ පුද්ගලයොද දන්නෙ නැහැ.මම අපේ ආදායම් පරීක්ෂක මහත්මයට කිව්වම ඒකෙ නීත්‍යානුකූල තත්ත්වයක් නැතෙයි කියන එක තමයි ගරු සභාපතිතුමා කියන්නෙ. ඒක අයින් කරන්න ඕන. ඒ නිසා ගරු සභාපතිතුමා මොකක්ද දැන් ඇත්තටම ඒක හාමෝම දකින දෙයක් ඉතාමත්ම අසෝභනයි ඒ මුල්ල. අපි දැන් කුලරත්න හන්දියෙන් පොල්වත්තට ඇවිල්ල තැපැල් කාර්යාලය ළඟට දානකොට මුල්ල . එතන ඉටිකොල එල්ලලා ළඳු කැලි එල්ලලා හරිම අවලස්සන තැනක් ගරු සභාපතිතුමා. පුද්ගලික ඉඩමක් තමයි. හැබැයි අනවසර ඉදිකිරීම් ඔක්කොම ගහල තියෙන්නෙ.ලැලි ගහල පාරට.ඔබතුමා ගිහින් බලන්නකො.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අනවසර ඉදිකිරීම් ගැන කතා කරනවනම් පාර පුරාම තියෙන්නෙ අනවසර ඉදිකිරීම්. මං එයාට විරුද්ධ වෙනව නෙමෙයි. අනවසර ඉදිකිරීම් කියන මාතෘකාව යටතේ කතාකරොත් පාර දෙපත්තෙ ඕනතරම් ගහල තියෙනවා. ඉතින් ඒ මනුස්සයා ජීවත් වෙන්න තමි මේක කරනව ඇත්තෙ. තට්ටු ගෙයක් ගහල නෙමෙයි. ලස්සන අවලස්සන තියෙන්නෙ අපේ ඇහේ. මම කියන්නෙ නැහැ ඒ මන්සුසයත් මේක ජීවි වෙන්න කරන්නෙ. කොතන කරත්

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නෑ මං දන්නෑ ඔබතුමාගෙ මතේ මොකක්ද කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මම තියන්නෙ.මට එහෙම කියන්නත් බැහැ. නමුත් අනවසර ඉදිකිරීම් කියන මාතෘකාව ගත්තොත් ඒක ටිකක් ලොකු එකක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මම කියන්නෙ අනවසර ඉදිකිරීම කියන්නෙ මේ ගෙවල් දොරවල් කඩල ඉවත් කරන එක නෙමේ ගරු මන්ත්‍රීතුමා.මේ නගරෙ පාරට ලැලි ගහල ඔබතුමා යනගමන් බලන්නකො පාරෙ කොහොමද කියල තියෙන්නෙ ලැලි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මම දැක්කා ඒක.  අල ඇඹුණු ගෙනැල්ල දාගෙන විකුණන තැනක්. මම කියනවා ඒක පුද්ගලික ඉඩම් හිමියන්ට දන්වන්න මෙතන මෙයා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා  කතා කරමින්</u>**

පුද්ගලික ඒව නෙමේ මම කියන්නෙ.පාරට ආපු ඒව ටික අයින් කරන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  එස්.එම්. සරත් චන්ද්‍ර මහතා  කතා කරමින්</u>**

පාරට ආපු ඒව අයින් කරන්න අපට අයිතිය තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා  කතා කරමින්</u>**

පාරට ආපු ඒව අයින් කරන්න බැරිද ගරු සභාපතිතුමා අපිට. ගිහින් බලන්නකො ඔයගොල්ලො.පාරට වාහනයක් දාන්න බැහැ. පේන්නෙ නැහැ. ගරු සභාපතිතුමා මේකට ක්‍රියාමාර්ගයක් ගන්න ඉක්මනට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා  කතා කරමින්</u>**

ආදායම් පරීක්ෂක මහත්තයා ඔන්න ඔය කියන කැලි ගලවගෙන එන්න. අද රෑම ගේන්න. රෑ දහයට විතර ගියාම හොදයි.කවුරුත් නෑ. අපි මාළු ලැලි අස්කරේ රෑ දහයට.එක ලැල්ලක්වත් නැතුව ඔක්කොම අයින් කරල දාන්න. වෙනත් කරුණු තියෙනවද?රැස්වීමේ වැඩ  කටයුතු මෙයින් අවසන් කරනවා.

පස්වරු 06.55 ට ගරු සභාවේ වැඩ කටයුතු අවසන් විය.

| | |
|---|---|
| රණසි උත්පලා ගුණවර්ධන මිය | අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු |
| ලේකම් | සභාපති |
| අම්බලන්ගොඩ - නගර සභාව | අම්බලන්ගොඩ - නගර සභාව |

2020.02.25

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී.